# දෙවැනි කොටස


| | | | |
|---|---|---|---|
| මහ බැංකුවේ ගිණුම් හා කටයුතු | .. | .. | I – XLI |
| කාර්ය මණ්ඩල පුවත් | .. | .. | XLII – XLIII |

## මහ බැංකුවේ ගිණුම් හා කටයුතු


| | පිටුව |
| --- | --- |
| ගිණුම් හා බැංකු කටයුතු ... ... ... | I |
| ව්‍යවහාර මුදල් නිකුතුව ... ... ... | VI |
| බැංකු සංවර්ධන ... ... ... ... | VII |
| බැංකු අධීක්ෂණය ... ... ... ... | VIII |
| සංවර්ධන මුදල් ... ... ... ... | IX |
| ග්‍රාමීය ණය ... ... ... ... | XIV |
| ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ... ... ... | XX |
| ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය ... ... | XXIV |
| සේවක අර්ථසාධක අරමුදල් ... ... ... | XXV |
| විනිමය පාලන ... ... ... ... | XXVI |
| රාජ්‍ය ණය ... ... ... ... | XXVIII |
| ප්‍රාදේශීය කාර්යාලය—මාතර ... ... ... | XXVIII |
| ප්‍රාදේශීය කාර්යාලය—අනුරාධපුරය ... ... ... | XXXII |
| ප්‍රාදේශීය කාර්යාලය—මාතලේ ... ... ... | XXXVI |
| අනුග්‍රාහක සේවා ... ... ... ... | XXXVIII |
| ප්‍රකාශන ... ... ... ... | XXXVIII |
| සම්මන්ත්‍රණ ... ... ... ... | XXXIX |
| සමීක්ෂණ ... ... ... ... | XXXIX |
| පුහුණු කිරීම් ... ... ... ... | XL |
| දත්ත සැකසුම් ... ... ... ... | XL |
| කළමණාකාරිත්ව විගණන ... ... ... | XLI |

# මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

## ගිණුම් හා බැංකු කටයුතු

1986 දෙසැම්බර් 31 වැනි දිනට මහ බැංකුවේ ශේෂ පත්‍රය සහ 1986 දෙසැම්බර් 31 වැනිදයින් අවසන් වූ වර්ෂය සඳහා ලාභාලාභ ගිණුම 2.1 සංඛ්‍යා සටහනෙන් දක්වා ඇත.

1986 අවසානයේදී, මහ බැංකුවේ මුළු වත්කම්/වගකීම් ප්‍රමාණය ඉකුත් වසරේ පැවති මට්ටමට වඩා සියයට 4.9 ක වැඩි වීමක් වාර්තා කරමින්, රුපියල් දශ ලක්ෂ 43,163.9 ක් විය. වත්කම් වැඩි වීම, දේශීය වත්කම් (සියයට 12.4 කින්) ඉහළ යාමෙත් වෙනත් වත්කම් හා ගිණුම් (සියයට 16.8 කින්) වැඩි වීමේත් ප්‍රතිඵලයක් විය. දේශීය වත්කම් අතුරෙන් රජයට දෙන ලද ණය සහ අත්තිකාරම් සියයට 9.7 කින් ද, මැදි හා දිගු කාලීන ණය සියයට 8.1 කින් ද, කෙටි කාලීන ණය සියයට 66.4 කින් ද, රජයේ සහ රජය ඇපවූ සුරැකුම්පත් සියයට 9.1 කින් ද වැඩි විය. වර්ෂය තුළදී සංසරණයෙහි පවත්නා නෝට්ටු හා කාසි (සියයට 13.6 කින්), මැදි හා දිගු කාලීන ණය අරමුදල (සියයට 32.2 කින්), මහ බැංකු සුරැකුම්පත් (සියයට 122.9 කින්) සහ අනෙකුත් වගකීම් හා ගිණුම් (සියයට 11.9 කින්) වැඩි වීම හේතු කොට ගෙන මහ බැංකුවේ වගකීම් ඉහළ ගියේය. එසේ වුවද, තැන්පතු සියයට 23.0 කින් පහත වැටුණි.

1986 වර්ෂය සඳහා බැංකුවේ ආදයම රුපියල් දශ ලක්ෂ 3,689.5 ක් විය. මෙය ඉකුත් වර්ෂයේ ආදයම හා සසඳන කල සියයට 3.5 ක අඩු වීමකි. වියදම් සඳහා ඉඩ හැර සංචිත ගිණුම් සඳහා සහ ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමෙන් පසු, මහ බැංකුවේ ශුද්ධ ලාභය රුපියල් දශ ලක්ෂ 1,724.0 ක් විය. මුදල් නීති පණතේ 39 (ආ) වගන්තිය අනුව බැංකුවේ අතිරික්තයට රුපියල් දශ ලක්ෂයක මුදලක් පැවරිය යුතුවේ. රුපියල් දශ ලක්ෂ 1,723.0 ක ශේෂය, රජය විසින් මහ බැංකුව වෙත ගෙවීමට ඇති ණයෙන් කොටසක් පියවීම පිණිස මුදල් නීති පණතේ 39 (ඇ) වගන්තිය ප්‍රකාර රජයට ගෙවීම සඳහා වෙන් කොට ඇත.

### විදේශ විනිමය ගණුදෙනු

වාණිජ බැංකු සමග කෙරෙන ගණුදෙනුවලදී, ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව, එක්සත් ජනපද ඩොලරයේ දෛනික එතැන් මිළදී ගැණුම් සහ විකුණුම් අනුපාතිකයන් නිර්ණය කිරීම, මහ බැංකුව විසින් තවදුරටත් කරගෙන යන ලදී. එසේ නිර්ණය කරන ලද මිළදී ගැණුම් හා විකුණුම් අනුපාතිකයන් අනුව, එතැන් පදනමක් මත මහ බැංකුව විසින් එ. ජ. ඩොලර් මිළට ගැනීම හා විකිණීම කරනු ලැබේ. 1986 දෙසැම්බර් අවසාන වනවිට, එ. ජ. ඩොලරයක එතැන් මිළදී ගැණුම් හා විකුණුම් අනුපාතික පිළිවෙලින් රුපියල් 28.5125 ක් හා රුපියල් 28.5275 ක් විය.

ශ්‍රී ලංකා රුපියල් වලට සාපේක්ෂව, එ. ජ. ඩොලර් වලින් කරනු ලබන මිළදී ගැණුම් හා විකුණුම් සඳහා වාණිජ බැංකුවලට ඉදිරි ආවරණ සැළසීම මහ බැංකුව විසින් තවදුරටත් කරගෙන යනු ලැබීය. මාස තුනක් දක්වා වූ කාලසීමාවකට එවැනි ආවරණය සැළසිණි. 1986 අවසානයේදී, මහ බැංකුව එක් මසක් සඳහා වූ විනිමය ගිවිසුම් මත එ. ජ. ඩොලර් එතැන් මධ්‍ය විනිමය අනුපාතිකය අනුව මිළට ගෙන, එ. ජ. ඩොලර් 100 ක් සඳහා ශ්‍රී ලංකා රුපියල් 4.00 ක අධි මිළක් සහිතව විකුණනු ලැබීය. තෙමසක් සඳහා වූ ඉදිරි විනිමය ගිවිසුම් මත එ. ජ. ඩොලර් මිළදී ගැනීම සහ විකිණීම එතැන් මධ්‍ය අනුපාතිකයට සාපේක්ෂව එ. ජ. ඩොලර් 100 ක් සඳහා පිළිවෙලින් ශ්‍රී ලංකා රු. 0.50 ක වට්ටමක් සහ රුපියල් 20.00 ක අධි මිළක් මත කරගෙන යන ලදී.

### ආසියානු නිෂ්කාශන සංගමය

1986 වර්ෂය තුළදී, ආසියානු නිෂ්කාශන සංගමය මගින් කළ ගණුදෙනුවල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 7,907.6 ක් විය. ඉකුත් වර්ෂය තුළදී එමගින් කළ ගණුදෙනු වල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 5,960.1 ක් විය.

# මුදල් හා බැංකු ගණුදෙනු

ශ්‍රී ලංකා මහ බැංකුවේ

**1986 දෙසැම්බර් මස 31 වැනි**

වගකීම්

| 1985 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | | | 1986 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | | **ප්‍රාග්ධන ගිණුම** | | |
| 1,50,00,000 | | ප්‍රාග්ධනය .. | 1,50,00,000 | |
| 7,00,00,000 | 8,50,00,000 | අතිරික්තය .. | 8,00,00,000 | 9,50,00,000 |
| | | **සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල්** | | |
| 1,076,38,00,798 | | නෝට්ටු .. | 1,222,90,00,668 | |
| 55,56,34,845 | 1,131,94,35,643 | කාසි .. | 63,42,41,496 | 1,286,32,42,164 |
| | | **තැන්පතු** | | |
| 211,99,25,142 | | රජය | 171,08,10,540 | |
| 8,54,47,855 | | රාජ්‍ය නියෝජ්‍යත්ව හා ආයතන .. | 12,27,32,153 | |
| 549,01,56,739 | | වෙළෙඳ බැංකු .. | 504,53,39,209 | |
| 410,89,63,586 | | ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන .. | 246,31,97,152 | |
| | | භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ රු. 16,43,52,500 හැර | | |
| 54,476 | | අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදල | 1,03,942 | |
| 119,07,16,724 | 1,299,52,64,522 | අනෙකුත් .. | 66,45,31,455 | 1,000,67,14,451 |
| | 59,92,891 | විදේශීය ණය ගැනීම් .. | | — |
| | 77,50,00,000 | මධ්‍යම හා දීර්ඝකාලීන ණය අරමුදල .. | | 102,50,00,000 |
| | 15,00,00,000 | ප්‍රාග්ධන දයක දීමනා ගිණුම .. | | 16,00,00,000 |
| | 116,81,25,000 | ශ්‍රී ලංකා මහ බැංකු සුරකුම්පත් | | 260,36,33,000 |
| | 1,465,98,00,056 | අනෙකුත් වගකීම් හා ගිණුම් .. | | 1,641,03,54,180 |
| | 4,115,86,18,112 | | | 4,316,39,43,795 |

**1986 දෙසැම්බර් මස 31 වැනි දිනෙන්**

| 1985 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | | | 1986 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | 188,22,74,433 | සාමාන්‍ය වියදම් (වැටුප්, මුදල් නෝට්ටු හා කාසි සඳහා වියදම් හා බැංකු ගොඩනැගිලි හා කාර්යාල උපකරණ සඳහා ක්ෂයවීම් ඇතුළුව) සහ මුදල් නීති පනතේ 38 වැනි වගන්තිය ප්‍රකාර ඉන්පසුව කරන ලද වෙන් කිරීම් | | 172,92,74,810 |
| | | 1986 දෙසැම්බර් 31 වැනිදයින් අවසන්වූ වර්ෂයේ ශුද්ධ ලාභය | | |
| 15,37,35,000 | | මූල්‍ය ගැලපීම් ගිණුමට මුදල් නීති පණතේ 39 (අ) වගන්තිය ප්‍රකාර ශේෂය පියවීමට | 23,62,55,802 | |
| 1,00,00,000 | | මුදල් නීති පණතේ 39 (ආ) වගන්තිය ප්‍රකාර අතිරික්තයක් වශයෙන් යොද ගන්නා ලදී. | 10,00,000 | |
| 177,90,00,000 | 194,27,35,000 | මුදල් නීති පණතේ 39(ඇ) වගන්තිය ප්‍රකාර රජයට – ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නොපියවා ඇති වගකීම් කොටසක් පියවීමට | 172,30,00,000 | 196,02,55,802 |
| | 382,50,09,433 | | | 368,95,30,612 |

**වර්ණසේන රාසපුත්‍රම්**
අධිපති

**එන්. ඒ. ධර්මබන්දු**
ප්‍රධාන ගණකාධිකාරි

**ගිණුම් – 1986**

**දිනට ශේෂ පත්‍රය**

## වත්කම්

| 1985 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | | | 1986 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | | **ජාත්‍යන්තර සංචිතය** | | |
| 832,80,92,837 | | පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂයන් .. | 472,89,55,695 | |
| 309,99,13,490 | | *විදේශීය සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් .. | 481,03,89,476 | |
| 15,64,189 | 1,142,95,70,516 | විශේෂ ආපසු ගැනීම් හිමිකම්පත් | 84,801 | 953,94,29,972 |
| | | **දේශීය වත්කම්** | | |
| | | ණය සහ අත්තිකාරම් | | |
| 421,81,76,362 | | රජයට .. | 462,54,61,262 | |
| | | අනෙකුත් අයට–මධ්‍යම හා | | |
| 69,25,01,865 | | දීර්ඝකාලීන .. | 74,85,40,277 | |
| 144,44,75,344 | | කෙටිකාලීන .. | 240,37,93,574 | |
| 1,854,24.23,324 | | රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් .. | 2,022,05,60,536 | |
| 15,00,00,000 | 2,504,75,76,895 | මූල්‍ය සහ අනෙකුත් ආයතනවලට දයක දීමනා .. | 16,00,00,000 | 2,815,83,55,649 |
| | 468,14,70,701 | අනෙකුත් වත්කම් හා ගිණුම් .. | | 546,61,58,174 |
| | | *1964 පෙබරවාරි මස 01 වැනි දින රු. 55,27,675 ප්‍රකාශිත වටිනාකමට හා 1965 මැයි මස 24 වැනි දින රු. 57,450 ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතන-වලින් ලබාගත් සුරැකුම්පත් ඇතුළත් වෙයි. (ඒ දිනවල මෙකී සුරැකුම්පත්වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම පිළිවෙලින් රු. 29,33,697 ක් හා රු. 34,340 ක් විය.) | | |
| | 4,115,86,18,112 | | | 4,316,39,43,795 |

**අවසන් වූ වර්ෂයේ ලාභාලාභ ගිණුම**

| 1985 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | | | 1986 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | 382,50,09,433 | පොළී ඇතුළු අනෙකුත් ආදායම් .. | | 368,95,30,612 |
| | 382,50,09,433 | | | 368,95,30,612 |

1986 දෙසැම්බර් මස 31 වැනි දිනට අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය සමග කියවන ලද 1971 අංක 38 දරණ මුදල් නීති පණතේ 13(1) වගන්තිය සහ මුදල් නීති පණතේ (පරි. 422) 42(1) වගන්තිය අනුව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මුදල් නීති පණතේ (පරි. 422) 42(2) වගන්තිය ප්‍රකාර මුදල් ඇමතිතුමා වෙත ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කෙරේ.

කොළඹ 7.
විගණන කාර්යාලයේදීය,
1987 අප්‍රේල් 07 වැනි දින.

ඩබ්ලිව්. ගාමිණී ඇපා
විගණකාධිපති

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ශුද්ධ ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 925.6 ක් වූ අතර, 1985 දී ශුද්ධ ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 927.3 ක් විය.

එතැන් පදනමක් මත හා සමස දක්වා වූ ඉදිරි ගිවිසුම් මත විදේශීය මුදල් විකිණීම හා මිළට ගැනීම තවදුරටත් කරගෙන යන ලදී. අදළ මුදල් වර්ග වූයේ, බංගලාදේශ ටාකා, බුරුම ක්‍යාට්, ඉන්දියානු රුපියල්, ඉරාන රියාල්, නේපාල රුපියල් හා පකිස්ථානු රුපියල්ය.

**කෙටිකාලීන ණය**

රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් හා වාණිජ හා නිෂ්පාදන ණයවලට අදළ භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබාගෙන, වාණිජ බැංකුවලට දෙනු ලබන කෙටිකාලීන අත්තිකාරම් සඳහා වූ මහ බැංකුවේ පොළී අනුපාතිකය (බැංකු අනුපාතිකය) 1986 වර්ෂය තුළදී වසරකට සියයට 11 වශයෙන් නොවෙනස්ව පැවතිණි.

අපනයන සඳහා, ප්‍රතිමූල්‍යා ණය ක්‍රම යටතේ මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට ණය සැපයීම වසර මුළුල්ලේම නොකඩවා සිදු විය. 1 වැනි කාණ්ඩය යටතේ ගැණෙන අපනයන (සම්ප්‍රදායික අපනයන) සඳහා බලපැවැත්වුන ප්‍රතිමූල්‍යාන කාලසීමාව දින 60 සිට දින 90 දක්වා දීර්ඝ කරන ලදී. II වැනි කාණ්ඩය යටතේ ගැණෙන අපනයන (සම්ප්‍රදායික නොවන අපනයන) සඳහා බලපැවැත්වුන ප්‍රතිමූල්‍යාන කාලසීමාවද මීට සමාන විය. එසේ වුවද, කාණ්ඩ දෙක යටතේම එක් එක් ඉල්ලුමෙහි සාධාරණත්වය වෙන වෙනම සළකා බැලීමෙන් අනතුරුව එම කාලසීමාව, මුළු දින ගණන දින 120 ක් දක්වා තවදුරටත් දින 30 කින් දීර්ඝ කිරීමට ඉඩ සලසන ලදී. මෙකී කාණ්ඩ දෙකේදීම අපනයන අය ලැබීම්, දින 90ක් ඇතුළතදී ශ්‍රී ලංකාව වෙත ප්‍රේෂණ කර ඇත්නම් පමණක් ප්‍රතිශතක 4 ක පොළී ප්‍රතිදනයක් දෙනු ලැබීමට සුදුසු විය.

1 වැනි කාණ්ඩය යටතේ ගැනෙන අපනයන සඳහා වූ ප්‍රතිමූල්‍යා ණය පොළී අනුපාතිකය වසරකට සියයට 11 වශයෙන්ද, ණය දීමේ අනුපාතිකය වසරකට සියයට 14 වශයෙන්ද නොවෙනස්ව පැවතුණි. II වැනි කාණ්ඩය යටතේ ගැණෙන අපනයන සඳහා එකී අනුපාතික පිළිවෙලින් වසරකට සියයට 6 සහ 9.8 ක් වශයෙන් පැවතුණි. අපනයන ණය පහසුකම්වල, I වැනි කාණ්ඩය යටතේ වූ අපනයන වෙනුවෙන් වාණිජ බැංකුවලට ගත හැකි මුළු පහසුකම්වල සීමාව රුපියල් දශ ලක්ෂ 1,500 සිට රුපියල් දශ ලක්ෂ 1,663.4 ක් දක්වා වර්ෂය තුළදී වැඩි කරන ලදී.

වී, එළවළු හා වෙනත් නියමිත ආහාර භෝග වර්ග නිෂ්පාදනයට සම්බන්ධ සමුපකාර සමිතිවලට හෝ පුද්ගලයින්ට හෝ භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබා දෙනු ලබන මහ බැංකු අත්තිකාරම්වල පොළී අනුපාතිකය තවදුරටත් වසරකට සියයට 1.5 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි. මෙම අත්තිකාරම් මුදල් නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ දෙන ලදී. වී මිළට ගැනීම හා මෙරට වගා කරනු ලබන වෙනත් නියමිත භෝග වර්ග මිළට ගැනීම සහ ගබඩා කිරීම සඳහා මුදල් යෙදවීම පිණිස සමුපකාර සමිතිවලට, ගොවිජන සේවා මධ්‍යස්ථානවලට හා බලය ලත් පුද්ගලයනට දෙනු ලබන අත්තිකාරම් වෙනුවෙන් වූ භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබාගෙන මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට දෙනු ලබන අත්තිකාරම් සඳහා අය කැරෙන පොළී අනුපාතිකය වසරකට සියයට 3 ක් සේ නොවෙනස්ව පැවතුණි. මහවැලි ප්‍රදේශයේ මිරිස් මිළදී ගැනීම සඳහා සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවට දෙනු ලැබූ අත්තිකාරම් වෙනුවෙන් වසරකට සියයට 4 ක පොළී අනුපාතිකයක් මත රුපියල් දශ ලක්ෂ 100 ක උපරිමයක් දක්වා අත්තිකාරම් මහජන බැංකුවට දෙන ලදී. මෙහි ණය දීමේ අනුපාතිකය වසරකට සියයට 6 ක් විය.

**මැදි හා දිගු කාලීන ණය**

මැදි හා දිගු කාලීන ණය අරමුදල යටතේ වූ ප්‍රතිමූල්‍යා ණය ක්‍රමය මහ බැංකුව විසින් 1986 වසර තුළදීද නොකඩවා ක්‍රියාත්මක කරගෙන යනු ලැබිය. ඉහත සඳහන් ක්‍රමය යටතේ ප්‍රදනය කරන ලද ප්‍රතිමූල්‍යා ණය සඳහා අදළ පොළී අනුපාතික නොවෙනස්ව පැවතුණි.

සංචාරක කර්මාන්තයේ ණය වාරික සහ හිඟ පොළී ප්‍රාග්ධනගත කිරීම, ප්‍රතිමූල්‍යනය කිරීමද මහ බැංකුව විසින් තවදුරටත් කරගෙන යන ලදී. මැදි හා දිගුකාලීන ණය අරමුදලේ ශේෂය රුපියල් දශ ලක්ෂ 775.0 සිට රුපියල් දශ ලක්ෂ 1,025.0 දක්වා 1986 දෙසැම්බර් මාසයේදී වැඩි කරන ලදී. මෙයින් රුපියල් දශ ලක්ෂ 748.5 ක් ණය දෙන ආයතන විසින් 1986 දෙසැම්බර් 31 වැනි දින වනවිට නොපියවා තිබුණි.

**වාණිජ බැංකු ණය**

1984 දී පනවන ලද ණය සීමාවන් 1986 වර්ෂය තුළදීද නොකඩවා ක්‍රියාත්මක කෙරිණි. එසේ වුවද, 'කර්මාන්ත' සඳහා වාණිජ බැංකු විසින් දෙනු ලැබූ ණය 1986 පෙබරවාරි 21 දින ණය සීමාවෙන් නිදහස් කරනු ලැබීය. මෙම සීමාවනට අනුව පහත දක්වෙන කරුණු පිළිපැදිය යුතු බවට මහ බැංකුව විසින් සියළුම වාණිජ බැංකුවලට දන්වා ඇත.

(අ) අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සඳහා දෙනු ලබන මුළු අත්තිකාරම් ප්‍රමාණය 1984 මාර්තු 23 වැනි දිනට දෙනු ලැබ නොපියවා ඇති අත්තිකාරම් ප්‍රමාණය නොඉක්මවිය යුතුය.

(ආ) අත්‍යවශ්‍ය නොවන ආනයන වෙනුවෙන් 1984 මාර්තු 23 වැනි දිනට නොපියවා පැවති මට්ටම ඉක්මවා තනි ආනයනකරුවනට ණය නොදිය යුතුය.

(ඇ) අපනයන, කෘෂි කර්මාන්තය සහ කර්මාන්ත හැර වෙනත් කටයුතු සඳහා පෞද්ගලික අංශයට දෙනු ලැබ නොපියවා ඇති මුළු අත්තිකාරම් ප්‍රමාණය 1984 මැයි 11 වැනි දිනට දෙනු ලැබ නොපියවා ඇති එවැනි අත්තිකාරම්වල මුළු ප්‍රමාණයෙන් සියයට 5 ක් නොඉක්මවිය යුතුය.

**සංචිත අවශ්‍යතාවයන්**

සිය සංචිත ඌණතාවන් වෙනුවෙන් ගෙවිය යුතු වූ දිනකට සියයට එකකින් තිහෙන් කොටසක පොළී අනුපාතිකය වෙනුවට 1985 අංක 52 දරණ මුදල් නීති (සංශෝධන) පනත ප්‍රකාර, 1986 ජනවාරි 9 වැනි දින සිට, සියයට එකකින් දහයෙන් කොටසක අනුපාතිකයක් මත පොළියක් සෑම වාණිජ බැංකුවක් විසින්ම ගෙවිය යුතු විය.

ශ්‍රේණිගත සංචිත ක්‍රමය යටතේ වැඩි වන තැන්පතු වලට අදළව වාණිජ බැංකු විසින් ආන්තික සංචිත පවත්වා ගත යුතු වීමේ අවශ්‍යතාවය, 1986 පෙබරවාරි 28 වැනි දින සිට ඉවත් කරන ලදී. මෙම වෙනස් කිරීම් හැර 1985 අගෝස්තු 9 වැනි දින සිට ක්‍රියාත්මක වූ අනෙකුත් සියළුම සංචිත අවශ්‍යතාවයන් 1986 වර්ෂය තුළදී ද ක්‍රියාත්මක විය.

**ද්විතීය වෙළඳපොළේ භාණ්ඩාගාර බිල්පත් ගණුදෙනු**

ද්විතීය වෙළෙඳපොළේ භාණ්ඩාගාර බිල්පත් ගණුදෙනුවල මහ බැංකුව තවදුරටත් නිරත විය. 1985 දී රුපියල් දශ ලක්ෂ 75,844.1 ක් වූ විකුණුම් පිරිවැටුම් ප්‍රමාණය 1986 දී රුපියල් දශ ලක්ෂ 74,295.1 දක්වා අඩු විය. මිළට ගැණුම් පිරිවැටුමද රුපියල් දශ ලක්ෂ 37,131.5 සිට රුපියල් දශ ලක්ෂ 31,817.3 ක් දක්වා අඩු විය.

වර්ෂය තුළදී ඒක්ෂණ මුදල් වෙළෙඳපොළේ පොළී අනුපාතික වසරකට සියයට 9.0 සහ 12.75 අතර වරින්වර වෙනස් විය. මේ අතර ද්විතීය වෙළෙඳපොළේ භාණ්ඩාගාර බිල්පත් ගණුදෙනුවලට අදළ වට්ටම් අනුපාතික වසරකට සියයට 10.0 සිට 10.5 අතර වරින් වර වෙනස් විය.

### පෙරළා සිය රට යන ඉන්දියානුවන් වෙත සහනාධාර හා කරුණා සහගත ගෙවීම්

1964 ඉන්දු-ලංකා ගිවිසුම යටතේ ගැණෙන ඉන්දියානු සම්භවය ඇති කම්කරුවන් පෙරළා සිය රට යැවීම ඉක්මන් කරවනු පිණිස, ක්‍රම දෙකක් රජය වෙනුවෙන් ක්‍රියාත්මක කරවීම බැංකුව විසින් නොකඩවා කරගෙන යනු ලැබිය. ක්‍රියාත්මක කරන ලද ක්‍රම දෙක මෙසේය.

(අ) එසේ පෙරළා සිය රට යන්නන් හට ප්‍රේෂණය කිරීමට අනුමත කරන ලද ප්‍රමාණයෙන් සියයට 65 කට සමාන මුදලක් හෝ ඉන් කොටසක් ගෙවීමේ සහනාධාර ක්‍රමය සහ

(ආ) මෙකී කම්කරුවනට ශ්‍රී ලංකාව හැර යාම දිරි ගැන්වීමක් වශයෙන් කරුණා සහගත ගෙවීමක් ලෙස එක් අයෙකුට රු. 500 ක් හා එම මුදලින් සියයට 65 ක් ගෙවීමේ ක්‍රමය.

බැංකුව විසින් මෙකී ක්‍රම දෙක ක්‍රියාත්මක කරන ලද්දේ වාණිජ බැංකු මාර්ගයෙනි. 1986 වර්ෂය තුළදී සහනාධාර ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 0.467 ක් මෙසේ පෙරළා සිය රට යන්නවුනට ගෙවන ලදී. වසර තුළදී මෙසේ රට හැර ගිය 129 දෙනෙකු වෙනුවෙන් ගෙවන ලද කරුණා සහගත ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 0.5 ක් විය.

### අනිවාර්ය ඉතිරි කිරීමේ අරමුදල

1971 අංක 6 දරණ අනිවාර්ය ඉතිරි කිරීමේ පනත හා 1972 අංක 15 දරණ ආදායම් සීමා කිරීමේ සහ අනිවාර්ය ඉතිරි කිරීමේ නීතිය යටතේ එකතු කරන ලද මුදල්වල භාරකරු වශයෙන් තවදුරටත් ක්‍රියා කළ මහ බැංකුව රජය වෙනුවෙන් අනිවාර්ය ඉතිරි කිරීමේ අරමුදල පරිපාලනය කළේය. වසර තුළදී බැංකුව විසින් ප්‍රතිලාභ ඉල්ලුම් පත් 1,263 ක් මත, රුපියල් දශ ලක්ෂ 3.6 ක් (පොළියද ඇතුළුව) දයකයිනට ගෙවන ලදී.

### රාජ්‍ය ගිණුම්

රජයේ බැංකුකරු වශයෙන් බැංකු කටයුතු දෙපාර්තමේන්තුවෙ රාජ්‍ය ගිණුම් ශාඛාව විසින් රාජ්‍ය දෙපාර්තමේන්තුවල රාජ්‍ය නියෝජ්‍යත්ව සහ ආයතනවල හා සමහර ව්‍යවස්ථාපිත මණ්ඩලවල ගිණුම් තවදුරටත් පවත්වාගෙන යනු ලැබීය. 1986 දෙසැම්බර් අවසානයේදී රාජ්‍ය ගිණුම් අංශයෙහි වූ සක්‍රිය ගිණුම් සංඛ්‍යාව 162 ක් (රාජ්‍ය දෙපාර්තමේන්තු 147 සහ වෙනත් 15) විය.

## ව්‍යවහාර මුදල් නිකුතුව

1986 දෙසැම්බර් 31 වැනිදා වන විට සංසරණයේ පැවැති මුළු ව්‍යවහාර මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 12,863.2 ක් විය. මෙය රුපියල් දශ ලක්ෂ 12,229.0 ක නෝට්ටුවලින්ද, රුපියල් දශ ලක්ෂ 634.2 ක කාසිවලින් ද සමන්විත විය. කලින් වර්ෂය අග දී පැවැති රුපියල් දශ ලක්ෂ 11,319.4 ක සංඛ්‍යාවට වඩා මෙය රුපියල් දශ ලක්ෂ 1,543.8 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. වර්ෂය තුළ දී ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි සංසරණය අනුපිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 1,465.2 කින් හා රුපියල් දශ ලක්ෂ 78.6 කින් වැඩි විය.

බැංකුවේ ඉංග්‍රීසි නම '' සෙන්ට්‍රල් බැන්ක් ඔෆ් සිලෝන් '' යන්න වෙනුවට '' සෙන්ට්‍රල් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා '' යනුවෙන් වෙනස් කිරීම නිසා බැංකුව මගින් මුද්‍රිත, 1985 දෙසැම්බර් 31 වැනිදට (පනත සංශෝධනය කළ දිනය) පසුව හෝ එම දිනය දරන හෝ සියලුම ව්‍යවහාර මුදල් නෝට්ටුවල එම සංශෝධනය ඇතුළත් කිරීමට පියවර ගන්නා ලදී. කාසි පිළිබඳව, රු. 5 කාසියේ දරයේ දක්වෙන බැංකුවේ සංක්ෂිප්ත ඉංග්‍රීසි නම ද '' සී.බී.සී.'' යන්න වෙනුවට '' සී.බී.එස්.එල්.'' යනුවෙන් කියැවෙන සේ සංශෝධනය කරන ලදී. කෙසේවුවද, බැංකුවේ සිංහල සහ දෙමළ නම් නොවෙනස්ව පවතී.

සමාලෝචනයට භාජන වී ඇති වර්ෂය තුළදී ව්‍යවහාර මුදල් නෝට්ටුවල ජල මුද්‍රාවේ දක්වා ඇති සිංහ ලාංඡනය වෙනස් කිරීමට පියවර ගන්නා ලදී. මේ අනුව, බැංකුවේ ඉංග්‍රීසි නම සංශෝධනය සමග ම ඊට අනුකූලව නිකුත් කරන ලද ව්‍යවහාර මුදල් නෝට්ටුවල ජාතික කොඩියේ දක්වෙන සිංහ ලාංඡනය, ජල මුද්‍රාව ලෙස යොදා ඇත. නව මෝස්තරයක රුපියල් 1,000 නෝට්ටුවක් නිකුත් කිරීම සඳහා ද පියවර ගන්නා ලදී.

## බැංකු සංවර්ධනය

1986 වර්ෂය ආරම්භයේදී දේශීය බැංකු හතරකින් සහ විදේශීය බැංකු විසි එකකින් සමන්විත, වාණිජ බැංකු විසි පහක්, ප්‍රධාන ශාඛා 600 ක පද්ධතියකින් යුක්තව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මකව පැවතුණි. මීට අමතරව, ග්‍රාමීය බැංකු 914 ක්ද, කෘෂිසේවා මධ්‍යස්ථාන 53 ක්ද, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා 17 ක්ද විය. තවද, විදේශ බැංකු නියෝජිත කාර්යාල දෙකක් සහ වණික් බැංකු සමාගම් දෙකක් රට තුළ ව්‍යාපාර කටයුතුවල නිරත විය.

සමාලෝචිත වර්ෂය තුළ, බැංකු සංවර්ධන ක්ෂේත්‍රය පිළිබඳ වෙනස්කම් කිහිපයක් දක්නට ලැබුණි. 1986 දෙසැම්බර් මස 31 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විදේශ බැංකු දෙකක් ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කටයුතු නවතා දැමීය. සීමාසහිත ඩුබායි බැංකුව, සීමාසහිත යුනියන් බැන්ක් ඔෆ් ද මිඩ්ල් ඊස්ට් වෙත පවරා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් සීමාසහිත ඩුබායි බැංකුවේ කොළඹ ශාඛාවේ ව්‍යාපාර කටයුතු, භාරගත් සීමාසහිත යුනියන් බැන්ක් ඔෆ් ද මිඩ්ල් ඊස්ට් බැංකුවේ කොළඹ ශාඛාව, සීමාසහිත යුනියන් බැන්ක් ඔෆ් ද මිඩ්ල් ඊස්ට් නමින් ක්‍රියාත්මක වීමට තීරණය කළ බව ප්‍රකාශයට පත් කරන ලදී. 1980 ජූලි මාසයේ දී ශ්‍රී ලංකාවේ සිය ශාඛාවක් විවෘත කළ බැන්ක් ඔෆ් ඇමෙරිකා විසින් 1986 දෙසැම්බර් මස 31 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, එම ශාඛාව වසා දමන ලද්දේ, බැංකුව විසින් ලොව පුරා සිය කටයුතු විධිමත් කිරීම සඳහා ගෙන යන ක්‍රියාවලියේ අංගයක් ලෙසිනි. මෙම වෙනස්කම් සමග 1986 දෙසැම්බර් අවසානය වනවිට රට තුළ ක්‍රියාත්මක වූ මුළු විදේශ බැංකු සංඛ්‍යාව 21 සිට 19 දක්වා අඩු විය. මුදල් නීති පනතේ 121 බී වගන්තිය යටතේ දේශීය වශයෙන් ස්ථාපිත වාණිජ බැංකු දෙකක් පිහිටුවීම සඳහා වර්ෂය තුළදී අවසර දෙනු ලැබීය. මේවා පිහිටුවීමෙහි ලා අවශ්‍ය මූලික කටයුතු වර්ෂය අවසානය වන විටදී සූදානම් වෙමින් පැවතිණි. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ නියෝජිත කාර්යාල දෙකෙන් එකක් වන මෙලන් බැන්ක් එන්. ඒ. ශ්‍රී ලංකා 1986 පෙබරවාරි මාසයේ සිට මෙහෙයවුම් කටයුතු නවතා දැමීය.

වර්ෂය තුළදී රාජ්‍ය බැංකු දෙක විසින් නව ශාඛා හතක් විවෘත කරන ලදී. ලංකා බැංකුව විසින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ මීගල්ලෑව සහ එප්පාවල ශාඛා දෙකක්ද, මාතර දිස්ත්‍රික්කයේ රුහුණ විශ්ව විද්‍යාලයේ එක් ශාඛාවක්ද වශයෙන් ශාඛා තුනක් ආරම්භ කරන ලද අතර, 1986 දෙසැම්බර් මාසයේදී සිය ඕල්කොට් මාවත ශාඛාව වසා දමන ලදී. මේ අනුව, 1986 දෙසැම්බර් අවසානය වනවිට ලංකා බැංකුවේ මුළු ශාඛා සංඛ්‍යාව 238 ක්ව පැවතුණි. වර්ෂය තුළදී මහජන බැංකුව විසින් ශාඛා හතරක් ආරම්භ කරන ලදී. මෙයින් දෙකක් කොළඹ දිස්ත්‍රික්කයේ මල්වත්ත පාරේ හා කටුබැද්දේද, එකක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ තලාවේද, අනෙක ගම්පහ දිස්ත්‍රික්කයේ රාගමද විය. ඒ අනුව, 1986 වර්ෂය අවසානයේදී මහජන බැංකුවේ මුළු ශාඛා සංඛ්‍යාව 297 ක්ව පැවතුණි. ලංකා වාණිජ බැංකුවද 1986 දෙසැම්බර් මාසයේදී නව ශාඛාවක් කුරුණෑගල ආරම්භ කළ අතර, ඉන්දියානු රාජ්‍ය බැංකුව සිය අනුරාධපුර ශාඛාව 1986 පෙබරවාරි මාසයේදී වසා දමන ලදී. මෙම වෙනස්කම්ද, බැන්ක් ඔෆ් ඇමෙරිකාහි ශාඛාව හා සීමාසහිත ඩුබායි බැන්ක් ශාඛාව වසා දැමීමද, සමග 1985 අවසානයේදී රට තුළ 600 ක්ව පැවති මුළු වාණිජ බැංකු ප්‍රධාන ශාඛා සංඛ්‍යාව 1986 අවසානය වනවිට 604 දක්වා වැඩි විය.

1986 වර්ෂය තුළදී ජාතික ඉතිරි කිරීමේ බැංකුව ගල්නෑව, මාවනැල්ල හා බණ්ඩාරවෙල යන ස්ථානවල ශාඛා තුනක් ආරම්භ කළේය. ඒ අනුව, සිය මුළු ශාඛා සංඛ්‍යාව 60 දක්වා වැඩි ක රවන ලදී.

1986 වර්ෂය තුළදී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු නව ශාඛා පහළොවක් ආරම්භ කරන ලදී. මේ අනුව, ඔවුන්ගේ මුළු ශාඛා සංඛ්‍යාව (මූලස්ථාන කාර්යාල හැරුණු විට) 32 ක් විය. අම්බලන්තොට සිය ප්‍රධාන කාර්යාලය සහිතව නව ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවක් 1986 දෙසැම්බර් මාසයේදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකාවේ බැංකු සේවා නවීකරණය කිරීමේ සිය ප්‍රතිපත්තිය මහ බැංකුව විසින් තවදුරටත් අනුගමනය කරනු ලැබීය. මෙම ප්‍රතිපත්තිය අනුව ඉලෙක්ට්‍රොනික් ටෙලර් කාඩ් යන්ත්‍ර ස්ථාපනය කිරීම සඳහා සීමාසහිත හොංකොං ඇන්ඩ් ෂැන්හයි බැංකුවට මහ බැංකුව විසින් අවසර දෙන ලදී. මෙම බැංකුව විසින් ඒ අනුව ඉලෙක්ට්‍රොනික් ටෙලර් කාඩ් යන්ත්‍ර දෙකක් ස්ථාපනය කිරීමත් සමගම ශ්‍රී ලංකාව පළමු වතාවට 1986 දී ඉලෙක්ට්‍රොනික් බැංකු සේවා ක්ෂේත්‍රයට අවතීර්ණ විය. ස්වයංක්‍රිය චෙක් නිෂ්කාශන ක්‍රමයක් හඳුන්වා දීම මගින් සහ බැංකු සේවාවන් පරිගණකගත කිරීමෙහි කටයුතුද මහ බැංකුව විසින් අරඹා ඇත. මෙයට අමතරව අප්‍රමාදව සිය ශාඛා වලින් තොරතුරු ලබා ගැනීමට හැකි පණිවුඩ හුවමාරු පද්ධතියක් වාණිජ බැංකු කිහිපයක් විසින් හඳුන්වා දී ඇත.

### බැංකු අධීක්ෂණය

#### වාණිජ බැංකු

මහ බැංකුව විසින් මුදල් නීති පනතේ 29 (1) ඡේදය අනුව 1986/87 පරීක්ෂණ කාලච්ඡේදය සඳහා වාණිජ බැංකු එකොළහක පරීක්ෂණ කටයුතු ආරම්භ කරනු ලැබූ අතර, ඉන් තුනක පරීක්ෂණ කටයුතු අවසන් කරන ලදී. තවද, වාණිජ බැංකු මගින් එක් එක් මාසාවසානයන්හිදී සපයන ලද වත්කම් සහ වගකීම් පිළිබඳ ප්‍රකාශන පදනම් කරගෙන සියළුම වාණිජ බැංකුවල මූල්‍ය තත්ත්වයන් පරීක්ෂණයට ලක් කරන ලදී. 1985 වර්ෂය තුළ වූ ලාභදායීතාවයද ඔවුන් විසින් සපයන ලද වාර්තා පදනම් කරගෙන අගයන ලදී. තවද, විදේශ බැංකු මගින් ඒවායෙහි සේවකයන්ට ලබා දෙන ලද පුහුණු පහසුකම්ද මහ බැංකුවේ පරීක්ෂණ කටයුතුවලට ලක් විය.

විදේශ විනිමය බැංකු කටයුතු ක්‍රමය යටතේ, වාණිජ බැංකු මගින් ආරම්භ කරන ලද විදේශ විනිමය බැංකු ඒකකයන්හි ගණුදෙනු කටයුතු පිළිබඳව පරීක්ෂාකාරීව සිටීමේ වැඩපිළිවෙලෙහි මහ බැංකුව තවදුරටත් නිරත වුනි.

### මූල්‍ය සමාගම්

1979 අංක 27 දරණ මූල්‍ය සමාගම් පාලන පනතේ විධිවිධාන අනුව මුදල් මණ්ඩලය වෙත ලියාපදිංචි කරන ලද මූල්‍ය සමාගම් අධීක්ෂණය කිරීමේ සහ පරීක්ෂා කිරීමේ කටයුතුවල මහ බැංකුව නිරත විය. 1986 දෙසැම්බර් 31 වෙනි දිනට ආයතන 72 ක් මහ බැංකුවේ ලියාපදිංචි වී තිබුණි. මෙම වර්ෂය තුළදී ලියාපදිංචිය සඳහා බැංකුව වෙත ලැබුණ අයදුම්පත් දෙකක්, එම සමාගම් 1979 අංක 27 දරන මූල්‍ය සමාගම් පනතේ විධිවිධානවලට අනුකූල නොවීමේ හේතුවෙන් ප්‍රතික්ෂේප කෙරිණ.

මූල්‍ය සමාගම් කෙතෙක් දුරට මුදල් මණ්ඩලයේ නියෝගවලට අනුකූල වීදැයි නිශ්චයකර ගැනීම සඳහා එකී සමාගම් හැත්තෑ එකක් (71) නිරීක්ෂණය කරනු ලැබිණ. පනතේ 15(1) ඡේදය අනුව, 1986 වර්ෂය තුළ, සමාගම් 13 ක පරීක්ෂණ කටයුතු ආරම්භ කරනු ලැබීය. මීට අමතරව මූල්‍ය සමාගම් පාලන පනත යටතේ මුදල් මණ්ඩලය මගින් පනවන ලද නියමයන් කඩ කිරීම සම්බන්ධයෙන් සමහර මූල්‍ය සමාගම්වලට විරුද්ධව නීතිමය ක්‍රියා මාර්ගයක් ගැනීමේ මූලික පියවරක් වශයෙන්, මුදල් මණ්ඩලය මගින් නිකුත් කරන ලද නියමයන් අනුව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින්, එවැනි මූල්‍ය සමාගම්වල අධ්‍යක්ෂවරුන්ට විරුද්ධව පොලිසියට පැමිණිලි කරන ලදී. තවද, මූල්‍ය සමාගම් පාලන පනතේ 16 වෙනි ඡේදය යටතේ මුදල්

මණ්ඩලය මගින් සමාගම් තුනක ගණුදෙනු කටයුතු අත්හිටුවීම අනුමත කරන ලදී. පසුව, එක් සමාගමකට ගණුදෙනු කටයුතු තවදුරටත් පවත්වාගෙන යාමට ඉඩ දෙන ලද අතර, අනෙක් සමාගම් දෙක ඈවර කිරීම සඳහා නඩු පවරන ලදී.

මූල්‍ය සමාගම් මගින් සපයන ලද මුළු තැන්පතු වගකීම් පිළිබඳ මාසික වාර්තා, මුළු ද්‍රවශීල වත්කම් සහ වාර්ෂික ලාභාලාභ ගිණුම් සහ ශේෂ පත්‍ර වර්ෂය තුළදී අගයන ලද්දේ, ද්‍රවශීල වත්කම් අවශ්‍යතා, ප්‍රාග්ධන අරමුදල් හා සංචිත අරමුදල්වලට මාරු කිරීම් පිළිබඳ මුදල් මණ්ඩලයේ නියෝගවලට අනුකූල වීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරවමිනි.

## සංවර්ධන මුදල්

1986 වසර තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදි හා දිගු කාලීන ණය අරමුදල (මැ. දි. ණ. අ.) යටතේ කරන ලද ප්‍රතිමූල්‍ය අනුමත කිරීම්වල සැළකිය යුතු වර්ධනයක් දිස්විය. එහි II, III, හා IV යන කාණ්ඩ යටතේ අනුමත කරන ලද සමස්ත ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 442.8 ක් විය. පසුගිය වසරේ මෙන්ම මෙයින් වැඩි කොටස එනම් රුපියල් දශ ලක්ෂ 316.4ක් නැතහොත් සියයට 71 අඩාලවූ ව්‍යාපෘති පුනරුත්ථාපනය කිරීම සඳහා වෙන් විය. වාණිජ බැංකු විසින් සංචාරක හෝටල් සඳහා ලබාදී ඇති ණය මුදල්වල පොලිය ප්‍රාග්ධනිත කිරීමද ඊට ඇතුළත් විය. කෘෂිකාර්මික අංශය වෙනුවෙන් කරන ලද ප්‍රතිමූල්‍ය අනුමත කිරීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 80.6 ක් විය. වැවිලි අංශයේ මැදි කාලීන ආයෝජන වැඩ සටහනේ දේශීය මූල්‍ය භාගය පියවීම සඳහා කළ අනුමත කිරීම් එසේ වීමට බොහෝදුරට හේතු විය. ප්‍රතිමූල්‍ය අනුමත කිරීම් පිළිබඳ කෙටි සටහනක් 2.2 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ.

### 2.2 සංඛ්‍යා සටහන

**මැදි හා දිගුකාලීන ණය අරමුදල**
**(කාණ්ඩ II – IV ප්‍රතිමූල්‍ය අනුමත කිරීම්)**

රුපියල් දශ ලක්ෂ

| කාණ්ඩය | 1984 | | 1985 | | 1986 | |
|---|---|---|---|---|---|---|
| | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය | ණය ප්‍රමාණය | ප්‍රතිමූල්‍ය ප්‍රමාණය |
| II අපනයන අංශය .. | 113·0 | 79·1 | 13·7 | 9·0 | 41·4 | 29·0 |
| III සහ IV | | | | | | |
| (i) කෘෂිකර්මය .. | 0·1 | 0·1 | 2·6 | 1·6 | 134·4(අ) | 80·6 |
| (ii) කර්මාන්ත .. | 98·2 | 49·1 | 38·9 | 27·2 | 1·0 | 0·6 |
| (iii) හෝටල් | — | — | — | — | 2·5 | 1·5 |
| (iv) අනෙකුත් .. | 2·2 | 1·3 | 6·5 | 3·9 | 16·5 | 14·7 |
| අඩාල වූ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීම .. | — | — | 145·5 | 101·9 | 325·6(ආ) | 316·4 |
| එකතුව .. | 213·5 | 129·6 | 207·2 | 143·6 | 521·4 | 442·8 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) මැදි කාලීන ආයෝජන වැඩ සටහන යටතේ වැවිලි කර්මාන්ත ව්‍යාපෘති සඳහා ලබා දෙන ලද සමස්ත අගය රුපියල් දශ ලක්ෂ 130·4 ක් වන ණය මුදල් 5 ක්ද ඇතුළත්ය.

(ආ) සංචාරක හෝටල් වලට ලබා දෙන ලද රුපියල් දශ ලක්ෂ 40.9 ක ණය ප්‍රමාණයක් මත හිඟ හිට ඇති පොලිය ප්‍රාග්ධනිත කිරීම ද ඇතුළත්ය.

සංචාරක හෝටල් අංශයට ලබාදී ඇති සහන ක්‍රමය ක්‍රියාත්මක කිරීම මහ බැංකුව විසින් නොකඩවා කරගෙන යන ලදී. මෙම යෝජනා ක්‍රමය 1984 දී ප්‍රථම වතාවට ප්‍රකාශයට පත් කරන ලදී. ආරම්භයේදී මෙම සහන කටයුතුවලට ඇතුලත් වූයේ ණය මුදල් වෙනුවෙන් වාරික හා පොළී මුදල් ගෙවීම් සඳහා 1987 මාර්තු දක්වා දීර්ඝ වන විරාම කාලයක් ලබා දීමත්, අනතුරුව ණය මුදල්වල හිඟහිට ඇති ශේෂයන් දීර්ඝ කරන ලද කාලපරිච්ඡේදයකට ප්‍රතිලේඛනගත කිරීමත්, හිඟහිට ඇති පොළියෙන් සියයට 60 ක ප්‍රමාණයක් සඳහා මහ බැංකුව මගින් ප්‍රතිමූල්‍යනය කිරීමත්ය. විරාම කාලය 1989 මාර්තු මස දක්වා දීර්ඝ කිරීමෙන්ද, කලින් ඉඩහල සියයට 80 ක ප්‍රතිලේඛනගත කිරීමේ සීමාව සියයට 100 දක්වා ඉහළ නැංවීමෙන්ද, මෙම සහනයන් 1985 වසරේදී සංශෝධනය කරන ලදී.

1986 වසර අවසානයේදී, හෝටල ව්‍යාපෘති 66 ක් වෙනුවෙන් ප්‍රතිලේඛනගත කර අවසන් කරන ලද ණය මුදල්වල සමස්ත අගය රුපියල් දශ ලක්ෂ 371.3 ක් විය. මීට අමතරව, සමස්ත අගය රුපියල් දශ ලක්ෂ 116.5 ක් වූ හිඟහිට තිබූ පොළී ප්‍රමාණයක්ද, මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍යනය කරන ලදී. තවත් හෝටල 48 කට අදළ සමස්ත අගය රුපියල් දශ ලක්ෂ 245.6 ක් වන ණය මුදල් ප්‍රතිලේඛනගත කිරීම සඳහා සළකා බැලෙමින් පවතී. මෙම යෝජනා ක්‍රමය යටතේ අත්කරගත් ප්‍රගතිය 2.3 වැනි සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ.

**2.3 සංඛ්‍යා සටහන**

**සංචාරක කර්මාන්තයට සහන සැලසීම – ණය මුදල් ප්‍රතිලේඛනගත කිරීම**

(1986 දෙසැම්බර් දක්වා සමුච්චිත එකතුව)

| ණය දුන් ආයතනයේ නම | නිම කරන ලද ප්‍රතිලේඛනගත කිරීම | | සලකා බැලෙමින් පවතින ප්‍රතිලේඛනගත කිරීම | | මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍යනය කරන ලද හිඟ හිටි පොළිය |
|---|---|---|---|---|---|
| | හෝටල් සංඛ්‍යාව | ණය ප්‍රමාණය (රුපියල්) | හෝටල් සංඛ්‍යාව | ණය ප්‍රමාණය (රුපියල්) | ප්‍රමාණය (රුපියල්) |
| ලංකා සංවර්ධන මුදල් සමායතනය .. | 25 | 13,26,86,710 | — | — | 7,29,29,789 |
| ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව .. | 10 | 10,56,78,568 | 2 | 1,43,80,000 | 3,32,96,389 |
| මහජන බැංකුව .. | 11 | 3,46,28,822 | 20 | 12,05,40,168 | — |
| ලංකා බැංකුව .. | 10 | 5,37,32,389 | 11 | 3,86,81,975 | — |
| සීමාසහිත හැටන් නැෂනල් බැංකුව .. | 5 | 3,66,06,301 | 2 | 26,70,063 | 85,28,919 |
| සීමාසහිත ලංකා වාණිජ බැංකුව .. | 4 | 49,41,450 | 9 | 2,87,83,776 | — |
| ග්‍රින්ඩ්ලේස් බැංකුව .. | — | — | 1 | 69,64,285 | — |
| ඩොයිෂ් බැන්ක් (ආසියා)ඒ. ජී. .. | 1 | 30,59,256 | — | — | 18,33,943 |
| ඉන්දු සුවස් බැංකුව .. | — | — | 3 | 3,36,55,847 | — |
| එකතුව .. | 66 | 37,13,33,496 | 48 | 24,56,76,114 | 11,65,89,040 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

අරමුදල් නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීම සහ ඉලක්ක සපුරා ගැනීම සොයා බැලීම සඳහාත්, කර්මාන්ත ව්‍යාපෘති අඩාල වීමේ ප්‍රවනතාවයන් වෙතොත් ඒවා හැඳින ගැනීම සඳහාත්, ප්‍රතිමූල්‍ය අනුමැතියනට අදළ පසුවිපරම් කටයුතු වසර තුළදී වඩාත් තීව්‍ර කරන ලදී.

ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් ලබාදී ඇති දෙවන සුමක ණය මාලාව උපයෝජනය සමාලෝචනයට භාජනය වන වසර තුළදී සතුටුදායක පරිදි වර්ධනය විය. මෙම යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘති 1,751 ක් සඳහා එකතුව රුපියල් දශ ලක්ෂ 748.7 ක මුදලක් වෙනුවෙන් 1986 දෙසැම්බර් මස අවසානය වනවිට ගිවිසුම්වලට එළඹ ඇත. ඊට සහභාගි වන ණය දෙන ආයතන මසකට රුපියල් දශ ලක්ෂ 30 ක පමණ ඉහළ ගිවිසුම්වලට එළඹීමේ අනුපාතිකයක් වාර්තා කර ඇත. ඒ අනුව සුමක II ව්‍යාපෘතියට අදළ ණය ගිවිසුම්වලට එළඹීම 1987 මුලදීම සම්පූර්ණ වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

එසේම, ව්‍යාපෘති සෘජු පරීක්ෂණවලට භාජනය කිරීමෙන් මහ බැංකුව සිය සුමක පසුවිපරම් කටයුතු පුළුල් කර ඇත. 1986 දී ව්‍යාපෘති 98 ක් එසේ සෘජු පරීක්ෂණයට භාජනය කරන ලදී. අඩාල වීමේ ලක්ෂණ පහළ කළ කර්මාන්ත ව්‍යාපෘතීන් අලලා පසුවිපරම් කටයුතුවලට ප්‍රධාන තැනක් දුන් අතර, එම ව්‍යාපෘතීන් පුනරුත්ථාපනය හෝ නගාසිටුවීම පිණිස අවශ්‍ය උපදෙස් බැංකුවලට සහ ණය කරුවනට ලබාදීමටද පියවර ගන්නා ලදී. මහ බැංකුවේ පසු විපරම් ක්‍රියාමාර්ගය ණය මුදල් අයකර ගැනීම ඉහළ නංවාලීමට හා අඩාල වූ ව්‍යාපෘති පුනරුත්ථාපනය කිරීමට උපකාරී වූ බව පෙන්නුම් කරන පැහැදිලි සාක්ෂි තිබේ. සුළු පරිමාණ කර්මාන්ත හා සුමක I යෝජනා ක්‍රමය යටතේ 1985 දී 622 ක් වූ හිඟහිට ඇති ණය සංඛ්‍යාව 1986 දී 492 දක්වා අඩු වී ඇත.

**ණය සහතික කටයුතු**

ණය සහතික කටයුතුවල සාරාංශයක් 2.4 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**සුළු පරිමාණ කර්මාන්ත (සු. පරි. ක.) යෝජනා ක්‍රමය**

සුළු පරිමාණ කර්මාන්ත ක්‍රමය යටතේ ණය සහතික නිකුත් කිරීම 1981 අවසානයේදී නිම කරන ලදී. කාර්මික සංවර්ධන මණ්ඩලයේ නිර්දේශ මත ණය දෙන ආයතන විසින් ලබාදුන් ණය මුදල් සඳහා සුළු පරිමාණ කර්මාන්ත යෝජනා ක්‍රමය යටතේ මහ බැංකුව විසින් රජය වෙනුවෙන් ණය සහතික සපයන ලදී. ඒ අනුව, රුපියල් දශ ලක්ෂ 31 ක මුදලක් ආවරණය වන පරිදි ණය සහතික 767 ක් මහ බැංකුව විසින් නිකුත් කරන ලදී. 1986 අවසානය වනවිට මෙම ණය මුදල්වලින් 545 ක් සම්පූර්ණයෙන් අය කරගෙන ඇති බවට වාර්තා වී ඇති අතර, ණය සහතික 62 ක් අහෝසි වූ හෝ ඉවත් කරගන්නා ලද ඒවා සේ සළකන ලදී. එම යෝජනා ක්‍රමය යටතේ 1986 අවසානය වනවිට නොපියවා තිබූ ණය මුදල් සංඛ්‍යාව 108 ක් විය. ඒවායින් 105 ක වාරික හිඟහිට ඇති බව වාර්තා වී ඇත. මෙම යෝජනා ක්‍රමය යටතේ මහ බැංකුව ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 1.5 ක් වන හිමිකම් පෑම් 50 ක් ගෙවනු ලැබ හෝ පිළිගනු ලැබ ඇත. තවත් හිමිකම් පෑම් 10 ක් සැළකිල්ලට භාජනය වෙමින් පවතී. මෙම ගෙවීම් රජයේ අයවැය ලේඛණය මගින් ප්‍රතිපාදනය කර තිබූ අරමුදල් මගින් කරන ලදී.

**සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත (සුමක I) යෝජනා ක්‍රමය**

1979 දී ඇරඹුණු සුමක I ණය සහතික යෝජනා ක්‍රමය යටතේ ණය දෙන ආයතන විසින් ලබාදුන් ණය මුදල් වෙනුවෙන් මහ බැංකුව ස්වකීයමය වූ ණය සහතික නිකුත් කරන ලදී. ණය සහතික නිකුත් කිරීම 1984 දී නිම කරන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 286 ක මුළු මුදලක් ආවරණය වන පරිදි ණය සහතික 1,668 ක් නිකුත් කරන ලදී. මේවායින් ණය මුදල් 913 කට අදළ රුපියල් දශ ලක්ෂ 89 ක මුදලක් ආපසු ගෙවා ඇත.

## 2.4 සංඛ්‍යා සටහන
## ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සහතික ක්‍රම (1985 - 1986)
## (1986 දෙසැම්බර් 31 දිනට)

(ප්‍රමාණයන් රුපියල් දශ ලක්ෂ ගණනින්)

| ශීර්ෂය | සුළු පරිමාණ කර්මාන්ත (සු. පරි. ක.) | | | | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | සුමක - I | | | | සුමක - II | | | |
| | 1985 | | 1986 | | 1985 | | 1986 | | 1985 | | 1986 | |
| | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය | සංඛ්‍යාව | ප්‍රමාණය |
| අනුමත කරන ලද ණය .. | 767 | 31·2 | 767 | 31·2 | 1,664 | 284·1 | 1,668 | 286·1 | 831 | 382·3 | 1,540(ඉ) | 782·7 |
| සහතික කරන ලද ණය .. | 767 | 23·4(අ) | 767 | 23·4(අ) | 1,664 | 156·4(ඇ) | 1,668 | 157·5(ඇ) | 831 | 204·7(ඈ) | 1,540(ඉ) | 406·9(ඈ) |
| සම්පූර්ණයෙන් ගෙවා නිමි ණය .. | 508 | 17·2 | 545 | 19·4 | 691 | 51·2 | 913 | 89·4 | 23 | 4·1 | 56 | 8·66 |
| ඉවත්කරගන්නා ලද/අහෝසි වූ ණය සහතික | 62 | 3·6 | 62 | 3·6 | 45 | 11·4 | 48 | 12·8 | 23 | 6·9 | 50 | 30·33 |
| වගකීම් පිළිගන්නා ලද/පියවන ලද | | | | | | | | | | | | |
| (i) නොපියවූ ණය .. | 47 | 2·0 | 50 | 2·067 | 95 | 10·835 | 123 | 15·900 | — | — | 1 | 0·060 |
| (ii) වගකීම් පිළිගත් .. | 47 | 1·5 | 50 | 1·550 | 95 | 6·502 | 123 | 9·541 | — | — | 1 | 0·036 |
| ප්‍රතික්ෂේප කළ හිමිකම්පෑම් | | | | | | | | | | | | |
| (i) නොපියවූ ණය .. | 2 | 0·22 | 2 | 0·22 | 10 | 2·83 | 13 | 4·05 | 2 | 0·17 | 2 | 0·17 |
| (ii) හිමිකම් පෑ ප්‍රමාණය .. | 2 | 0·16 | 2 | 0·16 | 10 | 1·66 | 13 | 2·42 | 2 | 0·1 | 2 | 0·1 |
| නොපියවූ ණය .. | 148 | 3·6(ආ) | 108 | 2·5(ආ) | 823 | 105·8(ආ) | 571 | 76·8(ආ) | 783 | 371.4(ආ) | 1,431(ඉ) | 490·0(ආ) |
| (ඉන් හිඟ හිටි ණය) .. | 118 | 2·9 | 105 | 2·4 | 504 | 51·9 | 387 | 48·6 | 79 | 18·5 | 197 | 59·1 |
| නොපියවූ ණය සහතික .. | 148 | 2·7(අ) | 108 | 1·9(අ) | 823 | 60·9(ඇ) | 571 | 44·1(ඇ) | 783 | 231·9(ඈ) | 1,431(ඉ) | 260·0(ඈ) |
| කටයුතු අවසන් නොවූ හිමිකම්පෑම් | | | | | | | | | | | | |
| (i) නොපියවූ ණය .. | 13 | 0·4 | 10 | 0·685 | 69 | 14·1 | 82 | 16·428 | 5 | 0·52 | 12 | 4·326 |
| (ii) හිමිකම් පෑ ප්‍රමාණය .. | 13 | 0·3 | 10 | 0·514 | 69 | 8·5 | 82 | 9·857 | 55 | 0·31 | 12 | 2·596 |
| එකතු කළ ඇප වාරික මුදල් .. | | 0·86 | | 0·89 | | 7·80 | | 8·69 | | 1·39 | | 3·39 |

(අ) නොපියවූ ණය වලින් 75% ප්‍රමාණය.
(ආ) අයකරගත් ණය වාරික හැර.
(ඇ) රු. 0·4 උපරිමයට යටත්ව නොපියවා ඇති ණය වලින් 60% ක ප්‍රමාණය.
(ඈ) රුපියල් දශ ලක්ෂ 2·0 දක්වා වන ණය මුදල් සඳහා රු. 0·8 ක හා රුපියල් දශ ලක්ෂ 2·0 සිට 4·0 දක්වා වන ණය මුදල් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 1·2 ක උපරිමයකට යටත්ව නොපියවා ඇති ණය වලින් 60% ක ප්‍රමාණය.
(ඉ) 1986. 12. 31 දිනට මුදහැර ඇති බවට වාර්තා කර නොමැති, ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 151·96 ක් වූ ණය මුදල් 213 ක්ද ඇතුළත්ය.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

රුපියල් දශ ලක්ෂ 76.8 ක මුළු ණය ශේෂයක් සහිත ණය 571 ක් 1986 දෙසැම්බර් අවසානය වනවිට අයකර ගැනීමට ඉතිරිව තිබුණි. හිඟහිට ඇති ණය සංඛ්‍යාව 1985 දී පැවති 504 සිට 1986 දී 387 දක්වා පහත වැටුන නමුත්, හිඟහිට ඇති ණය මුදල්වල ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 48.6 ක් හෙවත් මෙම යෝජනා ක්‍රමය යටතේ බේරීමට ඉතිරිවී ඇති ණය මුදල් ප්‍රමාණයෙන් සියයට 63 ක් විය. ණය දෙන ආයතන විසින් ඉදිරිපත් කර තිබූ, රුපියල් දශ ලක්ෂ 9.5 ක් සඳහා වූ හිමිකම් පෑම් 123 ක් මහ බැංකුව විසින් 1980 අවසන් වනවිට බේරුම් කරන ලදී. ප්‍රතික්ෂේප වූයේ රුපියල් දශ ලක්ෂ 2.42 ක් සඳහා වූ හිමිකම් පෑම් 13 ක් පමණි. 1986 අවසානය වන විට මෙම යෝජනා ක්‍රමය යටතේ එකතු කරන ලද ඇප වාරිකවල එකතුව රුපියල් දශ ලක්ෂ 8.69 ක් විය.

සුළුක I යෝජනා ක්‍රමය යටතේ ලබා දෙන ලද ණය කර්මාන්ත අනුව වර්ග කර 2.5 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**2.5 සංඛ්‍යා සටහන**

**සුළුක – I යෝජනා ක්‍රමය – කර්මාන්ත අනුව ණය වර්ගීකරණය**

(ප්‍රමාණයන් රුපියල් දහස් ගණනින්)

| කර්මාන්තය | 1979—1986 ණය මුදල් සංඛ්‍යාව | 1979—1986 අනුමත කළ ප්‍රමාණය | සහතික කළ ප්‍රමාණය |
|---|---|---|---|
| 1. වී කෙටීම .. | 352 | 53,510 | 31,500 |
| 2. ලුහු ඉංජිනේරු .. | 192 | 24,775 | 13,869 |
| 3. ගඩොල් සහ අනෙකුත් ගොඩනැගිලි ද්‍රව්‍ය .. | 242 | 48,949 | 27,260 |
| 4. ඇඟලුම්, බතික්, අත්පන්දු, රෙදිපිළි, බුමුතුරුණු ආදිය .. | 142 | 22,142 | 11,525 |
| 5. රබර් හා රබර් උපයෝගී කරගත් භාණ්ඩ .. | 31 | 9,294 | 4,696 |
| 6. පාවහන් සහ අනෙකුත් සම් භාණ්ඩ .. | 22 | 3,452 | 1,821 |
| 7. හකුරු සහ උක් නිෂ්පාදන .. | 6 | 198 | 119 |
| 8. ගෘහ භාණ්ඩ සහ අනෙකුත් දැව භාණ්ඩ .. | 80 | 9,806 | 5,579 |
| 9. කොහු සහ කොහු ආශ්‍රිත නිෂ්පාදන .. | 96 | 8,901 | 5,321 |
| 10. ලිපි ද්‍රව්‍ය සහ අනෙකුත් කඩදාසි නිෂ්පාදන .. | 27 | 4,636 | 2,582 |
| 11. ආහාර සහ පාන වර්ග .. | 80 | 13,202 | 6,953 |
| 12. තීන්ත, පොලිෂ්, වාර්නිෂ් ආදිය .. | 16 | 5,503 | 2,967 |
| 13. ගුවන් විදුලි යන්ත්‍ර හා පාපැදි සඳහා අමතර කොටස් .. | 11 | 725 | 435 |
| 14. සබන් සහ අනෙකුත් සුවඳ විලවුන් වර්ග .. | 30 | 2,004 | 1,177 |
| 15. අත්කම් හා සෙල්ලම් බඩු .. | 29 | 951 | 571 |
| 16. සුරුට්ටු, බීඩි .. | 6 | 48 | 28 |
| 17. ධීවර යාත්‍රා සහ මිරිදිය ධීවර කටයුතු .. | 14 | 11,100 | 4,700 |
| 18. ස්වර්ණාභරණ සහ මැණික් .. | 15 | 944 | 566 |
| 19. ක්‍රීඩා භාණ්ඩ .. | 2 | 80 | 48 |
| 20. කෘෂි උපකරණ .. | 13 | 2,213 | 1,128 |
| 21. වීදුරු සහ අනෙකුත් විදුරු භාණ්ඩ .. | 6 | 1,051 | 631 |
| 22. පිත්තල සහ ඇලුමිනියම් භාණ්ඩ .. | 44 | 6,850 | 3,370 |
| 23. ලී ඉරීම .. | 52 | 11,113 | 6,645 |
| 24. මුද්‍රණ කටයුතු .. | 44 | 12,906 | 6,951 |
| 25. විවිධ .. | 116 | 31,763 | 17,089 |
| එකතුව | 1,668 | 2,86,116 | 1,57,531 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

**සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත (සුළුක II) යෝජනා ක්‍රමය**

සුළුක II ණය සහතික ක්‍රමය 1982 වසරේදී ඇරඹුනු අතර, මුල් වසරවලදී මඳ ප්‍රගතියක් වාර්තා කළේය. ජාතික සංවර්ධන සංගමය විසින් ලබා දෙන ලද දෙවන සුළුක ණය මාලාව ප්‍රයෝජනයට ගැනීමේ කැපී පෙනෙන වර්ධනයක් සමාලෝචනයට භාජනය වන වසර තුළදී ඇති විය. 1986 දෙසැම්බර් මස අවසානය වන විට ණය වශයෙන් ලබා දුන්, රුපියල් දශ

ලක්ෂ 782.7 ක් ආවරණය වන පරිදි ණය සහතික 1,540 ක් මහ බැංකුව විසින් නිකුත් කර ඇත. 1986 අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 8.7 ක් වන ණය මුදල් 56 ක් සම්පූර්ණයෙන්ම ආපසු අයකර ගෙන ඇත. බේරීමට ඉතිරිව ඇති ණය මුදල්වලින්, ශේෂය රුපියල් දශ ලක්ෂ 59.1 ක් සහිත ණය 197 ක් හිඟහිටි ගණයට වැටී ඇත. මෙම යෝජනා ක්‍රමය යටතේ එක් හිමිකම්පෑමක් ගෙවා නිමකර ඇති අතර හිමිකම් පෑම් 12 ක් මහ බැංකුවේ සැළකිල්ලට භාජනව පවතී. සුමක II යෝජනා ක්‍රමය යටතේ ලබාදුන් ණය කර්මාන්ත අනුව වර්ග කර 2.6 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

**2 . 6 සංඛ්‍යා සටහන**

**සුමක – II යෝජනා ක්‍රමය – කර්මාන්ත අනුව ණය වර්ගීකරණය**

(ප්‍රමාණය රුපියල් දහස් ගණනින්)

| කර්මාන්තය | 1982—1986 | | | 1986 | | |
|---|---|---|---|---|---|---|
| | ණය මුදල් සංඛ්‍යාව | අනුමත කළ ප්‍රමාණය | සහතික කළ ප්‍රමාණය | ණය මුදල් සංඛ්‍යාව | අනුමත කළ ප්‍රමාණය | සහතික කළ ප්‍රමාණය |
| 1. ආහාර වර්ග සැකසීම .. | 491 | 2,57,644 | 1,32,535 | 243 | 1,36,444 | 69,570 |
| 2. වෙනත් කෘෂි කර්මාන්ත | 35 | 14,613 | 7,648 | 11 | 5,940 | 3,164 |
| 3. රබර් නිෂ්පාදන .. | 56 | 38,366 | 19,900 | 25 | 17,434 | 9,560 |
| 4. ලෝහ නිෂ්පාදන .. | 156 | 64,478 | 32,897 | 59 | 29,985 | 14,701 |
| 5. ඉදිකිරීමේ ද්‍රව්‍ය .. | 105 | 61,114 | 32,834 | 49 | 29,229 | 15,579 |
| 6. ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු | 8 | 12,075 | 5,785 | 4 | 6,500 | 3,000 |
| 7. දැව නිෂ්පාදන .. | 113 | 37,620 | 20,817 | 43 | 16,307 | 8,484 |
| 8. ඇඟලුම් .. | 87 | 33,205 | 18,306 | 32 | 10,751 | 5,611 |
| 9. රෙදිපිළි .. | 32 | 19,356 | 10,668 | 12 | 10,053 | 5,406 |
| 10. අළුත්වැඩියා කිරීමේ වැඩපොලවල් .. | 63 | 24,655 | 14,366 | 38 | 15,860 | 9,276 |
| 11. විවිධ .. | 394 | 2,19,573 | 1,11,121 | 197 | 1,08,891 | 54,920 |
| එකතුව .. | 1,540 | 7,82,699 | 4,06,877 | 713 | 3,87,394 | 1,99,271 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

## ග්‍රාමීය ණය

1986 වර්ෂය තුළදී ද මහ බැංකුව මගින් ග්‍රාමීය ණය ක්ෂේත්‍රයෙහි තවදුරටත් වැදගත් ක්‍රියා භාරයක් ඉටු කරන ලදී. එයට, ග්‍රාමීය ණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම, විවිධ ණය ක්‍රම මෙහෙයවීම සහ අධීක්ෂණය හා ග්‍රාමීය ණය ආයතන නගා සිටුවීම සහ සංවර්ධනය කිරීම ඇතුළත් විය. 1985 දී පිහිටුවන ලදුව 1986 වර්ෂය තුළදී වඩ වඩාත් ශාඛා එක් කරමින් ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා. ග්‍රා. සං. බැ.) හතරට අමතරව හම්බන්තොට දිස්ත්‍රික්කයේ නව ප්‍රා. ග්‍රා. සං. බැංකුවක්ද පිහිටුවන ලදී.

විමසුමට ලක්වූ වර්ෂය තුළදී ග්‍රාමීය ණය උපදේශක මණ්ඩලය සත් වරක් රැස් විය. මෙම රැස්වීම්වලදී ග්‍රාමීය ණය පිළිබඳ ප්‍රතිපත්තිමය ප්‍රශ්න කීපයක් මණ්ඩලය විසින් සාකච්ඡා කරන ලදී. රටේ දිළිඳුතම ජන කොටස් විසින් අරඹා ඇති නිෂ්පාදනය/සේවා නියුක්තිය මුල් කොටගත් කටයුතුවලට රුකුලක් වශයෙන් බැංකු විසින් දෙනු ලබන ආයෝජන ණය සඳහා ඇප වීමේ ක්‍රමයක් ඇති කිරීමේ යෝග්‍යතාවය, ණය මුදල් අවසන් යෙදවුම් අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු ශක්තිමත් කරලීම පිණිස අතිරේක අධීක්ෂණ කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමේ අවශ්‍යතාවය, නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ මුදල් යොදවනු ලබන විවිධ භෝග සඳහා වන ණය මුදල් පරිමාණයන් ප්‍රතිශෝධනය සහ ගොවියාගේ අවශ්‍යතාවයනට

වඩාත් ගැලපෙන පරිදි සැකසීමෙ අදහස පෙරදැරිව කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමයේ ඇති අඩු ලුහුඬුතා පිරික්සා බැලීම සාකච්ඡාවට භාජනය වූ කරුණු අතර විය. ප්‍රතිමූල්‍ය වෙන් කිරීම සහ ජාත්‍යන්තර නියෝජ්‍යාත්වයන් විසින් දෙනු ලබන විදේශීය ණය ප්‍රයෝජනයට ගැනීම සෙමින් සිදුවීම මණ්ඩලයේ අවධානයට යොමු විය. ඒ අනුව ණය දීම ඉක්මන් කිරීම සඳහා විවිධ යෝජනාද සළකා බලනු ලැබීය. රටේ පශු සම්පත් අංශයේ ඇති ගැටළු පිරික්සා බලා, ඒවා නිරාකරණය කිරීම සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස, මහ බැංකුව, මහජන බැංකුව, ලංකා බැංකුව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය සහ සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය නියෝජනය වන කමිටුවක් මණ්ඩලය විසින් පත් කරන ලදී. මෙම කමිටුවේ වාර්තාව සළකා බලනු පිණිස මණ්ඩලය වෙත ඉදිරිපත් කොට ඇත. 1986 දී, ගව පට්ටි සංවර්ධන ණය යෝජනා ක්‍රමය සහ කෑගලු දිස්ත්‍රික්ක ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙලෙහි ණය ක්‍රමය මණ්ඩලය මගින් අනුමත කරන ලදී. එසේම මැදි හා දිගු කාලීන ණය අරමුදලේ 1 වන කාණ්ඩය යටතේ දෙන ණය සඳහා ඇප වීමේ ක්‍රමය ආසියානු සංවර්ධන බැංකුව (ආ. ස. බැ.) විසින් මුදල් යොදවනු ලැබූ දෙවන (බටහිර වෙරළ) ධීවර යෝජනා ක්‍රමය යටතේ දෙනු ලබන ණය සඳහා ඇප ක්‍රමය සහ අර්තාපල් වගාව සඳහා දෙන ණය පරිමාණයන් ප්‍රතිශෝධනය කිරීම ද මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

මහ බැංකුව 1986 යල කන්නයේ සිට නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය (න.ස.ග්‍රා.ණ.ක්‍ර.) ක්‍රියාත්මක කළ අතර, එම කන්නය තුළදී, වගා ණය වශයෙන් අනුමත කරන ලද මුදල රුපියල් දශ ලක්ෂ 150.9 ක් විය. මෙය ඉකුත් විසි වසර තුළ යල කන්නයක දී ඇති සාමාන්‍ය ණය මට්ටම ඉක්මවීමකි. 1985 යල කන්නයේදී වී වගාව සඳහා බැංකු ක්‍රමයෙන් දුන් රුපියල් දශ ලක්ෂ 36.8 මීට පෙර දී ඇති ඉහළම ණය ප්‍රමාණය විය. න.ස.ග්‍රා.ණ.ක්‍ර. යටතේ දෙනු ලබන ණය සියයට 50 ක ඇප ආවරණයක් ලබයි. මෙම ක්‍රමය යටතේ, සමුපකාර ණය සහ සකසුරුවම් සමිති විසින්ද සිය ගොවි සාමාජිකයනට ණය දීම අරඹා ඇත. බැංකු අංශයේ අනුග්‍රහය ලත් ණය ක්‍රමයකට මෙකී සමිති සහභාගි වූ ප්‍රථම අවස්ථාව මෙය වේ. මෙම ණය ක්‍රමය යටතේ, වගාවන් සඳහා වූ ත්‍රෛවාර්ෂික ණය මාලාව සහ අව්‍යාජ ණය පැහැර හරින්නන්ගේ ණය ප්‍රතිලේඛනගත කිරීම සම්බන්ධයෙන් ප්‍රතිමූල්‍ය දීර්ඝ කිරීමේ පහසුකම් වැනි අනෙකුත් අංග, බැංකු විසින් මෙන්ම ගොවීන් විසින්ද මහත් අභිරුචියකින් පිළිගනු ලැබිය. න.ස.ග්‍රා.ණ. ක්‍රමයට ඇතුළත් කොට ඇති නව වාර්තා ක්‍රමය අනුව වගා ණය දීම සහ ආපසු අයකර ගැනීම පිළිබඳ දත්ත පරිගණක යන්ත්‍ර ගත කිරීම පහසු වී ඇත. තවද මෙම ණය ක්‍රමයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තොරතුරු සතුටුදයක පරිදි ලබා ගැනීමටත්, ණය බෙදීයාම පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් භූගෝලීය වශයෙන් හා විවිධ ණය ගනුවන් අනුවද, ණය දෙන බැංකුවලට කෙටි කාලසීමාවක් තුළදී ලබා දීමට මෙමගින් බැංකුවට හැකි වී ඇත. මෙහෙයවුම් ක්‍රමය නිසා අව්‍යාජ ණය පැහැර හරින්නන්ගේ ණය මුදල් ප්‍රතිලේඛනගත කිරීම සඳහා බැංකුව ප්‍රතිමූල්‍ය සපයනු ලබන ප්‍රතිමූල්‍ය දීර්ඝ කිරීමේ පහසුකම ඵලදායි අයුරින් ක්‍රියාත්මක කිරීමට මහ බැංකුවට හැකි විය.

තෙල් හා මේද සංයුක්ත මණ්ඩලය මගින් නිපදවනු ලබන සත්ව ආහාර සහ එළවලු තෙල් නිපදවීම සඳහා ගනු ලබන බඩ ඉරිඟු, සෝයා බෝංචි, ධාන්‍ය වර්ග සහ වෙනත් රළු ධාන්‍ය වර්ග මිළට ගැනීම සඳහා වූ අලෙවි ණය ක්‍රමය සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී සතුටුදයක ප්‍රගතියක් දක්විය. මෙම ණය ක්‍රමය ප්‍රථමයෙන්ම හඳුන්වා දෙනු ලැබූ අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ, 1986 වර්ෂයේදී බැංකු විසින් ලංකා තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලයට දෙන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 15 ක් විය. නිෂ්පාදකයනට වඩා හොඳ මිළ ගණන් ලබා ගැනීමට මෙම ක්‍රමය උපකාරී වූ බව දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටුව විසින් නිරීක්ෂණය කර ඇත.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී, ග්‍රාමීය අංශයට මැදි හා දිගු කාලීන ණය සැපයීම පිණිස, නව ණය යෝජනා ක්‍රම පහක් හඳුන්වා දුන් අතර, පැවැති ඇතැම් ණය ක්‍රම සඳහා වෙනස් කිරීම්ද කරන ලදී. 1985 දී නවතා දමන ලද, නුවරඑළිය දිස්ත්‍රික්කයේ කිරි පට්ටි සංවර්ධන

### මැදි හා දිගුකාලීන ණය අරමුදලේ

### සඳහා අනුමත කරන ලද

| ණය යෝජනා ක්‍රමයේ නම | වෙන් කරන ලද ප්‍රතිමූල්‍ය (රුපියල් දශ ලක්ෂ) |
|---|---|
| **(අ) 1986 වර්ෂය ආරම්භයේදී තිබූ ණය යෝජනා ක්‍රම** | |
| 1. උඩවැඩියා වගාව සඳහා ණය යෝජනා ක්‍රමය ලංකා බැංකුව/සීමාසහිත ලංකා දුම්කොළ සමාගම .. | 4.50 |
| 2. පොල් පොහොර ණය යෝජනා ක්‍රමය .. | 55.00 |
| 3. ධීවර අංශය සඳහා බැංකු ණය යෝජනා ක්‍රමය .. | 140.00 |
| 4. වැව් වාරිමාර්ග නවීකරණ යෝජනා ක්‍රමය .. | 7.69 |
| 5. කුරුණෑගල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ගොවිපොල යන්ත්‍ර උපකරණ සඳහා වන ණය ක්‍රමය .. | 76.50 |
| 6. සම්මන්තුරේ මැතිවරණ කොට්ඨාශය තුළ කිරිපට්ටි පාලන සංවර්ධන (නියමු) ණය යෝජනා ක්‍රමය .. | 0.12 |
| 7. විවිධසේවා සමූපකාර සමිති විසින් ඉදිකරන පොහොර ගබඩා සඳහා ණය යෝජනා ක්‍රමය .. | 14.00 |
| 8. අබුඩාබි රජයෙන් ආධාර ලබන වයඹ දිග වෙරළේ ධීවර සංවර්ධන ව්‍යාපෘතිය .. | 60.00 |
| 9. උඩවැඩියා වගාව සඳහා ණය යෝජනා ක්‍රමය, මහජන බැංකුව/සර්වෝදය/ලක්මල් සල .. | 3.00 |
| 10. ධීවර සමූපකාර සඳහා ණය යෝජනා ක්‍රමය .. | 42.00 |
| 11. මාතලේ, පුත්තලම දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය වැඩ පිළිවෙල .. | 54.79 |
| 12. සුළං බල යන්ත්‍ර සඳහා මූල්‍ය පහසුකම් සඳහා ණය යෝජනා ක්‍රමය .. | 2.56 |
| 13. මාතර දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් සඳහා ස්වයං රැකියා යෝජනා ක්‍රමය .. | 8.20 |
| 14. ආ. ස. බැ.-ශ්‍රී ලංකා ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය .. | 137.00 |
| 15. කුඩා තේ ඉඩම් හිමියන් සඳහා වන පොහොර ණය යෝජනා ක්‍රමය .. | 7.50 |
| 16. ශ්‍රී ලංකා ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයෙන් ආවරණය නොවන දිස්ත්‍රික්කවල බර අදින සතුන් මිළට ගැනීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ණය යෝජනා ක්‍රමය .. | 5.60 |
| 17. ගම් නගා සිටුවීම සහ ස්වයං රැකියා වැඩ පිළිවෙල යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ හඳුනා ගන්නා ලද ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ණය යෝජනා ක්‍රමය .. | 6.00 |
| 18. ගොවිපොලවල කුඩා පරිමාණයේ බීජ අර්තාපල් ගබඩා ඉදිකිරීම් සඳහා ණය යෝජනා ක්‍රමය .. | 1.00 |
| 19. බදුල්ල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙල .. | 7.00 |
| 20. මාදැල් මගින් මසුන් ඇල්ලීමේ ණය යෝජනා ක්‍රමය (වෙරළේ සිට දැල් ඇදීම) .. | 5.00 |
| 21. පැල්වත්ත සීනි ව්‍යාපෘතිය යටතේ උක් වවන්නන් සඳහා ඇති ණය ක්‍රමය .. | 66.00 |
| 22. වවුනියා – මන්නාරම දිස්ත්‍රික්ක ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙල .. | 32.00 |
| 23. සෙවනගල, හිඟුරාණ සහ කන්තලේ සීනි ව්‍යාපෘති යටතේ උක් වවන සුළු ගොවීන් සඳහා ඇති ණය යෝජනා ක්‍රමය .. | 120.60 |
| 24. රඹුක්කන ප්‍රදේශයේ පොල් වවන්නන්ට අතුරු වගාව සහ නැවත වගාව සඳහා දෙනු ලබන ශ්‍රී ලංකා-ආ. ස. බැ. පොල් සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය .. | 8.00 |
| 25. වික්ටෝරියා ව්‍යාපෘතිය යටතේ තැන් අහිමි වූ වෙළෙඳුනට වාණිජ ගොඩනැගිලි මිළ දී ගැනීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය .. | 22.00 |
| 26. නෙත් කලාපිය දිස්ත්‍රික්ක සහ මොනරාගල දිස්ත්‍රික්කය තුළ රෝද දෙකේ ට්‍රැක්ටර් මිළ දී ගැනීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය .. | 81.99 |
| 27. ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ/කාන්තා, කාර්යාංශ ව්‍යාපෘතිය යටතේ ආදායම් ඉපැයීමේ කටයුතුවල නියැලීම සඳහා වතු අංශයේ කාන්තාවනට සහාය වීමේ විශේෂ ණය යෝජනා ක්‍රමය .. | 1.00 |
| 28. කුරුණෑගල දිස්ත්‍රික්කයේ චීන ඉඟුරු, අන්නාසි හා වැල්දෙඩම් වගාව සඳහා ණය යෝජනා ක්‍රමය .. | 32.00 |
| 29. අනුරාධපුර වියලි කලාපීය කෘෂි ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය .. | 22.30 |
| 30. මිනිපේ යෝජනා ක්‍රමයේ පදිංචි කරුවනට, ජීව වායු යන්ත්‍ර සවිකිරීම සඳහා සහාය වීමේ ණය යෝජනා ක්‍රමය .. | 0.40 |
| **(ආ) 1986 වර්ෂය තුළදී අනුමත කරන ලද ණය යෝජනා ක්‍රම** | |
| 1. ශ්‍රී ලංකා-ආ.ස.බැ. පශු සම්පත් සංවර්ධන යෝජනා ක්‍රමය .. | 68.20 |
| 2. මහනුවර, කෑගල්ල සහ මාතලේ දිස්ත්‍රික්කවල ස්වයං රැකියා සහ වෙනත් මධ්‍යම ප්‍රමාණයේ ගොවිපොළ යෝජනා ක්‍රම සඳහා මුදල් යෙදවීම සඳහා වූ ණය ක්‍රමය .. | 6.00 |
| 3. කිරි පට්ටි සංවර්ධනය සඳහා වූ ණය යෝජනා ක්‍රමය .. | 20.60 |
| 4. කළුතර සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ස්වයං රැකියා දියුණු කිරීමේ යෝජනා ක්‍රමය .. | 20.00 |
| 5. උස්සාන වාරිමාර්ග සඳහා අවශ්‍ය නල ළිංතැනීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය .. | 1.10 |
| එකතුව | 1,139.65 |

## 1 වැනි කාණ්ඩය යටතේ ප්‍රතිමූල්‍යනය

### ණය ක්‍රම

| 86.12.31 වන දිනට එයින් ප්‍රයෝජනයට ගෙන ඇති ප්‍රමාණය (රු. දශ ලක්ෂ) | 86.12.31 වන දිනට එයින් ප්‍රයෝජනයට නොගෙන තිබු ප්‍රමාණය (රු. දශ ලක්ෂ) | ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය | වෙන්කරන ලද ප්‍රතිමූල්‍ය ප්‍රයෝජනයට ගතහැකි කාලය (අවුරුදු) |
|---|---|---|---|
| 3.49 | 1.01 | 03.02.79 | 3 |
| 46.85 | 8.15 | 26.03.79 | 3 |
| 112.88 | 27.12 | 02.07.79 | 3 |
| 7.69 | — | 02.06.79 | 1 |
| 71.57 | 4.93 | 28.10.79 | 5 |
| — | 0.12 | 27.11.79 | 3 |
| 9.14 | 4.86 | 13.10.80 | 1 |
| — | 60.00 | 13.10.80 | 3 |
| 0.23 | 2.77 | 10.12.80 | 5 |
| 1.28 | 40.72 | 28.04.81 | 2 |
| 45.07 | 9.72 | 08.05.81 | 6 |
| 1.05 | 1.51 | 11.12.81 | 1 |
| 5.90 | 2.30 | 10.04.81 | |
| 82.31 | 54.69 | 01.07.82 | 1 |
| 0.96 | 6.54 | 11.08.82 | 1 |
| 0.01 | 5.59 | 10.09.82 | 2 |
| 3.68 | 2.32 | 14.10.82 | — |
| — | 1.00 | 01.03.83 | 1 |
| 2.54 | 4.46 | 27.09.83 | 5 |
| 0.68 | 4.32 | 26.04.84 | 1 |
| — | 66.00 | 10.05.84 | 6 |
| 0.70 | 31.30 | 14.06.84 | 4 |
| 9.34 | 111.26 | 20.09.84 | 5 |
| 0.08 | 7.92 | 26.12.84 | 3 |
| — | 22.00 | 11.03.85 | 2 |
| 18.84 | 63.15 | 26.03.85 | 2 |
| 0.30 | 0.70 | 31.12.85 | 1 |
| 3.11 | 28.89 | 27.06.85 | 3 |
| 2.26 | 20.04 | 02.07.85 | 3 |
| — | 0.40 | 16.09.85 | 1 |
| — | 68.20 | 01.03.86 | 3 |
| — | 6.00 | 01.03.86 | — |
| 1.76 | 18.84 | 16.04.86 | 3 |
| 5.71 | 14.29 | 15.05.86 | — |
| — | 1.10 | 08.09.86 | 2 |
| 437.43 | 702.22 | | |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

UNIVERSITY OF MORATUWA LIBRARY SRI LANKA

ණය යෝජනා ක්‍රමය වෙනුවට දීප ව්‍යාප්ත කිරි පට්ටි සංවර්ධන ණය යෝජනා ක්‍රමය ඇති කරන ලදී. පුං ගවයන් සහ පාපැදි (කිරි ප්‍රවාහණය සඳහා) මිළට ගැනීම, ගව මඩු විශාල කිරීම සහ ඒවායේ තත්ත්වය නංවාලීම සහ ජීව වායු උත්පාදකයන් ඉදි කිරීම වැනි කරුණු සඳහා ණය දීම වැනි නවාංග කිහිපයක්ද නව ක්‍රමයට ඇතුළත් කොට ඇත. තවද එළදෙනුන්, ඌරන් සහ කුකුළන් ඇති කිරීම සඳහා වූ ශ්‍රී ලංකා/ආ. ස. බැ. පශු සම්පත් සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ණය දීම සඳහා ණය ක්‍රමයක් 1986 වර්ෂය තුළදී කොළඹ, ගාල්ල, ගම්පහ, යාපනය (සහ කිලිනොච්චි), කළුතර කෑගල්ල, කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලදී. 1985 දී අරඹන ලද තෙත් කලාපයේ ගොවිපළ යන්ත්‍ර උපකරණ සඳහා වන ණය යෝජනා ක්‍රමය සැළකිය යුතු ප්‍රගතියක් පෙන්වූ අතර, ගොවිපළ යන්ත්‍ර උපකරණ සඳහා වැඩිවූ ඉල්ලුම සළකා මෙම ක්‍රමය 1986 දී සියළුම දිස්ත්‍රික්කවලට ව්‍යාප්ත කරන ලදී. මෙම ණය යෝජනා ක්‍රමය, දීප ව්‍යාප්ත ගොවිපළ යන්ත්‍ර උපකරණ සඳහා වන ණය යෝජනා ක්‍රමය යනුවෙන් නැවත නම් කරන ලදී. මහවැලි සංවර්ධන කලාපය තුළ පදිංචිකරුවනට ට්‍රැක්ටර් මිළදී ගැනීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය 1986 දී නවතා දමන ලද අතර, බැංකුව විසින් වෙන් කරන ලද ප්‍රතිමූල්‍ය ප්‍රමාණයෙන් ප්‍රයෝජනයට නොගත් රුපියල් දශ ලක්ෂ 49 ක ශේෂය, දීප ව්‍යාප්ත ගොවිපළ යන්ත්‍ර උපකරණ සඳහා වන ණය යෝජනා ක්‍රමය යටතේ ණය ප්‍රතිමූල්‍යනය සඳහා මාරු කරන ලදී. ඉහතකී ණය යෝජනා ක්‍රමය මුළු රටම ආවරණය වන පරිදි පුළුල් කළ යුතු වූයේ රටේ දිස්ත්‍රික්ක කිහිපයක ගොවිපළ බලශක්ති අවශ්‍යතා සපුරාලූ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙලවල් රාශියක් හා ආ. ස. බැ./ශ්‍රී ලංකා ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය අවසන් වී තිබීම නැතිනම් 1986 මුල් භාගයේදී ඒවා අවසන් වීමට ආසන්නව තිබීම නිසාය.

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පිහිටුවීමත් සමගම, ග්‍රාමීය අංශය සඳහා සැළසුම් කළ ණය යෝජනා ක්‍රම මගින් ගැමි තරුණ තරුණියන්ට ස්වයංරැකියා අවස්ථා වැඩි කරලීම කෙරෙහි වැඩි සැළකිල්ලක් ලැබිණි. මෙම අරමුණ සඳහා ණය යෝජනා ක්‍රම කළුතර හා කුරුණෑගල- දිස්ත්‍රික්කවල ඇති කරන ලදී. තවද, තරුණ තරුණියන්ගේ ස්වයංරැකියා නඟා සිටුවීම පිණිස ණය ක්‍රමයක් බැංකුවේ මාතලේ ප්‍රාදේශීය කාර්යාලයේ බල ප්‍රදේශයට අයත් වන කෑගල්ල, මාතලේ සහ මහනුවර යන දිස්ත්‍රික්කවල ඇති කරන ලදී.

වියළි කලාපයේ දිස්ත්‍රික්ක 6 ක් තුළ නළ ළිං කැනීම පිණිස ණය ලබාදීම සඳහා ණය යෝජනා ක්‍රමයක් 1986 දී ඇති කරන ලදී. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ වූ ණය ක්‍රමය 1986 දී අවසන් විය. මේ අතර, ආරක්ෂක තත්ත්වය අතින් යෝජනා ක්‍රමයේ ප්‍රගතියට බාධා පැමිණීමත්, ඒ හේතුවෙන් ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ දූත මණ්ඩලයට එහි ප්‍රගතිය පිරික්සීම දුෂ්කර වීමත් නිසා වව්නියා–මන්නාරම් දිස්ත්‍රික්ක ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙල යටතේ වූ ණය ක්‍රමය අත්හිටුවීමට සිදු විය. මැදි හා දිගු කාලීන ණය අරමුදලේ 1 වැනි කාණ්ඩය යටතේ දැනට ඇති මැදි හා දිගු කාලීන ණය ක්‍රම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2.7 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

1986 වර්ෂය තුළදී මැදි හා දිගු කාලීන ණය ක්‍රම 35 ක් ක්‍රියාත්මක වූ අතර, මෙකී ණය ක්‍රම යටතේ දෙන ලද ණය සම්බන්ධයෙන් ප්‍රතිමූල්‍ය සැපයීම සඳහා මහ බැංකුව විසින් රුපියල් දශ ලක්ෂ 1,139.7 ක් වෙන් කොට තිබිණ. වර්ෂය අවසානය වන විට ණය දෙන බැංකු විසින් ප්‍රයෝජනයට ගෙන තිබූ ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 437.4 ක් හෙවත් මුළු වෙන් කිරීමෙන් සියයට 38 ක් විය.

සතුටුදායක ප්‍රගතියක් පෙන්වූ ණය යෝජනා ක්‍රම අතර, පොල් පොහොර ණය යෝජනා ක්‍රමය, කුරුණෑගල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙල යටතේ වූ ගොවිපළ යන්ත්‍ර උපකරණ සඳහා වූ ණය ක්‍රමය, තෙත් කලාපීය දිස්ත්‍රික්කවල සහ මොනරාගල දිස්ත්‍රික්කයේ රෝද දෙකේ ට්‍රැක්ටර් මිළට ගැනීම සඳහා වූ ණය ක්‍රමය සහ ශ්‍රී ලංකා – ආ. ස. බැ. ග්‍රාමීය ණය

LIBRARY

යෝජනා ක්‍රමයද විය. තවද, 1985 වසර අවසානයේදී පමණ ඇති කළ ඇතැම් ණය ක්‍රම සහ 1986 දී ඇති කළ ණය ක්‍රමද සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී සතුටුදායක ප්‍රගතියක් දක්වා ඇත. උදාහරණයක් වශයෙන්, කළුතර හා කුරුණෑගල දිස්ත්‍රික්කවල ස්වයංරැකියා නඟා සිටුවීම සඳහා ඇති කළ ණය ක්‍රමය, එය ක්‍රියාත්මක වූ සත්මස තුළ ශීඝ්‍ර ප්‍රගතියක් දක්වා ඇත.

ධීවර අංශය සඳහා වූ ණය ක්‍රම වර්ධනය වූයේ සෙමිනි. කලින් දෙන ලද ණයවලින් ආපසු අයකර ගත් ප්‍රමාණයන් ඉතා පහත් මට්ටමක තිබීම නිසා එම ණය ක්‍රමවලට සහභාගි වීමට ණය දෙන බැංකු මැලිවීම මෙයට හේතු වූවා විය හැකිය. පැල්වත්ත සීනි ව්‍යාපෘතියේ පදිංචි-කරුවන් සඳහා වූ ණය යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ලංකා බැංකුවට (සහභාගි වන බැංකුවට) එකී ණය සැපයීමට නොහැකි වූයේ පැල්වත්ත සීනි සමාගමට එම පදිංචිකරුවන් සමඟ බඳු දීමට අදාළ කටයුතු අවසන් කර ගැනීම ප්‍රමාද වීමේ හේතුවෙනි. මෙම කරුණු දැන් නිරාකරණය වී ඇති අතර, ලබන වසරේ සිට එම පහසුකම ප්‍රයෝජනයට ගනු ලබනු ඇතැයි බලාපොරොත්තු වනු ලැබේ.

1982 සිට ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා–ආ. ස. බැ. ග්‍රාමීය ණය ව්‍යාපෘතිය 1986 දී නිම විය. එ. ජ. ඩොලර් දශ ලක්ෂ 6.9 ක් වූ ප්‍රතිශෝධිත වෙන් කිරීමෙන් එ. ජ. ඩොලර් දශ ලක්ෂ 5.1 ක් හෙවත් රුපියල් දශ ලක්ෂ 128.8 ක් ව්‍යාපෘති කාලසීමාව අවසානය වනවිට ප්‍රයෝජනයට ගෙන තිබිණ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී මහ බැංකුව සම්බන්ධීකරණ ආයතනය ලෙස කටයුතු කළේය. එක් එක් කාණ්ඩය යටතේ ණය වෙන්කිරීම සහ ප්‍රයෝජනයට ගත් ප්‍රමාණය වෙන් වශයෙන් 2.8 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**2 . 8 සංඛ්‍යා සටහන**

**ආ. ස. බැ. – ශ්‍රී ලංකා ග්‍රාමීය ණය ව්‍යාපෘතිය යටතේ**

**අරමුදල් ප්‍රයෝජනයට ගැනීම**

එ. ජ. ඩොලර් '000

| | ප්‍රතිශෝධිත වෙන් කිරීම | ප්‍රයෝජනයට ගත් මුදල |
|---|---|---|
| 1. ගොවිපළ බලශක්ති පහසුකම් .. | 3,792 | 3,779 |
| 2. වාරිමාර්ග පහසුකම් .. | 448 | 400 |
| 3. සහල් මෝල් සහ ගොයම් පෑගීමේ යන්ත්‍ර .. | 400 | 11 |
| 4. උපකරණ සේවා පහසුකම් .. | 256 | 158 |
| 5. අභ්‍යාස ආයතනය .. | 1,107 | 771 |
| 6. බර අදින සත්තු .. | 25 | 22 |
| 7. වෙන් නොකළ .. | 872 | — |
| එකතුව .. | 6,900 | 5,141 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

ආ. ස. බැංකුවෙන් මුදල් යොදවන දෙවන ග්‍රාමීය ණය ව්‍යාපෘතියක් සඳහා 1986 ජූලි මාසයේදී මහ බැංකුව ආ. ස. බැ. සමඟ මූලික සාකච්ඡා ඇරඹීය. මේ පිළිබඳව තවදුරටත් සාකච්ඡා සඳහා ආ. ස. බැ. හි දූත මණ්ඩල 1987 වර්ෂයේදී එනු ඇතැයි අපේක්ෂා කෙරේ. මහනුවර, ගාල්ල සහ පුත්තලම යන පරිපාලන දිස්ත්‍රික්කවල ග්‍රාමීය ණය ව්‍යුහය පිළිබඳව අධ්‍යයනය කිරීමටත්, ප්‍රා. ග්‍රා. සං. බැ. මගින් මෙම දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කිරීම පිණිස '' සුළු ගොවීන්

සහ ඉඩම් නොමැති අය සඳහා වූ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයක් '' සකස් කිරීම සඳහාත්, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ ව්‍යාපෘති සැකසුම් දූත කණ්ඩායමක්ද 1986 ඔක්තෝබර් මාසයේදී මෙහි පැමිණියේය.

වර්ෂය තුළදී මහ බැංකුවේ ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව විසින්, මහජන බැංකු ශාඛා 5 ක, ලංකා බැංකු ශාඛා 5 ක, සමුපකාර ග්‍රාමීය බැංකු 4 ක හා ඉන්දියන් ඕවර්සීස් බැංකුවේ මාතර ශාඛාවේ කෘෂිකාර්මික ණය පිළිබඳව පිරික්සුම් කටයුතු නිම කරන ලදී. මෙම බැංකු ශාඛා මාතර, බදුල්ල, රත්නපුර සහ අනුරාධපුර දිස්ත්‍රික්කයන්හි විය. නිරීක්ෂණය කරන ලද අඩු ලුහුඬුකම් මඟහැර ගැනීම සඳහාත්, ග්‍රාමීය ණය දීම් දියුණු කරලීම සඳහාත්, ගතයුතු ක්‍රියා-මාර්ග නිර්දේශ කරමින් පරීක්ෂණ වාර්තා අදළ බැංකු ශාඛාවල ප්‍රධාන කාර්යාලවලටත්, පරීක්ෂා කරන ලද බැංකු ශාඛාවලටත් යවන ලදී. පරීක්ෂා කරන ලද බැංකු ශාඛාවලින් ලැබුනු අනුකූලතා වාර්තා උපයෝගී කොට ගෙන දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණ කටයුතු පසු විපරම් කරන ලදී. ඉහතකී පරීක්ෂණ කටයුතුවලට අමතරව, න. ස. ග්‍රා. ණ. ක්‍රමය සඳහා අවශ්‍ය වෙනස් කිරීම් කිරීම පිණිස අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ අදහසින්, ක්ෂේත්‍ර මට්ටමින් එම ක්‍රමයේ ප්‍රගතිය පිරික්සා එහි ඵලදයිතාවය අගැයීම සඳහා විශේෂ නිලධාරි කණ්ඩායමක් දිස්ත්‍රික්ක කිහිපයකටම යවන ලදී.

## ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු

1986 වර්ෂය තුළදී මහ බැංකුව විසින් පස් වැනි ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව හම්බන්-තොට දිස්ත්‍රික්කයේ ආරම්භ කරන ලද අතර, එහි ප්‍රධාන කාර්යාලය අම්බලන්තොට පිහිටුවීය. මෙම බැංකුව විවෘත කරන ලද්දේ 1986 දෙසැම්බර් 13 වන දිනය. පිළිවෙලින් බුලත්සිංහල, යටියන, කුලියාපිටිය සහ මිහින්තලේ ප්‍රධාන කාර්යාල සහිතව කළුතර, මාතර, කුරුණෑගල සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ඉකුත් වසරේදී පිහිටුවන ලද ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සතුටු-දායක ලෙස ක්‍රියාත්මක විය.

මුල් අවස්ථාවේදී එක් මැතිවරණ කොට්ඨාශයක යටත් පිරිසෙයින් එක් ශාඛාවක්වත් පිහිටුවීම සෑම ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවකම ඉලක්කය විය. 1986 අවසානය වනවිට ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සිය ශාඛා පද්ධතිය ශාඛා 32 දක්වා ව්‍යාප්ත කළේය. සිය විෂය පථයට අයත් වන ප්‍රදේශවල ගැමි ජන කොටස්වල දියුණුව සඳහා ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් සැළසුම් කරන ලද විවිධ කාර්යයන්හි ප්‍රතිලාභ පුද්ගලයන් රැසකට ලබා ගැනීමට මේ නිසා හැකි විය.

බැංකු ශාඛා පද්ධතිය දිස්ත්‍රික්ක අනුව 2.9 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**2 . 9 සංඛ්‍යා සටහන**

**ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා පද්ධතිය**

| ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවේ නම | ප්‍රධාන කාර්යාලය | විවෘත කරන ලද ශාඛා සංඛ්‍යාව 1985 | 1986 | 1986 වර්ෂය අවසානයට එකතුව |
|---|---|---|---|---|
| කළුතර .. | බුලත්සිංහල .. | 04 | 03 | 07 |
| මාතර .. | යටියන .. | 05 | 02 | 07 |
| කුරුණෑගල .. | කුලියාපිටිය .. | 06 | 04 | 10 |
| අනුරාධපුර .. | මිහින්තලේ .. | 02 | 04 | 06 |
| හම්බන්තොට .. | අම්බලන්තොට .. | — | 02 | 02 |
| එකතුව .. | | 17 | 15 | 32 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

## 2.10 සංඛ්‍යා සටහන

## දිස්ත්‍රික්ක අනුව එක් රැස් කරන ලද තැන්පතු 1985 සහ 1986 අවසානයට

(මුදල රුපියල් දහස් වලින්)

| ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවේ නම | ඉතිරි කිරීම | | | | ස්ථිර | | | | එකතුව | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1985 | | 1986 | | 1985 | | 1986 | | 1985 | | 1986 | |
| | සංඛ්‍යාව | මුදල | සංඛ්‍යාව | මුදල | සංඛ්‍යාව | මුදල | සංඛ්‍යාව | මුදල | සංඛ්‍යාව | මුදල | සංඛ්‍යාව | මුදල |
| කළුතර .. | 2,845 | 728 | 10,295 | 3,389 | 15 | 180 | 94 | 3,446 | 2,860 | 908 | 10,389 | 6,835 |
| මාතර .. | 3,472 | 1,134 | 10,503 | 5,350 | 05 | 51 | 105 | 672 | 3,477 | 1,185 | 10,608 | 6,022 |
| කුරුණෑගල .. | 4,786 | 906 | 13,958 | 4,221 | 10 | 50 | 49 | 446 | 4,796 | 956 | 14,007 | 4,667 |
| අනුරාධපුර .. | 1,382 | 336 | 5,377 | 2,749 | 03 | 29 | 02 | 42 | 1,385 | 365 | 5,379 | 2,791 |
| හම්බන්තොට .. | — | — | 509 | 259 | — | — | 06 | 48 | — | — | 515 | 307 |
| එකතුව .. | 12,485 | 3,104 | 40,642 | 15,968 | 33 | 310 | 256 | 4,654 | 12,518 | 3,414 | 40,898 | 20,622 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

ග්‍රාමීය අංශයේ ඉතිරි කිරීම් එක් රැස් කිරීම ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් කරගෙන ගිය අතර, 1986 දෙසැම්බර් 31 වන දිනට එකී බැංකු වෙත වූ ඉතිරි කිරීමේ සහ ස්ථිර තැන්පතු වෙන් වශයෙන් 2.10 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පහ විසින් 1986 වර්ෂය අවසාන වනවිට ගිණුම් 40,898 ක් අරඹා තිබූ අතර ඒවායේ වූ තැන්පතු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 21 ක් විය. ගිණුම් වලින් සියයට 99 ක්ම ඉතිරි කිරීමේ තැන්පතු ගිණුම් විය. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ක්‍රියාත්මක වූ මුල් පූර්ණ වසර වන 1986 දී තැන්පතු ගිණුම් සංඛ්‍යාවද රැස් කර ගත් තැන්පතු ප්‍රමාණයද වැඩි වූ අතර, ඊට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ශාඛා පද්ධතිය 17 සිට 32 දක්වා වැඩි වීමය. ප්‍රදේශයේ පුද්ගලයන්ගෙන් සුළු ඉතිරි කිරීම් වශයෙන් විශාල තැන්පතු ප්‍රමාණයක් එක් රැස් කර ගැනීමට ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු යත්න දැරීය. එබැවින්, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල බැංකු කටයුතු ක්‍රියාවලියෙහි ලක්ෂණයක් වන්නේ තැන්පතුවල, විශේෂයෙන් ඉතිරිකිරීම් තැන්පතුවල ප්‍රමාණය 2.11 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි සාපේක්ෂ වශයෙන් කුඩා වීමය.

**2 . 11 සංඛ්‍යා සටහන**

**තැන්පතු ගිණුමක සාමාන්‍ය ප්‍රමාණය**

රුපියල්

| ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවේ නම | ඉතිරි කිරීමේ තැන්පතු | | ස්ථිර තැන්පතු | |
|---|---|---|---|---|
| | 1985 | 1986 | 1985 | 1986 |
| කළුතර | 255 | 329 | 12,033 | 36,660 |
| මාතර | 326 | 509 | 10,200 | 6,403 |
| කුරුණෑගල | 189 | 302 | 5,000 | 9,102 |
| අනුරාධපුර | 243 | 511 | 9,583 | 20,925 |
| හම්බන්තොට | — | 509 | — | 7,917 |
| සියළුම බැංකු | 248 | 393 | 9,401 | 18,179 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

අනුග්‍රාහකයනට පූර්ණ බැංකු පහසුකම් සැළසීමේ සිය ප්‍රතිපත්තියේ එක් අංගයක් වශයෙන් ඇතැම් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් ඉල්ලුම් තැන්පතු භාර ගැනීමද අරඹා ඇත.

1985 වර්ෂය අවසාන වනවිට 1,104 ක් වූ ණය මුදල් සංඛ්‍යාව වෙනුවෙන් දී තිබූ රුපියල් දශ ලක්ෂ 4 ක මුළු ණය මුදල් ප්‍රමාණය සමඟ සසඳන කල 1986 වර්ෂය තුළදී ණය මුදල් 7,273ක් සඳහා රුපියල් දශ ලක්ෂ 47 ක මුළු මුදලක් දී තිබිණි. 1986 වර්ෂයේදී ණය මුදල් සංඛ්‍යාව මෙන්ම දෙන ලද ණය ප්‍රමාණය ද සැළකිය යුතු ලෙස වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, බැංකු ශාඛා කාර්යාල විවෘත කිරීම නිසා වඩා විශාල ප්‍රදේශයක් තුළ බැංකු කටයුතු ව්‍යාප්ත වීමය.

ප්‍රා. ග්‍රා. සං. බැංකු විසින් දෙන ලද ණය මුදල්වල කාර්යයන් අනුව වර්ගීකරණය සහ 1986 දෙසැම්බර් 31 වැනි දිනට නොබේරා ඇති ණය ප්‍රමාණය 2 . 12 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ.

## 2 . 12 සංඛ්‍යා සටහන

### එක් එක් දිස්ත්‍රික්කය අනුව නොපියවා ඇති ණය මුදල් කාර්යය අනුව වර්ගීකරණය

(මුදල රුපියල් දහස්වලින්)

| කාර්යය | කළුතර | | මාතර | | කුරුණෑගල | | අනුරාධපුරය | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | මුදල | සංඛ්‍යාව | මුදල | සංඛ්‍යාව | මුදල | සංඛ්‍යාව | මුදල |
| 1. කෘෂිකර්මය | | | | | | | | |
| 1.1 වගා කටයුතු .. | 279 | 232 | 820 | 1,210 | 488 | 3,283 | 393 | 2,286 |
| 1.2 ගොවි උපකරණ .. | 29 | 252 | 90 | 2,292 | 142 | 1,300 | 166 | 5,617 |
| 1.3 වෙනත් .. | 261 | 561 | 295 | 657 | 273 | 1,404 | 182 | 1,526 |
| 2. පශු සම්පත් .. | 151 | 615 | 49 | 393 | 318 | 2,655 | 75 | 874 |
| 3. කුඩා කර්මාන්ත .. | 527 | 1,575 | 352 | 1,280 | 355 | 2,529 | 94 | 1,796 |
| 4. වෙළෙඳ හා ව්‍යාපාර කටයුතු .. | 616 | 1,680 | 519 | 1,706 | 216 | 2,116 | 73 | 7,113 |
| 5. වෙනත් .. | 64 | 306 | 376 | 789 | 8 | 73 | 62 | 194 |
| එකතුව .. | 1,927 | 5,221 | 2,501 | 9,027 | 1,800 | 13,360 | 1,045 | 19,406 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1985 වර්ෂය අවසානයට සහ 1986 වර්ෂය අවසානයට කාර්යයන් අනුව දෙන ලද ණය මුදල් හා නොබේරා ඇති ප්‍රමාණයන් පිළිබඳව සංසන්දනයක් 2 . 13 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

## 2 . 13 සංඛ්‍යා සටහන

### 1985 හා 1986 වර්ෂවල දෙන ලද ණය මුදල් කාර්යයන් අනුව සංසන්දනය

| කාර්යය | 1985 | | | 1986 | | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | මුදල රු. දහස් | සියයට ගණන | සංඛ්‍යාව | මුදල රු. දහස් | සියයට ගණන |
| කෘෂිකර්මය .. | 395 | 2,027 | 42 | 3,418 | 21,321 | 45 |
| පශු සම්පත් .. | 77 | 554 | 11 | 593 | 4,536 | 10 |
| කුඩා කර්මාන්ත .. | 257 | 999 | 21 | 1,328 | 7,180 | 15 |
| වෙළෙඳ හා ව්‍යාපාර කටයුතු .. | 287 | 790 | 16 | 1,424 | 12,615 | 27 |
| වෙනත් .. | 88 | 478 | 10 | 510 | 1,362 | 3 |
| එකතුව .. | 1,104 | 4,848 | 100 | 7,273 | 47,014 | 100 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

ග්‍රාමීය ප්‍රදේශවල ස්වයංරැකියා අවස්ථා ඇතිකර ලීමේ අදහසින්, කෘෂිකාර්මික අංශයේ කුඩා ගොවිපළ හිමියන්ටත් වෙළඳ හා ව්‍යාපාර අංශයේ කුඩා ව්‍යවසායකයින්ටත් ණය දීම කෙරෙහි ප්‍රා. ග්‍රා. සං. බැංකු වැඩි කැමැත්තක් දක්වීය. එබැවින්, 1986 වර්ෂය අවසානයට දෙන ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 45 ක් සහ 27 ක් පිළිවෙළින් කෘෂිකර්මය, වෙළෙඳ හා ව්‍යාපාර අංශයනට විය.

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සිය පරමාර්ථයන් අනුව කටයුතු මෙහෙය වීමේදී නව පන්නයේ ඇතැම් බැංකු ක්‍රම කිහිපයක් අනුගමනය කර ඇත. වර්ෂය තුළදී සෑම ප්‍රා. ග්‍රා. සං. බැංකු ශාඛාවක්ම වාගේ සිය බල ප්‍රදේශයට අයත් ගම්වලදී රැස්වීම් (ජනහමුව) සංවිධානය කොට ඇත. මෙම රැස්වීම්වල අරමුණ වූයේ, ග්‍රාමීය ආර්ථික සංවර්ධනයෙහි ලා ප්‍රා. ග්‍රා. සං. බැංකු ක්‍රමයේ පරමාර්ථ සහ එහි කාර්ය භාරය ජනතාවට පැහැදිලි කර දීමය. මෙම රැස්වීම්වල ප්‍රතිඵලයක් වශයෙන් විශාල ජන සමූහයකට ණය ලබා ගැනීමට හැකි විය. රැස්වීම්වලදීම තැන්පතු ලබා ගැනීමට බැංකු උත්සාහ දැරූ අතර, පසුව තැන්පතුකරුවනට ඔවුන්ගේ පාස් පොත් නිවසට ගෙන ගොස් බාර දීමට කටයුතු සළස්වන ලදී. මේ හැරුණ විට, බැංකු කටයුතු නිතිපතා පවත්වාගෙන නොයන ප්‍රදේශවල බැංකු පහසුකම් අවශ්‍ය ජනතාව උදෙසා ''ජංගම බැංකු සේවාවක්'' පවත්වාගෙන යාමද ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් ක්‍රියාත්මක කරන ලදී.

## ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය

1986 වර්ෂය තුළදී ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය විසින් පුහුණු පාඨමාලා හා සම්මන්ත්‍රණ 23 ක් පවත්වන ලද අතර, පුද්ගලයින් 442 දෙනෙක් ඒවාට සහභාගී වූහ. මහ බැංකුව, වාණිජ බැංකු, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු, වෙනත් මූල්‍ය ආයතන සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, යොවන කටයුතු හා රැකීරක්ෂා අමාත්‍යාංශය, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා කාර්මික සංවර්ධන මණ්ඩලය වැනි ග්‍රාමීය සංවර්ධනයෙහි නියැලි රජයේ ආයතන කිහිපයක ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්ගේ සිට ජ්‍යෙෂ්ඨ විධායකයින් දක්වා නිලධාරි කණ්ඩායම් මෙම පුහුණු පාඨමාලා සහ සම්මන්ත්‍රණවලට සහභාගි වූහ. බැංකු කටයුතු අංශය පිළිබඳව අභ්‍යාස විද්‍යාලය විසින් සැළසූ පාඨමාලා ග්‍රාමීය බැංකු කටයුතුවල සිට ජාත්‍යන්තර බැංකු කටයුතු දක්වා පුළුල් විය. ග්‍රාමීය බැංකු කටයුතු සහ ග්‍රාමීය සංවර්ධනය, පුහුණු පාඨමාලාවලදී ප්‍රමුඛත්වයක් දිය යුතු අංශ ලෙස සැළකිණ. ග්‍රාමීය ණය ප්‍රතිපත්ති සහ පරිචය, ග්‍රාමීය බැංකු කටයුතුවලදී සමුපකාර සමිතිවල ක්‍රියා භාරය, ග්‍රාමීය සංවර්ධන ගැටළු, සුළු ගොවි කටයුතු සඳහා ණය සහ ප්‍රාදේශීය බැංකු කටයුතු වැනි ග්‍රාමීය බැංකු කටයුතු හා ග්‍රාමීය ණය පිළිබඳ පාඨමාලා බොහෝ ගණනක් පවත්වන ලදී.

පිට පළාත්වලද පුහුණු වැඩසටහන් පවත්වන ලදී. ඉන්දියාවේ පූනාහි පිහිටි කෘෂිකාර්මික බැංකු කටයුතු පිළිබඳ ජාත්‍යන්තර සහයෝගිතා හා පුහුණු මධ්‍යස්ථානය විසින් කරන ලද ඉල්ලීමක ප්‍රතිඵලයක් වශයෙන් එම ආයතනයේ වැඩමුළුවක් ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ සහාය ඇතිව මහ බැංකුව විසින් පවත්වන ලදී. මෙම වැඩ මුළුවේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ ග්‍රාමීය බැංකු කටයුතුවල නියැලි පුද්ගලයින් සඳහා ඇති පුහුණු කිරීමේ වැඩ පිළිවෙලවල් වැඩි දියුණු කිරීම පිණිස සාමාජික රටවල්වල ඇති ග්‍රාමීය බැංකු කටයුතු සහ ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්ති හා වැඩසටහන් පිළිබඳව අධ්‍යයනයක් කිරීමය.

1986 සැප්තැම්බර් මාසයේදී විද්‍යාලයට වර්ෂ පහක් සම්පූර්ණ විය. ' ග්‍රාමීය සංවර්ධනයෙහි ලා බැංකුවල කාර්ය භාරය ' යන මැයෙන් ඉන්දියානු රිසර්ව් බැංකුවේ අධිපති ආර්. එන්. මල්හොත්‍රා මහතා විසින් පස් වැනි සංවත්සරික දේශනය පවත්වන ලදී. මෙම සංවත්සරික දේශනය සඳහා බැංකු සහ මූල්‍ය ආයතනවල ආරාධිත විධායක නිලධාරීන් පිරිසක් සහභාගි විය.

1981 සැප්තැම්බර් මාසයේදී විද්‍යාලය ඇරඹූ අවස්ථාවේ සිට එය පවත්වාගෙන යන ලද්දේ සීමිත ඉඩකඩ ප්‍රමාණයක් ඇති කොළඹ කුලී ගොඩනැගිල්ලකය. බැංකු කටයුතු ග්‍රාමීය ප්‍රදේශවල ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීමද, දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බැංකු කටයුතු බෙහෙවින් නවීකරණය වීමද, බැංකු කටයුතු ක්ෂේත්‍රයේ තරඟකාරී බව වැඩි වීමද, වඩාත් ක්‍රමවත් ආකාරයකට පුහුණු කටයුතු නොකඩවා පවත්වාගෙන යාමේ හදිසි අවශ්‍යතාවය වැඩි කරලීමට හේතු විය. මෙකී අවශ්‍යතාවයන් නිසා පුහුණු කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය නවීන පහසුකම් වලින් සමන්විත අංග සම්පූර්ණ නේවාසික මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයක් ඉදි කිරීම අත්‍යවශ්‍ය විය. කෝට්ටේ,

රාජගිරියේ, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ අංක 58 දරණ ස්ථානයේ පිහිටි ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ නව ගොඩනැගිලි සංකීර්ණය 1986 දෙසැම්බර් 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති, අතිගරු ජේ. ආර්. ජයවර්ධන උතුමාණන් විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. මෙම නව පරිශ්‍රයේ සහභාගි වන්නවුන් 60 දෙනෙකුට නේවාසික පහසුකම් ඇත. පංති කාමර හා දේශනශාලා හැරුණවිට විද්‍යාලයේ නව ගොඩනැගිල්ල ඉඩකඩ සහිත සම්මන්ත්‍රණ ශාලාවකින්, දේශනාගාරයකින් සහ අංග සම්පූර්ණ පුස්තකාලයකින් සමන්විතය.

## සේවක අර්ථසාධක අරමුදල්

සේවක අර්ථසාධක අරමුදලේ දායක දීමනා, අධිභාර මුදල් ලබාගැනීම හා අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ආදායම් ලබා ගැනීම, අරමුදලේ ලියාපදිංචි සේව්‍යයන්ගේ හා කේවල සාමාජික ගිණුම් ක්‍රමානුකූල ලෙස පවත්වාගෙන යාම සහ සේ. අ. අ. පනතේ විධිවිධානයන් ප්‍රකාර, ප්‍රතිලාභ මුදල් සාමාජිකයන් වෙත ආපසු ගෙවීමේ වගකීම ද මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දරනු ලබයි. මෙම කටයුතු බැංකුවේ සේවක අර්ථ සාධක අරමුදල් දෙපාර්තමේන්තුව මගින් කරනු ලබන අතර කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශය සමග ද කිට්ටු සහයෝගිතාවයකින් ක්‍රියා කරනු ලැබේ. පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනමය කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව විසින් කරනු ලබයි.

### දායක මුදල්

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ දී අරමුදලට ලැබුණු දායක දීමනා ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,047.9 ක් වූ අතර, 1985 වර්ෂයේ එය, රුපියල් දශ ලක්ෂ 1 ,920.6 ක් විය. මෙය කලින් වර්ෂය තුළ ලැබුණු දායක මුදල් මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 127.3 ක නැතහොත් සියයට 6.6 ක වැඩිවීමකි.

### සාමාජිකයින්ගේ ශේෂ

සමාලෝචනයට අදාළ වර්ෂයට පොළී වෙන් කිරීමට පෙර, 1986 දෙසැම්බර් 31 දිනට සාමාජිකයින්ගේ ශේෂයන් රුපියල් දශ ලක්ෂ 16,402.1 ක්ව පැවති අතර, එය 1985 වර්ෂය අවසානයට වඩා රුපියල් දශ ලක්ෂ 3,315.4 ක නැතහොත් සියයට 25.3 ක වැඩිවීමකි.

### ආයෝජන

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී අරමුදල විසින් රජයේ සුරකුම්පත් සහ භාණ්ඩාගාර බිල්පත්වල රුපියල් දශ ලක්ෂ 6,138.0 ක මුදලක් ආයෝජනය කරන ලද අතර, එය 1985 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 5,401.9 ක් විය. මෙය, 1985 වර්ෂයේ මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 736.1 ක වැඩිවීමකි. 1986 වර්ෂය තුළ කරනු ලැබූ මුළු ආයෝජන ප්‍රමාණයට, කලින් කරනු ලැබූ ආයෝජන හා භාණ්ඩාගාර බිල්පත්වල කල්පිරුණු ප්‍රේෂණ ඵලයන් නියෝජනය කෙරෙන රුපියල් දශ ලක්ෂ 2,471.4 ක මුදලක් ද ඇතුළත් විය. රජයේ සුරකුම්පත්වල පමණක් ආයෝජනය කරනු ලැබූ මුදල රුපියල් දශ ලක්ෂ 5,117.9 ක් විය. මෙය රජය විසින් 1986 වර්ෂය තුළදී නිකුත් කරනු ලැබූ මුළු සුරකුම්පත් ප්‍රමාණයෙන් සියයට 65. 8 ක මුදලක් නියෝජනය කරයි. වර්ෂය තුළදී විටින් විට කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරනු ලැබූ මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,020.0 ක් විය. වර්ෂය තුළ දී වට්ටම් කරනු ලැබීම නිසා, සමාලෝචනයට භාජනය වූ වර්ෂය අවසානයේදී කිසිදු භාණ්ඩාගාර බිල්පතක් අරමුදල සතුව නොතිබිණ. 1986 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් කර තිබූ මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 17,718.6 කි. මෙය, 1985 වර්ෂයේ මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 3,666.6 ක වැඩිවීමකි.

### ආයෝජනයන්ගෙන් ලැබූ ආදායම

1986 වර්ෂයේදී අරමුදලේ ආයෝජනයන්ගෙන් ලැබූ ආදායම රුපියල් දශ ලක්ෂ 1,953.5 ක් වූ අතර, 1985 වර්ෂයේ එය, රුපියල් දශ ලක්ෂ 1,552.4 ක් විය. රුපියල් දශ ලක්ෂ 401.1 ක නැතහොත් සියයට 25.8 ක වර්ධනයක් මෙයින් පෙන්නුම් කෙරේ. මෙම වැඩිවීමට ප්‍රධාන හේතුන් වූයේ අරමුදල වෙත ලැබුණු දායක මුදල් ප්‍රමාණයේ වැඩිවීම නිසා කරනු ලැබූ ආයෝජන සහ පැවති ආයෝජන වලින් ලැබුණු ආදායම සමාලෝචන වර්ෂය තුළදී, ප්‍රතිආයෝජනය කිරීමද වේ.

### ප්‍රතිලාභ ගෙවීම්

1986 වර්ෂය තුළදී සාමාජිකයින් වෙත, සේ. අ. අ. ප්‍රතිලාභ වශයෙන් ගෙවන ලද මුදල රුපියල් දශ ලක්ෂ 352.7 ක්වූ අතර, 1985 වර්ෂයේ එය, රුපියල් දශ ලක්ෂ 523.6 ක් විය. මෙය රුපියල් දශ ලක්ෂ 170.9 ක නැතහොත් සියයට 32.6 ක අඩුවීමක් පෙන්නුම් කරයි. සමාලෝචන වර්ෂය තුළ මෙම දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිලාභ ආපසු ලබා ගැනීම සඳහා ලැබුණු හිමිකම්පෑම් සංඛ්‍යාව 33,412 ක් විය. මෙයට, ඉන්දියානු සම්භවය ලත් පෙරලා සිය රට යන්නවුන්ගේ හිමිකම්පෑම් 898 ක් සහ වෛද්‍ය හේතු මත කරනු ලැබූ හිමිකම්පෑම් 1,623 ක් ඇතුළත් විය. 1986 වර්ෂය තුළදී වෛද්‍ය හේතුන් මත ගෙවනු ලැබූ හිමිකම්පෑම් සංඛ්‍යාව සැලෙන ප්‍රමාණයකින් අඩුවී ඇත.

### සාමාජිකයින්ගේ ශේෂයන් මත පොලිය

සේවක අර්ථ සාධක අරමුදල විසින් සෑම වර්ෂයකම අවසානයේ ඇති සාමාජික ශේෂයන් මත, අරමුදලේ ආයෝජන වලින් ලැබෙන ආදායමෙන් පොළී ගෙවිය යුතු වේ. 1986 වර්ෂය අවසානයට සාමාජිකයන්ගේ ශේෂයන් මත ගෙවිය යුතු පොළී අනුපාතිකය, කලින් වර්ෂයේ පැවති සියයට 12.5 වශයෙන් නොවෙනස්ව පැවතිණි. වර්ෂය අවසානයේ සාමාජිකයින්ගේ බැරට ඇති ශේෂයන් මත පොළිය ගෙවනු ලබන අතර, ඊට පසුව එක්වන මුදලට ද පොළිය රාශිකෘත වේ. අනතුරුව, වර්ෂය අවසානයේ සාමාජිකයාගේ බැරට පවතින ශේෂය මත මුළු අවුරුද්දටම පොළී ගෙවන අතර, එම ශේෂයෙන් වර්තන වර්ෂයේ දායක දීමනා නියෝජනය කෙරෙන කිසියම් කොටසක් සාමාජිකයාගේ බැරට ලැබුණු දිනය සැළකිල්ලට නොගැනේ.

### සේ. අ. අ. ගිණුම් පොත්වල ශේෂයන් සටහන් කිරීම

කම්කරු දෙපාර්තමේන්තුව විසින් මෑත කාලයේදී නිකුත් කරනු ලැබූ සේ. අ. අ. ගිණුම් පොත්වල ශේෂයන් ඇතුළත් කිරීම 1986 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී ඇරඹිණි. එනමුත්, කලින් වර්ෂවල මෙන්, වර්ෂය අවසානයේ ශේෂ ප්‍රකාශණ නිකුත් කිරීම සුපුරුදු පරිදි කරගෙන යන ලදී. අරමුදලේ මෙහෙයවුම් කටයුතු පිළිබඳව දැනට ඇති දත්තයන් මත සැකසුනු සංසන්දනාත්මක ප්‍රකාශයක් 2.14 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

## විනිමය පාලන

විනිමය පාලනය ක්‍රියාත්මක කිරීම පිළිබඳව රජයේ නියෝජිතයා වශයෙන් අඛණ්ඩව ක්‍රියාත්මක වූ මහ බැංකුව විමර්ශනයට අදළ වර්ෂය තුළදී විනිමය පාලන ක්‍රියා පිළිවෙතෙහි පහත දක්වෙන වෙනස්කම් සිදු කරන ලදී.

## 2 . 14 සංඛ්‍යා සටහන

## සේ. අ. අ. සංඛ්‍යාන 1985 - 1986

| ශීර්ෂය | 1985 | 1986 |
|---|---|---|
| 1. ලැබුණු දයක දීමනා (රුපියල් දහස්) .. | 19,20,653(අ) | 20,47,962(අ) |
| 2. ආයෝජන (රුපියල් දහස්) .. | 54,01,865(ආ) | 61,37,982(ආ) |
| 3 ආයෝජන වලින් ලද ආදයම (රුපියල් දහස්) .. | 15,52,425 | 19,53,489 |
| 4. ප්‍රතිලාභ ගෙවීම් (රුපියල් දහස්) .. | 5,23,629 | 3,52,709 |
| 5. ප්‍රතිලාභ ගෙවීම් සංඛ්‍යාව .. | 46,123 | 25,219 |
| 6. පොළී අනුපාතිකය (සියයට) .. | 12·5 | 12·5 |
| 7. සාමාජික ශේෂයන් මත පොළී ප්‍රතිපාදන (රුපියල් දහස්) .. | 16,35,834 | 20,50,259 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) අවිනිශ්චිත ගිණුම්වලට බැර කළ දයක මුදල් හැර

(ආ) රජයේ සුරැකුම්පත්වල ප්‍රති ආයෝජනය කරන ලද කල්පිරුණු ප්‍රේෂණ ඵලයන් හා කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ මුදල් ද ඇතුළුව.

**1. ආනයන :**

යම් පුද්ගලයකු විසින් සිය පෞද්ගලික භාවිතය සඳහා ණයවර ලිපියක් විවෘත කිරීමකින් තොරව ආනයනය කරනු ලබන (වාණිජමය ප්‍රමාණයන් නොවන) භාණ්ඩවල සීමාව කොළඹට මී. ර. ගැ. වටිනාකම රු. 5,000 සිට කොළඹට මී. ර. ගැ. වටිනාකම එ. ජ. ඩොලර් 500 තෙක් වැඩි කරන ලදී. (1986.03.27 දින හා අංක ඊසී/13/86(බී) දරන මෙහෙයවුම් උපදෙස්).

**2. අධ්‍යාපනය :**

එතෙර අධ්‍යාපනය තවදුරටත් කරගෙන යනු ලබන ශ්‍රී ලාංකිකයනගේ ජීවන වියදම් සඳහා පහත දක්වෙන වැඩි විනිමය දීමනාවන් මුදා හැරීම සඳහා බලය ලත් වෙළෙඳුනට අවසර දෙන ලදී (1986.08.26 දින හා අංක ඊසී 26/86 (ඊ) දරණ මෙහෙයවුම් උපදෙස්).

| | රටවල් කාණ්ඩය | ජීවන වියදම්: උපාධි අපේක්ෂක, වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපනය | පශ්චාත් උපාධි අධ්‍යාපනය |
|---|---|---|---|
| (අ) | බංගලාදේශය, භූතානය, බුරුමය, ඉන්දියාව, මාලදිවයින්, නේපාලය හා පකිස්ථානය | වර්ෂයකට ඉන්දියානු රු. 8,640 | වර්ෂයකට ඉන්දියානු රු. 11,520 |
| (ආ) | එක්සත් රාජධානිය හා එක්සත් සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව ඇතුළු යුරෝපය | වර්ෂයකට ස්ටර්ලිං පවුම් 3,120 | වර්ෂයකට ස්ටර්ලිං පවුම් 3,840 |
| (ඇ) | ඕස්ට්‍රේලියාව, කැනඩාව, ජපානය, නවසීලන්තය හා ඇමෙරිකානු එක්සත් ජනපදය | වර්ෂයකට එ. ජ. ඩො. 7,200 | වර්ෂයකට එ. ජ. ඩො. 8,640 |
| (ඈ) | අනෙකුත් සියළුම රටවල් | වර්ෂයකට එ. ජ. ඩො. 4,320 | වර්ෂයකට එ. ජ. ඩො. 5,760 |

**3. සංචාරක චෙක්පත් මුදල්වලට පරිවර්තනය කිරීම :**

රු. 1,00,000 කට වැඩි වටිනාකමක් ඇති සංචාරක චෙක්පත් කවර හෝ එක් දිනකදී මුදල් බවට පරිවර්තනය කිරීම සඳහා විනිමය පාලන අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාව 1986.12.16 දින හා අංක ඊසී/39/86(ඩී) දරන මෙහෙයවුම් උපදෙස් මගින් ඉවත් කර ගන්නා ලදී.

## රාජ්‍ය ණය

මුදල් නීති පණතේ 113 වැනි වගන්තිය ප්‍රකාර, රජය වෙනුවෙන් රාජ්‍ය ණය පරිපාලනය තවදුරටත් බැංකුව විසින් කරගෙන යනු ලැබිය. රජයේ සුරැකුම්පත්/ණය නිකුත් කොට පවත්වාගෙන යාම, භාණ්ඩාගාර බිල්පත් හා බදු සංචිත සහතික නිකුත් කිරීම සහ විදේශ ණය පිළිබඳව වාර්තා පවත්වාගෙන යාම බැංකුව මගින් 1986 වසරේදී ඉටු කළ ප්‍රධාන කාර්යයන් විය.

1986 අවසානයට නොපියවා තිබූ දළ හා ශුද්ධ රාජ්‍ය ණය ප්‍රමාණ පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 1,56,292.7 ක් හා රුපියල් දශ ලක්ෂ 1,49,863.6 ක් විය. 1986 වසර තුළදී රුපියල් දශ ලක්ෂ 7,776.4 ක රුපියල් ණය නිකුත් කරන ලදී. 1986 වර්ෂය තුළදී බේරීමට තිබූ රුපියල් ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 5,216.8 ක් වූ අතර, වසර අවසානය වනවිට බේරීමට තිබූ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 39,128.8 ක් විය. 1986 වසර තුළදී, භාණ්ඩාගාර බිල්පත් සඳහා අනුදත් සීමාව රුපියල් දශ ලක්ෂ 25,000 සිට රුපියල් දශ ලක්ෂ 35,000 දක්වා වැඩි කරන ලදී. වසර අවසානය වනවිට නොපියවා ඇති භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 26,172.6 ක් විය. මහජනතාව තුළ භාණ්ඩාගාර බිල්පත් ජනප්‍රිය කරවීමේ අරමුණ ඇතිව, රාජ්‍ය භාණ්ඩාගාර බිල්පත් සතිපතා නිකුත් කිරීම 1986 නොවැම්බර් මාසයේ සිට බැංකුව විසින් ආරම්භ කරන ලදී. ඒ අනුව බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල මගින් ඒවා අලෙවි කිරීමට කටයුතු කරන ලදී. වසර තුළදී ලබා ගත් මැදි හා දිගු කාලීන විදේශීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 12,060.8 ක් වූ අතර ඉන් ආපසු ගෙවූ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,024.4 ක් විය. 1986 දී රාජ්‍ය විදේශීය ණය සම්බන්ධයෙන් පොළී වශයෙන් හා අනෙකුත් ගාස්තු සඳහා ගෙවන ලද මුළු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,134.6 ක් විය. ඒ අනුව 1986 අවසානය වනවිට ගෙවීමට ඉතිරි වී තිබූ මුළු රාජ්‍ය විදේශීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 86,208.3 ක් විය.

නාගරික සංවර්ධන අධිකාරිය, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ණයකර නිකුත් කිරීම හා සේවාකරණයද බැංකුව විසින් තවදුරටත් කරගෙන යන ලදී. ආර්ථිකයේ අතිරික්ත ද්‍රවශීලතාවය අඩු කිරීම සඳහා මුදල් නීති පණතේ 91 (1) (ආ) වගන්තිය යටතේ මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම 1986 වසර තුළදීද බැංකුව විසින් කරගෙන යන ලදී.

ශ්‍රී ලංකාවේ විදේශීය ණය දත්ත පරිගණක යන්ත්‍ර ගත කිරීමට හැකි වනු වස් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් විදේශීය ණය ලේඛනයක් සකස් කොට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ විදේශීය ණය මෙහෙයවුම් ඒකකය වෙත 1986 දී ඉදිරිපත් කරන ලදී. මීට අමතරව එම දත්ත පදනම යාවත්කාලීන කරලනු පිණිස 1986 අවසානය දක්වා වූ විදේශීය ණය දත්ත විදේශීය ණය මෙහෙයවුම් ඒකකය වෙත බාර දෙන ලදී.

## ප්‍රාදේශීය කාර්යාලය–මාතර

1986 වසර තුළදී මාතර ප්‍රාදේශීය කාර්යාලයේ කටයුතු නව අංශ කරා ව්‍යාප්ත කෙරුණු අතර, කරමින් තිබුණු කටයුතු, වඩා හොඳ සේවාවක් ලබා දීම සඳහා දියුණු කරන ලදී. අදාළ ප්‍රාදේශීය නියෝජ්‍යත්වයන් හා රජයේ බලධාරීන් සමග සමීප සම්බන්ධතාවයකින් යුතුව කටයුතු කළ ප්‍රාදේශීය කාර්යාලය, ග්‍රාමීය ණය ක්‍රම හයක් ක්‍රියාත්මක කළාය. විවිධ ග්‍රාමීය ණය ක්‍රම යටතේ, ණය උපයෝගි කර ගැනීමට බලාපොරොත්තු වන්නන්ගේ ව්‍යවසායික කුසලතාවන් වර්ධනය කිරීමේ අරමුණෙන් කෘෂිකර්මය, කිරි හරකුන්, එළුවන් හා කුකුළන් ඇති කිරීම හා සුළු කර්මාන්ත වැනි ක්ෂේත්‍රයන් පිළිබඳව පුහුණු කිරීමේ හා නැඹුරු කිරීමේ පංති රාශියක් පවත්වන ලදී.

### ප්‍රතිමූල්‍ය ණය කටයුතු

මෙම කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලදුව, සහභාගී වන බැංකුවලට ප්‍රතිමූල්‍ය ණය පහසුකම් සලසනු ලැබූ විවිධ ණය ක්‍රමයන්හි ණය කටයුතු පිළිබඳ සංඛ්‍යාත්මක සාරාංශයක් 2.15 වැනි සංඛ්‍යා සටහනින් දැක්වේ.

## 2 . 15 සංඛ්‍යා සටහන

### මාතර ප්‍රාදේශීය කාර්යාලය-ප්‍රතිමූල්‍ය ණය ගණුදෙනු පිළිබඳ සංඛ්‍යාත්මක සාරාංශය

| ණය ක්‍රමය | 1986 වර්ෂය | | 1986 අවසානයට සමුච්චිතය | |
|---|---|---|---|---|
| | ණය මුදල් සංඛ්‍යාව | ප්‍රමාණය (රු.) | ණය මුදල් සංඛ්‍යාව | ප්‍රමාණය (රු.) |
| 1. ස්වයං රැකියා ප්‍රතිමූල්‍ය ණය ක්‍රමය .. | 317 | 16,23,185 | 797 | 70,56,685 |
| 2. ගම් නගා සිටුවීමේ ප්‍රතිමූල්‍ය ණය ක්‍රමය .. | 04 | 26,000 | 116 | 5,92,685 |
| 3. නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ ආදර්ශයාය වී වගා ණය .. | 1,212(අ) | 29,92,526 | 1,212 | 29,92,526 |
| 4. ගොඩ ගොවිතැන් සඳහා ණය .. | 93 | 8,80,520 | 143 | 11,45,925 |
| 5. තේ පොහොර ප්‍රතිමූල්‍ය ණය ක්‍රමය .. | 33 | 1,05,423 | 229 | 13,37,106 |
| 6. පොල් පොහොර ප්‍රතිමූල්‍ය ණය ක්‍රමය .. | 24 | 4,40,431 | 363 | 28,67,048 |
| එකතුව .. | 1,683 | 60,68,085 | 2,860 | 1,59,91,975 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 1985/86 මහ
1986 යල
1986/87 මහ

### ස්වයං රැකියා හා ගම් නගා සිටුවීමේ ණය ක්‍රම – ගාල්ල හා මාතර දිස්ත්‍රික්ක

#### (i) ණය නිර්දේශ

1986 වසර තුළදී ඉහත සඳහන් ණය ක්‍රම දෙක යටතේ සහභාගී වන බැංකු විසින් නිර්දේශ කරනු ලැබූ ණය පිළිබඳ විස්තර 2.16 වැනි සංඛ්‍යා සටහනේ දැක්වේ.

## 2 . 16 සංඛ්‍යා සටහන

### මාතර ප්‍රාදේශීය කාර්යාලය — ස්වයං රැකියා ගම් නගා සිටුවීමේ ක්‍රම යටතේ නිර්දේශිත ණය — 1986

| බැංකුව | ස්වයං රැකියා ක්‍රමය | | ගම් නගා සිටුවීමේ ක්‍රමය | |
|---|---|---|---|---|
| | ව්‍යාපෘති සංඛ්‍යාව | වටිනාකම (රු.) | ව්‍යාපෘති සංඛ්‍යාව | වටිනාකම (රු.) |
| ලංකා බැංකුව .. | 190 | 20,55,685 | — | — |
| මහජන බැංකුව .. | 71 | 4,95,415 | — | 7,000(අ) |
| ඉන්දියානු ඕවර්සීස් බැංකුව .. | 18 | 1,30,250 | 03 | 17,500 |
| ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව .. | 28 | 1,70,050 | — | — |
| එකතුව .. | 307 | 28,51,400 | 03 | 24,500 |

(අ) 2 වැනි ණය මුදල

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1986 වසර තුළදී නිර්දේශ කරන ලද මුළු ණය මුදල් සංඛ්‍යාව 310 ක් වූ අතර, ඊට සම්බන්ධ වූ මුදල රු. 28,75,900 ක් විය. 1986 වසර අවසානයට නිර්දේශිත මුළු ව්‍යාපෘති සංඛ්‍යාව (සමුච්චිත) 1,252 ක් වූ අතර සම්බන්ධ වූ මුදල රු. 1,04,08,591 ක් විය.

### (ii) ණය අනුමත කිරීම්

ස්වයං රැකියා හා ගම් නගා සිටුවීමේ ක්‍රම යටතේ 1986 වසර තුළදී අනුමත කරන ලද ණය මුදල් පිළිබඳ විස්තර 2.17 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

**2 . 17 සංඛ්‍යා සටහන**

**මාතර ප්‍රාදේශීය කාර්යාලය—ස්වයං රැකියා හා ගම් නගා සිටුවීමේ ක්‍රම යටතේ 1986 වසර තුළදී අනුමත කරන ලද ණය මුදල**

| බැංකුව | | ස්වයං රැකියා ක්‍රමය | | ගම් නගා සිටුවීමේ ක්‍රමය | |
|---|---|---|---|---|---|
| | | ව්‍යාපෘති සංඛ්‍යාව | වටිනාකම (රු.) | ව්‍යාපෘති සංඛ්‍යාව | වටිනාකම (රු.) |
| ලංකා බැංකුව | .. | 145 | 14,14,450 | 01 | 5,500 |
| මහජන බැංකුව | .. | 45 | 3,45,615 | — | 3,000(අ) |
| ඉන්දියන් ඕවර්සීස් බැංකුව | .. | 18 | 1,30,250 | 03 | 17,500 |
| ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව | .. | 11 | 65,500 | — | — |
| එකතුව | .. | 219(ආ) | 19,55,815 | 04(ආ) | 26,000 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) දෙවැනි ණය

(ආ) දෙවැනි ණය 10 ක් හා විශේෂ ව්‍යාපෘති ණය 32 ක් ඇතුළත් වේ.

### (iii) ණය ආපසු ගෙවීම්

1986 වසර තුළදී රු. 10,34,167 ක වටිනාකමට වූ ණය මුදල් 85 ක් සම්පූර්ණයෙන්ම ආපසු ගෙවන ලදී. මේ අනුව, සම්පූර්ණයෙන් ආපසු ගෙවා නිම කරන ලද මුළු ණය මුදල් සංඛ්‍යාව 255 ක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1986 අවසානයට සම්පූර්ණයෙන් ආපසු ගෙවා නිම කරන ලද ණය මුදල්වල මුළු වටිනාකම රු. 17,06,457 ක් වූ අතර, එය අනුමත කළ මුළු ණය ප්‍රමාණයෙන් සියයට 22 ක් නියෝජනය කළේය.

ස්වයං රැකියා හා ගම් නගා සිටුවීමේ ක්‍රම යටතේ ණය අනුමත කිරීම්, අංශ අනුව වර්ග කොට 2.18 වැනි සංඛ්‍යා සටහනින් දැක්වේ.

**2 . 18 සංඛ්‍යා සටහන**

**මාතර ප්‍රාදේශීය කාර්යාලය—ණය අනුමත කිරීම් අංශ අනුව වර්ගීකරනය**

| අංශය | | ව්‍යාපෘති සංඛ්‍යාව | | ණය මුදල (රුපියල්) | |
|---|---|---|---|---|---|
| | | 1986 වර්ෂය | 1986 අවසානය දක්වා (සමුච්චිත) | 1986 වර්ෂය | 1986 අවසානය දක්වා (සමුච්චිත) |
| කෘෂිකර්මය | .. | 64 | 267 | 6,49,715 | 18,90,850 |
| කර්මාන්ත | .. | 104 | 438 | 10,20,680 | 26,42,075 |
| සේවා, ගොවිපළ බල ආදිය | .. | 55 | 208 | 3,11,420 | 31,39,445 |
| එකතුව | .. | 223 | 913 | 19,81,815 | 76,75,370 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

වැඩිම ණය මුදල් සංඛ්‍යාව යොමු කෙරුණේ කර්මාන්ත අංශයටය. කෘෂිකර්මාන්ත හා සේවා අංශවලට පිළිවෙලින් දෙවැනි හා තෙවැනි තැන් හිමි විය.

එක් ව්‍යාපෘතියකට අයත් වූ සාමාන්‍ය ණය ප්‍රමාණය රු. 6,000–7,000 සීමාවේ වූ අතර, ණය පහසුකම් වැඩි වශයෙන්ම සලසන ලද්දේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයනටය. රුපියල් දශ ලක්ෂ 7.6 ක් වූ මුළු ණය ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 2.6 ක් හෙවත් සියයට 34.0 ක් කර්මාන්ත කටයුතුවලට දෙන ලදී. වැඩිම කොටස වූ සියයට 41.0 සේවා හා ගොවිපළ බල අංශයට දෙනු ලැබිණි.

**නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ වී වගා ණය**

නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය ක්‍රියාත්මක වූ ද සිට ගොවි කණ්ඩායම් සංවිධානය කිරීම හා ඉන්පසුව, ණය පහසුකම් සඳහා සහභාගි වන බැංකුව වෙත යොමු කිරීම ආදී වශයෙන් විශේෂ ක්‍රියාදමයක් ඉටු කිරීමට ප්‍රාදේශීය කාර්යාලයට සිදු විය. ප්‍රාදේශීය කාර්යාලය කෘෂි රක්ෂණ මණ්ඩලයේ නිලධාරීන්ද සමඟ වී වැපිරීමේ පටන් අස්වැන්න නෙලා ගන්නා කාලය තෙක්ම වගා කටයුතු පිළිබඳව සමීප සෝදිසියකින් යුතුව කටයුතු කළාය. 1985/86 මහ කන්නයේ ණය ආපසු ගෙවීමේ අනුපාතිකය සියයට 90 ක් පමණ වූ අතර, 1986 යල කන්නය සඳහා එකී අනුපාතිකය සියයට 95 ක් විය. ගොවීන් සමඟ කිට්ටු සම්බන්ධතාවයක් ඇති කර ගැනීමටත්, වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හැකියාව ඇති කිරීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වයන් නංවාලීමටත්, උත්සාහ ගැනීම මෙම ණය ක්‍රමයේ වඩාත් උද්යෝගකාරී ලක්ෂණය විය. ඒ ඒ කන්නය තුළදී මැතිවරණ කොට්ඨාශ අනුව වී වගා ණය බෙදී ගිය අයුරු 2.19 වැනි සංඛ්‍යා සටහනේ දක්වේ.

**2 . 19 සංඛ්‍යා සටහන**

**මාතර ප්‍රාදේශීය කාර්යාලය – ආදර්ශ යාය ණය – ක්‍රියාකාරිත්වය**

| මැතිවරණ කොට්ඨාශය | 1985/86 මහ (අ) | | | 1986 යල (ආ) | | | 1986/87 මහ (ඇ) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අක්කර ගණන | ගොවීන් ගණන | අනුමත කළ ණය (රුපියල්) | අක්කර ගණන | ගොවීන් ගණන | අනුමත කළ ණය (රුපියල්) | අක්කර ගණන | ගොවීන් ගණන | අනුමත කළ ණය (රුපියල්) |
| මාතර | 13 | 11 | 20,000 | 39 | 24 | 74,300 | ලැ.නො. | — | — |
| අකුරැස්ස | 362 | 160 | 5,42,600 | 217 | 138 | 1,51,600 | ලැ.නො. | 73 | 1,08,523 |
| හක්මන | 77 | 67 | 1,08,500 | 55 | 53 | 80,000 | ලැ.නො. | 57 | 86,224 |
| කඹුරුපිටිය | 584 | 285 | 9,28,400 | 302 | 143 | 3,11,800 | ලැ.නො. | 39 | 1,03,334 |
| දෙවිනුවර | 88 | 46 | 1,30,200 | 20 | 11 | 35,900 | ලැ.නො. | 10 | 19,545 |
| වැලිගම | 49 | 28 | 86,200 | 73 | 42 | 1,26,600 | ලැ.නො. | — | — |
| හම්බන්තොට | 17 | 07 | 40,000 | — | — | — | ලැ.නො. | — | — |
| මොණරාගල | 24 | 18 | 38,800 | — | — | — | ලැ.නො. | — | — |
| එකතුව | 1,214 | 622 | 18,94,700 | 706 | 411 | 7,80,200 | ලැ.නො. | 179 | 3,17,626 |

(අ) යාය 23
(ආ) යාය 18
(ඇ) යාය 12

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

ණය ක්‍රමයේ මූලික ක්‍රියාත්මක අවස්ථාවන්හිදී ලත් උනන්දුව හීන කරන සුළු අත්දැකීම් නිසා සාමූහික ණය පහසුකම් සඳහා යෙදවුණු යාය සංඛ්‍යාව අඩු වූ බවත්, ගොවීන් බැංකු වලින් කෙලින්ම ණය ලබා ගැනීම කරගෙන ගිය බවත් 2.19 වැනි සංඛ්‍යා සටහනින් පැහැදිලි වෙයි. තම පාලනයෙන් බැහැර හේතුන් නිසා ණය ප්‍රතිලේඛනගත කරනු ලැබීමට හිමිකම් ලබන ණය ගනුවන් හඳුනා ගැනීම සඳහා ප්‍රාදේශීය කාර්යාලය විසින් 1986 දී ප්‍රතිමූල්‍යා දීර්ඝ කිරීමේ රැස්වීම් හතක් පවත්වන ලදී.

**ගොඩ ගොවිතැන**

මෙම කටයුතු හම්බන්තොට හා මොනරාගල යන දිස්ත්‍රික්කවලට පමණක් සීමා කොට ඇත. ඊට ප්‍රධාන හේතුව නම් එම ප්‍රදේශවල ඊට ගැලපෙන තත්ත්වයන්ම තිබීමය. මොනරාගල දිස්ත්‍රික්කයේ බුත්තල හා වැල්ලවාය ප්‍රදේශවල ගොවීන්ට සාමාන්‍ය ළිං සඳහා වතුර පොම්ප කට්ටල 42 ක් සපයන ලදී. මෙම එක් එක් ව්‍යාපෘතියෙහි ප්‍රගතිය නොකඩවා මසකට වරක් සෝදිසි කර බලනු ලැබේ. මෙයට අමතරව ලංකා බැංකුවේ තංගල්ල ශාඛාව රන්න ප්‍රදේශයේ එළවළු ගොවීන් සඳහා මුදලින් ණය සැපයීමද නොකඩවා කරගෙන ගියේය. 1986 අවසානය වනවිට ඉහත සඳහන් දිස්ත්‍රික්ක දෙක සඳහා අනුමත කරන ලද මුළු ව්‍යාපෘති ගණන 143 ක් වූ අතර, නියෝජනය වූ ණයෙහි වටිනාකම රු. 11,45,925 ක් විය.

**තේ හා පොල් පොහොර ණය ක්‍රම**

වෙළෙඳපොලෙහි පැවති අඩු මිළ ගණන් නිසා 1986 දී මෙම ණය ක්‍රම දෙකෙහි ක්‍රියාකාරිත්වය බලාපොරොත්තු වූවාට වඩා පහළ මට්ටමක විය. එසේ වුවද, මෙකී ක්‍රම වලින් ලැබෙන ප්‍රයෝජන පිළිබඳව කුඩා වතු හිමියනට අවබෝධයක් ලබා දීමේ ප්‍රයත්නයක් වශයෙන් ගුරුසිංහගොඩ, නෙලුව, ඕපාත, කලුබෝවිටියාන හා මොරවක යන තේ වගා කරන ප්‍රදේශවල බැංකු නිලධාරීන් හා ව්‍යාප්ති නිලධාරීන් සමඟ රැස්වීම් පවත්වන ලදී.

මෙකී ණය ක්‍රම දෙකෙහි කටයුතු පිළිබඳ විස්තර 2.20 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ.

**2 . 20 සංඛ්‍යා සටහන**

**මාතර ප්‍රාදේශීය කාර්යාලය—පොල් හා තේ පොහොර ණය ක්‍රම ක්‍රියාකාරිත්වය—1986**

| ණය ක්‍රමය | 1986 වසර | | 1986 අවසානයේ දී සමුච්චිතය | |
|---|---|---|---|---|
| | ණය ඒකක | වටිනාකම (රුපියල්) | ණය ඒකක | වටිනාකම (රුපියල්) |
| පොල් පොහොර ණය ක්‍රමය .. | 24 | 4,40,431 | 363 | 28,67,048 |
| තේ පොහොර ණය ක්‍රමය .. | 33 | 1,05,423 | 229 | 13,37,106 |
| එකතුව .. | 57 | 5,45,854 | 592 | 42,04,154 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

**ප්‍රාදේශීය නිෂ්කාශනාගාරය**

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී ප්‍රාදේශීය කාර්යාලයීය පරිශ්‍රය තුළදී දවසකට දෙවර බැගින් නිෂ්කාශන කටයුතුවල යෙදුණු ප්‍රාදේශීය නිෂ්කාශනාගාරය රුපියල් දශ ලක්ෂ 1,043 ක වටිනාකමට වූ චෙක්පත් 1,43,230 ක් නිෂ්කාශනය කර ඇත. වර්ෂය තුළදී 'පැසිම්ලි' යන්ත්‍රයක් සවි කරන ලද අතර නිෂ්කාශනය වූ දවසෙහි සංඛ්‍යා ලැබීමෙන් පසු ප්‍රධාන කාර්යාලයෙහි අදාළ සටහන් තබනු ලැබීය.

## ප්‍රාදේශීය කාර්යාලය—අනුරාධපුරය

1986 වර්ෂය තුළදී අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය විසින් සළසමින් තිබුණ පහසුකම් දියුණු කරන අතරම, නව අංශ කරා සිය කටයුතු ව්‍යාප්ත කරන ලදී. සුළු ව්‍යාපාර හා කර්මාන්තවලට අදාල මූල්‍ය, කළමනාකරණ හා තාක්ෂණික අංශ ආවරණය වන පරිදි, ණය ගැනීමට බලාපොරොත්තු වන්නන් සඳහා පුළුල් උපදේශක සේවාවක් සපයන ලදී. ප්‍රාදේශීය කාර්යාලය

මගින් සම්මන්ත්‍රණ වැඩ මුළු හා ගම් මට්ටමින් 'ජන හමුව' රැස්වීම් සංවිධානය කිරීමෙන් ගම්වැසියන් හා බලධාරීන් අතර ද්විමාර්ගික සම්බන්ධතාවයක් තහවුරු කරන ලදී. ගොවීන්ට සූක්ෂම වගා ක්‍රම පිළිබඳව අවබෝධයක් ලබාදීම සඳහාත්, ප්‍රාදේශීය කාර්යාලය මගින් සංවිධානය කරන ලද විවිධ පුහුණුවීම් වැඩ සටහන්වලින් ලබා ගත් දැනුම අගැයීම සඳහාත් 1986 යල කන්නයේදී කෘෂිකාර්මික තරඟයක් පවත්වන ලදී.

**ප්‍රතිමූල්‍ය ණය ගණුදෙනු**

1986 වර්ෂය තුළ ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රතිමූල්‍ය ණය ගණුදෙනු පිළිබඳ සාරාංශයක් 2.21 වැනි සංඛ්‍යා සටහනින් දක්වේ.

**2 . 21 සංඛ්‍යා සටහන**

**අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය – ප්‍රතිමූල්‍ය ණය ගණුදෙනු**

| අංශය | නිර්දේශිත ව්‍යාපෘති ගණන | නිර්දේශිත මුදල (රු. දහස්) | අනුමත වූ ව්‍යාපෘති ගණන | අනුමත වූ මුදල් ප්‍රමාණය (රු. දහස්) |
|---|---|---|---|---|
| 1. මැදි කාලීන හා දිගු කාලීන | | | | |
| කෘෂිකර්මය .. | 870 | 9,915 | 315 | 3,733 |
| පශු සම්පත් .. | 523 | 2,680 | 146 | 741 |
| කුඩා කර්මාන්ත .. | 246 | 2,387 | 133 | 1,310 |
| සේවා .. | 107 | 813 | 53 | 392 |
| 2. කෙටි කාලීන | | | | |
| වී හා අතිරේක භෝග | 447 | — | 288 | 1,815 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

වියළි කාලයේදී, භූමිතෙල් පොම්ප හෝ සුළං බල යන්ත්‍ර මගින් භූගත ජල සම්පත් ප්‍රයෝජනයට ගනිමින් උස්සාන වාරි මාර්ගිකව කරන කෘෂිකාර්මික ව්‍යාපෘති සඳහා වැඩි වශයෙන්ම ණය ලබා ගන්නා ලදී. මෙම ව්‍යාපෘතීන් ආර්ථික වශයෙන් ඵලදායී වන අතර, දිස්ත්‍රික්කයේ ගොවීන් අතර ජනප්‍රියව පවතී. ප්‍රධාන වශයෙන්ම, භූමිතෙල් පොම්ප සඳහා අධික ප්‍රාග්ධන වියදමක් දැරීමට සිදුවීමත්, සුළං බල යන්ත්‍ර සම්බන්ධයෙන් ඒවා ක්‍රියා කරවීමේ පිරිවැය අඩු වීමේ වාසියත් නිසා සුළං බල යන්ත්‍රය වැඩි වැඩියෙන් ජනප්‍රිය වෙමින් පවතී.

**ව්‍යාපෘතිවල ක්‍රියාකාරිත්වය**

ප්‍රාදේශීය කාර්යාලය ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවල ප්‍රධාන අරමුණ වූයේ, නිෂ්පාදනය හා ආදායම් මට්ටම් ඉහළ නැංවීම හා දේශීය වශයෙන් ලබාගත හැකි සම්පත් උපයෝගි කර ගැනීමෙන් අතිරේක රැකියා අවස්ථාවන් සැලසීමය. 1986 අවසානය වනවිට ව්‍යාපෘති 647 ක් අනුමත කර තිබුණු අතර, ඒවායින් 557 ක් ක්‍රියාත්මක වෙමින් පැවතිණි.

**ආදායම හා සේවා නියුක්තිය**

වර්ෂය තුළදී, ක්‍රියාත්මක වෙමින් තිබුණු ව්‍යාපෘති මගින් උපදවන ලද මුළු ආදායම රුපියල් දශ ලක්ෂ 20.6 ක් වී යැයි ගණන් බලා ඇත. ආංශික වශයෙන් විශ්ලේෂණය කිරීමේදී කෘෂිකාර්මික ව්‍යාපෘතීන් වඩාත් ඉහළ හා ස්ථිර ආදායමක් උපදවා ඇති බව පෙන්නුම් කරයි. කෘෂිකාර්මික ව්‍යාපෘති බොහොමයකින්ම එක් කන්නයකට ලැබූ සාමාන්‍ය ආදායම රුපියල්

10,000 සහ රුපියල් 15,000 අතර විය. මේ අතර, අලෙවි භෝග වගා අක්කර 1 සිට 2 දක්වා වූ ප්‍රමාණයකින් යුත් ඇතැම් ව්‍යාපෘතිවලින් කන්නයකට රුපියල් 35,000 – රුපියල් 40,000 ඉක්මවන ආදායමක් ලැබිණි.

කෘෂිකාර්මික ව්‍යාපෘති බොහොමයක්ම නිත්‍ය වශයෙන් පුද්ගලයන් 5–6 දක්වා වූ සංඛ්‍යාවක් සේවාවෙහි යෙදවීය. කාර්මික හා සේවා ආංශික ව්‍යාපෘති නිත්‍ය පදනමක් යටතේ වැඩි සේවා අවස්ථාවන් සළසා දීමෙන් සැළකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. ඇතැම් කුඩා පරිමාණ කාර්මික ව්‍යාපෘති විසින් පුද්ගලයන් 6 සිට 8 දක්වා වූ සංඛ්‍යාවකට රැකියා අවස්ථා සැළසීමට සමත්වී ඇත. මෙම ව්‍යාපෘතීන් විසින් උත්පාදනය කරන ලද ඇස්තමේන්තුගත ආදායමට හා සේවා නියුක්තියට අදාල දත්තයන් 2 . 22 වැනි සංඛ්‍යා සටහනින් දැක්වේ.

## 2 . 22 සංඛ්‍යා සටහන

### අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය – ඇස්තමේන්තුගත ආදායම හා සේවා නියුක්තිය

| අංශය | | ක්‍රියාත්මක වූ ව්‍යාපෘති සංඛ්‍යාව | මාසික ආදායම රුපියල් | වාර්ෂික ආදායම රුපියල් | සේවා නියුක්තිය |
|---|---|---|---|---|---|
| කෘෂිකර්මය | .. | 274 | 6,65,527 | 79,86,324 | 440 |
| පශු සම්පත් | .. | 112 | 27,000 | 3,24,000 | 67 |
| සුළු කර්මාන්ත | .. | 122 | 8,98,000 | 1,07,76,000 | 194 |
| සේවා අංශය | .. | 49 | 1,29,500 | 15,54,000 | 60 |
| එකතුව | .. | 557 | 17,20,027 | 2,06,40,324 | 761 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

### ණය ආපසු ගෙවීම්

මැදි හා දිගු කාලීන ණය වැඩ සටහනේ ණය ආපසු ගෙවීම පිළිබඳ සාරාංශයක් 2 . 23 වැනි සංඛ්‍යා සටහනින් දැක්වේ.

සියයට 81.1 ක් වූ වැඩිම ආපසු ගෙවීම් අනුපාතිකය සේවා අංශය විසින් වාර්තා කරන ලදී. කෘෂිකාර්මික ව්‍යාපෘතිවල ආපසු ගෙවීම් අනුපාතිකය සියයට 80.1 ක් විය. කර්මාන්ත හා පශු සම්පත් අංශවල ආපසු ගෙවීම් අනුපාතික පිළිවෙලින් සියයට 73.1 ක් හා සියයට 65.5 ක් විය. පශු සම්පත් අංශයේ ආපසු ගෙවීම් අනුපාතිකය සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමක පැවතිණි. එසේ වීමට හේතු වූ එක් ප්‍රධාන සාධකයක් වූයේ කුකුළන් ඇති කිරීමේ ඒකක සියල්ලම පාහේ අසාර්ථක වීමය.

**2 . 23 සංඛ්‍යා සටහන**

**අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය -- ණය ආපසු ගෙවීම**

| අංශය | ක්‍රියාත්මක වූ ව්‍යාපෘති සංඛ්‍යාව | ආපසු ගෙවීම් ඇරඹිය යුතුව ඇති ව්‍යාපෘති සංඛ්‍යාව | ගෙවා නිමි ඒකක | බැංකුවලට අය විය යුතු මුදල රුපියල් | ආපසු ගෙවූ මුදල රුපියල් | හිඟ හිටි මුදල රුපියල් | ආපසු ගෙවීමේ අනුපාතිකය |
|---|---|---|---|---|---|---|---|
| කෘෂිකර්මය .. | 274 | 173 | 21 | 4,56,635 | 3,65,635 | 91,000 | 80.07 |
| පශු සම්පත් .. | 112 | 74 | 44 | 1,85,785 | 1,21,650 | 64,135 | 65·47 |
| සුළු කර්මාන්ත .. | 122 | 92 | 26 | 2,01,130 | 1,47,010 | 54,120 | 73.09 |
| සේවා අංශය .. | 49 | 34 | 08 | 68,400 | 55,500 | 12,900 | 81·11 |
| එකතුව .. | 557 | 373 | 99 | 9,11,950 | 6,89,795 | 2,22,155 | 75·64 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

**ගොවීන් පුහුණු කිරීමේ වැඩ සටහන්, සම්මන්ත්‍රණ/වැඩ මුළු**

විද්‍යාත්මක පර්යේෂණවල හා තාක්ෂණික දියුණුවේ ප්‍රතිඵල ගොවීන් වෙත ළඟාකර දීමේ අවශ්‍යතාවය අවධාරණය කරමින් ප්‍රාදේශීය කාර්යාලය විසින් විවිධ පුහුණු වැඩ සටහන් පිළියෙල කරනු ලැබූ අතර, ඒ සඳහා විශේෂ අවධානය යොමු කරන ලදී. කලින් වර්ෂයේදී මෙන් ගොවීන් පුහුණු කිරීම් වැඩ පිළිවෙල යටතේ ඇත ප්‍රදේශවල ගොවීන්ගේ ප්‍රයෝජනය තකා වී, ආර්ථික භෝග හා අතිරේක භෝග වගාව පිළිබඳව පුහුණුවීම් සැසි හා සම්මන්ත්‍රණ 17 ක් දිස්ත්‍රික්කයේ විවිධ මධ්‍යස්ථානවලදී පවත්වන ලදී. 1986 වසර තුළදී ගොවීන් දහසකට වැඩි සංඛ්‍යාවකට මින් යහපතක් සැලසී ඇත. මීට අමතරව, වසර තුළදී ගොවීන් හා ගැමි නායකයන් සඳහා වෙනත් සම්මන්ත්‍රණ හා වැඩ මුළුද පවත්වන ලදී.

**නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය**

**කෙටි කාලීන නිෂ්පාදන ණය**

නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමයට ක්‍රියාකාරී අන්දමින් සහභාගි වූ ප්‍රාදේශීය කාර්යාලය, 1986 වසර තුළදී කෙටි කාලීන නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි ණය පහසුකම් පුළුල් කළේය.

මෙම ණය ක්‍රමය 1986 යල කන්නයේ සිට ක්‍රියාත්මක විය. එයට සහභාගි වීමට ප්‍රාදේශීය කාර්යාලය විසින් තීරණය කරනු ලැබුයේ කලින් දෙන ලද බැංකු ණය ආපසු ගෙවීම අධික ලෙස පැහැර හැර තිබුණ පසුබිමක් තිබියදීය. ණය ක්‍රමය හඳුන්වා දීමට පමණක් නොව, ක්‍රියාත්මක වෙමින් පවත්නා වෙනත් විවිධ ණය ක්‍රම යටතේ ලැබෙන ප්‍රයෝජන පිළිබඳ ජනතාවට අවබෝධයක් ලබා දීම සඳහාද දැඩි ව්‍යාපාරයක් දියත් කිරීම අවශ්‍ය විය. ණය පැහැර හැරියවුන් බැංකු ක්‍රමය තුළට ළංකර ගැනීම සඳහා ප්‍රතිලේඛනගත කිරීමේ ක්‍රමය යටතේ සළසා ඇති පහසුකම් ගොවීන්ට දැන ගැනීමට සැලැස්වීමද කළයුතු විය. මූලික පියවරක් වශයෙන් ණය ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථාන කිහිපයක් තෝරා ගන්නා ලදී.

### භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම

භාණ්ඩාගාර බිල්පත් පිට පළාත්වල ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා වූ මහ බැංකු වැඩ සටහනේ කොටසක් වශයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ රුපියල් 900,000 ක වටිනාකමට භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමට ප්‍රාදේශීය කාර්යාලයට හැකි විය.

### ප්‍රාදේශීය නිෂ්කාශනාගාරය

ප්‍රදේශය තුළ පිහිටි බැංකුවලට චෙක්පත් නිෂ්කාශනය කිරීමේ පහසුකම් සැළසීම නිෂ්කාශනාගාරය විසින් තවදුරටත් කරගෙන යන ලදී. අනුරාධපුර ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව 1986 දී නිෂ්කාශනාගාරයට සම්බන්ධ වූ අතර ප්‍රාදේශීය කාර්යාලය මගින් එය නියෝජනය කෙරිණි. වසර තුළදී ප්‍රාදේශීය නිෂ්කාශනාගාරය මගින් රුපියල් දශ ලක්ෂ 190.1 ක වටිනාකමට චෙක්පත් නිෂ්කාශනය කර ඇත.

### ප්‍රාදේශීය කාර්යාලය – මාතලේ

ග්‍රාමීය අංශය නගා සිටුවීමෙහි හා සංවර්ධනය කිරීමෙහිලා නියැලුනු මෙම ප්‍රාදේශීය කාර්යාලයෙන් සමාලෝචනයට භාජනය වන කාලච්ඡේදය තුළදී ඉටු වූ ප්‍රධාන කාර්යයන්ට අයත් වූයේ විවිධ ග්‍රාමීය ණය ක්‍රමයන් කෙරෙහි ප්‍රචාරයක් ලබා දීමත්, ණය ගනුවන් හඳුනාගෙන වගා කටයුතු, ස්වයං රැකියා සහ මැදි කාලීන ණය සඳහා වූ අයැදුම්පත් ඇගයීමෙන් වාණිජ බැංකු වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමත්ය. තවද, ඒ සමගම මෙම කාලච්ඡේදය තුළදී ණය ලබා දීමේ කඳවුරු, ණය ආපසු අයකර ගැනීමේ කඳවුරු, ප්‍රතිමූල්‍ය දීර්ඝ කිරීමේ පහසුකම් කමිටු, සකසුරුවම් හා ණය දීමේ සමුපකාර සමිති ආදී සංවර්ධන ණය හා සම්බන්ධ කාර්යයන් සංවිධානය කිරීමද සිදු කරන ලදී. මෙම කාර්යාලයේ ග්‍රාමීය ණය කටයුතුවලට පිටිවහල් වූ ණය ක්‍රමයක් 2.24 වැනි සංඛ්‍යා සටහනින් දක්වා ඇත. එම සටහනෙහිම 1986 දී බැංකු වෙත යොමු කරවන ලද අනුරූප ප්‍රතිලාභීන්/ඒකක සංඛ්‍යාවක් නිර්දේශිත ණය ප්‍රමාණයනුත් සාරාංශ කොට දක්වා ඇත.

**2 . 24 සංඛ්‍යා සටහන**

**මාතලේ ප්‍රාදේශීය කාර්යාලය — 1986 ණය කටයුතු**

| ණය වර්ගය | බැංකු වෙත යොමුකරන ලද ප්‍රතිලාභීන්/ඒකක සංඛ්‍යාව | නිර්දේශිත ණය ප්‍රමාණය (රු.) |
|---|---|---|
| 1. නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය .. | 427 | 18,22,005 |
| 2. ස්වයං රැකියා ණය ක්‍රමය (මාතලේ/මහනුවර/කෑගල්ල) .. | 154 | 9,96,740 |
| 3. කිරි පට්ටි සංවර්ධන ණය ක්‍රමය .. | 38 | 4,00,300 |
| 4. දීප ව්‍යාප්ත ගොවිපල යන්ත්‍ර ණය ක්‍රමය .. | 23 | 3,26,845 |
| 5. ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙල .. මාතලේ දිස්ත්‍රික්කය | 01 | 68,758 |
| 6. සුළු හා මැදි කාලීන කාර්මික ව්‍යාපෘති .. | 04 | 1,46,500 |
| 7. අනෙකුත් .. | 01 | 1,68,150 |
| එකතුව .. | 648 | 39,29,298 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

### යල කන්නය—1986

යල කන්නයේදී වී වගාව සඳහා ප්‍රමාණවත් ජලය මාතලේ දිස්ත්‍රික්කයෙහි නොලැබීම නිසා එළවළු සහ අතුරු ආහාර භෝග වගා කිරීම ගොවීන් විසින් එම කන්නයේදී කරනු ලැබේ. නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ ප්‍රදේශයේ උචිත බව සැළකිල්ලට ගෙන සුදුසු අතිරේක ආහාර භෝග වගාවන් නංවාලීම පිණිස මාතලේ දිස්ත්‍රික්කයෙහි ප්‍රදේශ තුනක් තෝරා ගන්නා ලදී.

ඒ අනුව, බොම්බයි එළළු සඳහා කිඹිස්සද, සෝයාබෝංචි හා අනෙකුත් අතිරේක භෝග සඳහා දේවහුව සහ විල්ගමුවද උචිත බව තීරණය විය. ප්‍රතිලාභීන් සැළකිය යුතු ප්‍රමාණයකට ණය ලබා දීමටද නිර්දේශ කරන ලදී.

වාණිජ බැංකුවල සහ අනෙකුත් අදාළ රාජ්‍ය නියෝජ්‍යත්වයන්ගේද සහාය ඇතිව ණය දීමේ හා ණය ආපසු අයකර ගැනීමේ කඳවුරු සංවිධානය කොට ණය ප්‍රදානය කිරීමේ හා ණය ආපසු අයකර ගැනීමේ නවතම ක්‍රමයක් මාතලේ ප්‍රාදේශීය කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලදී. අනුමත කරන ලද ණය භාණ්ඩමය වශයෙන් හා මුදල් වශයෙන් එකී කඳවුරුවලදී ප්‍රදානය කරන ලදී. එසේ ලබාදුන් ණය මුදල් අයුතු ලෙස ප්‍රයෝජනයට යෙදවීම අවම කරනු පිණිස, එළදායී අධීක්ෂණ කටයුතු ප්‍රාදේශීය කාර්යාලය මගින් නොකඩවා සිදු කරන ලදී. ණය ආපසු අයකර ගැනීමේ කඳවුරුවලදී නියමිත දිනවලට අනුව ණය ආපසු ලබා ගැනීමට විධිවිධාන යොදන ලදී. බොහෝ අවස්ථාවලදී සියයට සියයක්ම ණය ආපසු අයකර ගැනීමෙන් පෙනී යනුයේ මෙම ක්‍රමයෙහි ඇති ඉමහත් සාර්ථකත්වයයි.

**මහ කන්නය—1986/87**

හුදෙක් වගා කටයුතු සඳහාම, රාජ්‍ය බැංකු දෙක මගින් සමූහ අයැදුම්පත් යටතේ දෙනු ලබන ණය ප්‍රදානය කිරීම සඳහා 1986 යල කන්නයේදී මෙන්ම ණය කඳවුරු සංවිධානය කරන ලදී. ප්‍රතිලාභීන් 210 දෙනෙකු සඳහා රුපියල් දශ ලක්ෂ 1.3 ක මුළු බැංකු ණය ප්‍රමාණයක්, මෙකී ණය කඳවුරුවලදී ප්‍රදානය කෙරිණි. මීට අතිරේක වශයෙන් රෝද දෙකේ සහ රෝද හතරේ ට්‍රැක්ටර් මිළදී ගැනීම සඳහා රු. 7,05,000 ක මුදලක් ද ලබා දී ඇත.

**සුළු අපනයන භෝග**

මේ ප්‍රදේශයේ ආර්ථිකයෙහි ඉතා වැදගත් ස්ථානයක් උසුලන සුළු අපනයන භෝග කුඩා වතුවල මිශ්‍ර වගාවක් වශයෙන් වගාකරනු ලැබේ. සිය වගාවන් වර්ධනය කර ගැනීම පිණිස ගතහැකි සහනාධාර ලබා ගන්නා ලෙස, ප්‍රාදේශීය කාර්යාලය විසින් සුළු අපනයන භෝග වගා කරුවන් උනන්දු කරවනු ලැබූ අතර, මාතලේ, මහනුවර, හා කෑගල්ල යන දිස්ත්‍රික්කවල සුළු අපනයන භෝග තවාන් ඇති කිරීම පිණිස අවශ්‍ය ණය පහසුකම් දීමද නිර්දේශ කරන ලදී.

**පුහුණු, උපදේශක හා ප්‍රචාරක කටයුතු**

ගැමි ගොවි ජනතාවට අතිරේක ආදයම් මාර්ගයක් සලසා ගැනීමට හැකිවනු පිණිස මී මැසි පාලනය, රටඑළුනු වගාව සහ ගව පට්ටි පාලනය පිළිබඳ අධ්‍යයනයක් ලබා දීම සඳහා මූලික පුහුණු වැඩ සටහන් කීපයක් ප්‍රාදේශීය කාර්යාලය මගින් පවත්වනු ලැබීය.

**ස්වයං රැකියා ණය ක්‍රමය සහ ගව පට්ටි සංවර්ධනය හා ගොවිපල යන්ත්‍ර හා උපකරණ සඳහා වන අනෙකුත් මැදි කාලීන ණය ක්‍රම**

ඉහත සඳහන් ණය ක්‍රම හඳුන්වා දීම පිණිස ප්‍රාදේශීය කාර්යාලය විසින් 1986 වර්ෂය තුළදී රැස්වීම් 31 ක් පවත්වන ලදී. පෞද්ගලික ණය අයැදුම්පත් 1,252 ක් ලැබිණි. දැනට කෙරීගෙන යන ව්‍යාපෘති වලින් සියයට 40 ක් පමණ සත්ව පාලනයට සම්බන්ධ ඒවා විය. ඉතිඳු අඩක් පමණ ගව පට්ටි පාලනයට අදළ ඒවා විය.

ස්වයං රැකියා ණය ක්‍රම පිළිබඳව කිව යුත්තේ, කුඩා පරිමාණයේ ඇඳුම් නිෂ්පාදනය, ගඩොල් තැනීම, කුඩා කම්මල් හා වැඩපළවල්වල කෙරෙන ලෝහමය වැඩ, රස කැවිලි නිෂ්පාදනය හා ග්‍රාමීය බේකරි ජනප්‍රිය වී ඇති බවය. කෑගලු දිස්ත්‍රික්කයෙහි සමහර ගම් කොහු තැනීමෙන් විශේෂඥතාවයක් දක්වා තිබේ. හස්ත කර්මාන්ත සඳහා වූ ණය අයැදුම්පත්වලින් වැඩි ප්‍රමාණයක් ලැබුනේ මහනුවර දිස්ත්‍රික්කයෙනි. ලැබී ඇති ණය අයදුම්පත්වලින් වැඩි ප්‍රමාණයක්, දැනට ඇති නිෂ්පාදන ඒකක වැඩි දියුණු කිරීම හෝ ව්‍යාප්ත කිරීම සඳහා විය.

DISCARDED

### නිෂ්කාශන කටයුතු

මාතලේ ප්‍රාදේශීය නිෂ්කාශනාගාරයේ නිෂ්කාශන කටයුතු, රාජ්‍ය බැංකු දෙකෙහි සහ ලංකා වාණිජ බැංකුවේ සහභාගීත්වය ඇතිව 1986 මැයි මාසයේදී අරඹන ලදී. 1986 මැයි සිට දෙසැම්බර් දක්වා වූ අට මාසය තුළදී, රුපියල් දශ ලක්ෂ 2.72 ක මුළු වටිනාකමින් යුතු චෙක්පත් 49,794 ක් නිෂ්කාශනය කරන ලදී.

## අනුග්‍රාහක සේවා

මහ බැංකුවේ, වාණිජ බැංකුවල සහ සංවර්ධන කටයුතු පෙරදැරි කර ගත් ඇතැම් අමාත්‍යාංශ සහ රජයේ ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත බැංකු කටයුතු පිළිබඳ අනුග්‍රාහක සේවා කමිටුව 1981 වසරේ මැදි කාලයේදී පිහිටුවන ලදී. එම කමිටුව එතැන් පටන් වාණිජ බැංකු විසින් අනුග්‍රාහකයින්ට සළසනු ලබන සේවාවන් දියුණු කිරීමේ අරමුණට මුල්තැන දෙමින් කටයුතු කරන ලදී. 1986 වර්ෂය තුළදී කමිටුව තෙවරක් රැස් වූ අතර, අනුග්‍රාහක සේවා පිළිබඳ විවිධ කරුණු සාකච්ඡාවට භාජනය කර ඇත.

කමිටුව විසින් 1985 වර්ෂයේදී ආරම්භ කරන ලද බැංකු කටයුතු පිළිබඳ අනුග්‍රාහක සේවා සමීක්ෂණයේ වාර්තාව, 1986 වර්ෂය තුළදී පළ කරන ලදී. මෙම සමීක්ෂණය තැපැල් මාර්ගයෙන් පවත්වන ලද අතර, විවිධ මාදිලියේ බැංකු සේවා පිළිබඳව තොරතුරු සහ අදහස් විමසන ප්‍රශ්නාවලියක්, වාණිජ බැංකු පහකින් නියැදියකින් තෝරා ගත් අනුග්‍රාහකයින් 10,000 ක් වෙත තැපැල් කර යවන ලදී. එම ප්‍රශ්නාවලිය ලැබූ අයගෙන් පිළිතුරු සැපයුයේ සියයට 23 ක් පමණක් වුවද, බැංකු මගින් සපයනු ලබන සේවාවන්ගෙන් වැඩි දියුණු කළහැකි සේවා මොනවාද යන්න ඔවුන් විසින් පෙන්වා දී තිබිණ. එම වාර්තාව බැංකුවලට මෙන්ම ඔවුන්ගේ අනුග්‍රාහකයනටද ප්‍රයෝජනවත් වනු ඇතැයිද වාණිජ බැංකු විසින් සළසනු ලබන සේවාවන් සමස්තයක් වශයෙන් දියුණු කිරීමට ඉවහල් වනු ඇතැයිද අපේක්ෂා කෙරේ.

### ප්‍රකාශන

මුදල් නීති පණතේ 35 (1) වැනි වගන්තිය ප්‍රකාර, 1985 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව, ගරු මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමා වෙත පිළිගන්වන ලදී. 1986 වර්ෂයේ ප්‍රථම භාගයේ කටයුතු පිළිබඳ කෙටි සමාලෝචනයක් ' ආර්ථික හැඩගැස්ම—1986 ප්‍රථම භාගය ' යනුවෙන් නොවැම්බර් මාසයේදී පළ කරන ලදී. එය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම නිකුත් විය.

'' ශ්‍රී ලංකා මහ බැංකුව - කාර්යභාරය සහ ක්‍රියාකාරිත්වය '' යන මැයෙන් පොතක් 1986 අගෝස්තු මාසයේ දී නිකුත් කරන ලදී. ආරම්භයේ සිට බැංකුව ලබා ඇති ප්‍රගතිය, එහි වර්තමාන කටයුතු සහ ශ්‍රී ලංකාවේ ආර්ථිකය සම්බන්ධයෙන් බැංකුවේ විවිධාකාර සහභාගිත්වය පිළිබඳව සවිස්තරාත්මක තොරතුරු මෙම පොතෙහි ඇතුළත් වේ.

වර්ෂය තුළදී තවත් ප්‍රකාශන කීපයක්ම නිකුත් කරන ලදී. මේවා අතර, ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජමය සංඛ්‍යාන viii වැනි වෙළුම, 1985 සහ ආර්ථික හා සමාජමය දත්ත ෆෝල්ඩරය-1986 දී විය. මෙම ප්‍රකාශනවල වර්ෂය සඳහා වන මූලික දත්ත අඩංගු වී ඇත. 1986 වර්ෂයේදී ප්‍රකාශනයට පත් කරන ලද ආචාර්ය උපාධි නිබන්ධන දෙකක් වූයේ, ආචාර්ය එම්. යූ. ඒ. තෙන්නකෝන්ගේ ' නියං දුෂ්කරතා සහ ග්‍රාමීය සංවර්ධනය ' හා ආචාර්ය ඩී. එස්. විජේසිංහ ගේ 'සම් එක්ස්පෙරිමන්ට්ස් විත් අ මල්ටිසෙක්ටෝරල් ඉන්ටටෙම්පෝරල් ඔප්ටිමයිසේෂන් මොඩ්ල් ෆෝ ශ්‍රී ලංකා' ' ය. '' ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ බැංකු සතු කාර්යභාරය '' යන ඉන්දියානු රිසව් බැංකුවේ අධිපති ශ්‍රී ආර්. එන්. මල්හොත්‍රාගේ අංක 14 දරණ කාලීන ලිපිය මෙම වර්ෂය තුළදී කරන ලද ප්‍රකාශනයන්ගෙන් එකකි. '' සමීක්ෂණ විමර්ශන'' මාලාවේ 1 වැනි වෙළුමද ප්‍රකාශයට පත් කරන ලදී. විවරණිකාව, සිංහලෙන් පළවන සටහන හා ඉංග්‍රීසියෙන් පළ වන 'ප්‍රවෘත්ති සමීක්ෂණය' සමාලෝචිත වර්ෂය තුළ මාසිකව පළ කරන ලදී.

**පුස්තකාලය**

පුස්තකාලය තොරතුරු ලබා ගැනීම සඳහා, බැංකු නිලධාරීන් විසින්, වැඩි වැඩියෙන් පරිශීලනය කරනු ලබන ස්ථානයක් බවට පත් වී ඇත. සීමාසහිත ප්‍රමාණයක් මුත්, බාහිර පුද්ගලයින්ටද මෙම ස්ථානයෙහි ඉඩ සලසා ඇත. ආර්ථික විද්‍යාව හා ඊට අනුබද්ධ විෂය-යන් යටතට ගැනෙන පොත් 1,523 ක් වර්ෂය තුළදී පුස්තකාලය විසින් ලබා ගන්නා ලදී.

## සම්මන්ත්‍රණ

1986 වර්ෂය තුළදී පහත දැක්වෙන සම්භාවනීය අර්ථ ශාස්ත්‍රඥයින් විසින් මහ බැංකු නිලධාරීන්ට ප්‍රයෝජනවත් වන මාතෘකා යටතේ දේශන පවත්වන ලදී.

1. අන්ක්ටාඩ්හි හිටපු මහ ලේකම් ආචාර්ය ගාමිණී කොරෙයා—''වෙළෙඳ භාණ්ඩ මිළ හා දියුණු වෙමින් පවත්නා රටවල්වලට ඉන් ඇති වන බලපෑම '' යනුවෙන් දේශනයක් පවත්වන ලදී.

2. හල් විශ්ව විද්‍යාලයේ ගරු මහාචාර්ය ජේ. එස්. ජී. විල්සන්—'' මූල්‍ය වෙළෙඳපොලවල් සහ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම'' යනුවෙන් දේශනයක් පවත්වන ලදී.

3. සංවර්ධන ආර්ථික පර්යේෂණ සඳහා වූ ලෝක ආයතනයේ ජ්‍යෙෂ්ඨ සාමාජික මහාචාර්ය එන්. කක්වානි—'' මන්දපෝෂණය : මිනීම සහ ප්‍රතිපත්ති '' යනුවෙන් දේශනයක් පවත්වන ලදී.

## සමීක්ෂණ

**ව්‍යාපාරික කටයුතු සහ සැලසුම්ගත ආයෝජනයන් පිළිබඳ සමීක්ෂණය**

ව්‍යාපාර කටයුතු සහ සැළසුම්ගත ආයෝජනයන් පිළිබඳ පස් වන සමීක්ෂණය 1986 දෙවන භාගයේදී පවත්වන ලදී. දත්ත සටහන්ගත කිරීම නිම කොට ඇති අතර, වාර්තාව සකස් වෙමින් පවතී.

**පාරිභෝගික මුදල් සහ සමාජ ආර්ථික සමීක්ෂණය 1986/87**

1986/87 පාරිභෝගික මුදල් සහ සමාජ ආර්ථික සමීක්ෂණය 1986 ඔක්තෝබර් මාසයේදී අරඹන ලදී. මෙය, පාරිභෝගික මුදල් පිළිබඳව මහ බැංකුව විසින් පවත්වනු ලබන සය වන සමීක්ෂණය වේ. සමීක්ෂණයේ ක්ෂේත්‍ර දත්ත රැස් කිරීම, මාස දෙළහක් ආවරණය වන පරිදි වට හතරකදී සිදු කෙරේ. ත්‍රස්තවාදී ක්‍රියා පවත්නා ප්‍රදේශ හැර රටේ අන් හැම ප්‍රදේශයකම විසිරී ඇති කුටුම්බ 7,104 ක නියැදියක් මෙහිදී යොදා ගනු ලැබේ.

**දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ ක්‍රමය**

පාරිභෝගික භාණ්ඩ 220 ක පමණ සිල්ලර මිළ කෘෂිකාර්මික යෙදවුම්වල නිෂ්පාදන මිළ, වී ගොවිතැන, තේ, රබර් සහ පොල් වගා සහිත කුඩා වතුවල මෙන් ම ඉදිකිරීම් අංශයේ දෛනික වැටුප් අනුපාතික දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ ක්‍රමය යටතේ එක් රැස් කිරීම බැංකුව විසින් තව දුරටත් කරගෙන යනු ලැබිය. පාරිභෝගික භාණ්ඩ, කෘෂිකාර්මික යෙදවුම් හා ශ්‍රමය ලබා ගැනීමේ හැකියාව පිළිබඳ තොරතුරුද රැස් කරනු ලැබේ. දිවයිනේ තෝරා ගත් මධ්‍යස්ථාන 100 කින් නිත්‍ය පදනමක් යටතේ දත්ත එක් රැස් කොට කෙටි විග්‍රහයක්ද සහිතව '' මිළ හා වැටුප් සංඛ්‍යාන — සිල්ලර නිෂ්පාදන හා යෙදවුම් මිළ හා වැටුප් '' නමැති වාර්ෂික ප්‍රකාශණය මගින් ඉදිරිපත් කරනු ලැබේ.

### ආනයන ලිහිල් කිරීමේ වැඩපිළිවෙල මෙහෙයවීම

ආනයන කරුවන් විසින් අරඹනු ලබන ණයවර ලිපි පිළිබඳ තොරතුරු එක් රැස් කිරීමෙන් බැංකුව, ආනයන ලිහිල් කිරීමේ වැඩපිළිවෙල තවදුරටත් මෙහෙයවීය. සෑම ණයවර ලිපියක් සම්බන්ධයෙන්ම වෙනස්කිරීම්, අවලංගු කිරීම් සහ බිල්පත් බේරුම් කිරීම පිළිබඳ තොරතුරු වාණිජ බැංකු විසින් මහ බැංකුව වෙත දැනුම් දිය යුතු වේ. මෙම තොරතුරු විග්‍රහාත්මක සටහනක්ද සහිතව නිත්‍ය පදනමක් මත අදාළ බලධාරීන් වෙත යවනු ලැබේ.

## පුහුණු කිරීම්

මහ බැංකු නිලධාරීන් සඳහා අධ්‍යාපනික හා ප්‍රායෝගික ක්ෂේත්‍රයන්හි පුහුණු කිරීමේ වැඩසටහන් පිළියෙල කිරීම පුහුණු කටයුතු දෙපාර්තමේන්තුව මගින් තවදුරටත් කරගෙන යන ලදී. අධ්‍යයන පාඨමාලා ප්‍රධාන වශයෙන් එතෙර හා මෙරට විශ්ව විද්‍යාලයන්හි ආර්ථික විද්‍යාව හා අනුබද්ධිත ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි අධ්‍යයනයට සීමා වූ අතර ඒවාට ශාස්ත්‍රපති හා ආචාර්ය උපාධි දක්වා වූ පාඨමාලා ඇතුළත් විය. 1986 වර්ෂය තුළදී එතෙර පශ්චාත් උපාධි අධ්‍යාපනයන් සඳහා මුළු වශයෙන් නිලධාරීන් අට දෙනෙකු පිටත්ව ගිය අතර, නිලධාරීහු දෙදෙනෙක් මෙරට පශ්චාත් උපාධි අධ්‍යාපනයෙහි නිරත වූහ. නිලධාරීහු 6 දෙනෙක් කොළඹ විශ්ව විද්‍යාලයේ ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමෙහි නිරත වූහ.

පිටරටදී මෙන්ම මෙරටදීද පවත්වනු ලැබූ ප්‍රායෝගික කෙටිකාලීන පුහුණු වැඩ සටහන් සම්මන්ත්‍රණ, වැඩ මුළු, අධ්‍යයන චාරිකා යනාදියෙන් සමන්විත වූ අධ්‍යාපනික නොවන පුහුණු කිරීම්වලට ප්‍රධාන වශයෙන් ග්‍රාමීය සංවර්ධනය, කෘෂිකාර්මික හා කාර්මික ණය, බැංකු කටයුතු හා පරිගණක විද්‍යා අධ්‍යයනය යන ක්ෂේත්‍රයන් ඇතුළත් විය. 1986 වර්ෂය තුළදී කෙටිකාලීන පුහුණුවීම් සඳහා නිලධාරීන් 77 දෙනෙකු එතෙර බලා පිටත්ව ගිය අතර තවත් 217 දෙනෙක් මෙරට පුහුණුවීම් පාඨමාලාවලට සහභාගි වූහ.

මහ බැංකු නිලධාරීන් සඳහා මහජන බැංකුවේ හා ලංකා බැංකුවේ වූ වාණිජ බැංකු පරිචය හා මෙහෙයවුම් පිළිබඳ සේවස්ථ පුහුණු පාඨමාලාව 1986 වර්ෂය තුළදීද ක්‍රියාත්මක විය.

## දත්ත සැකසුම

1986 වර්ෂය තුළදී දත්ත සැකසුම් දෙපාර්තමේන්තුව විසින් බාරගෙන ඇති ප්‍රධාන කාර්යයන් වූයේ, ස්වයංක්‍රිය නිෂ්කාශන ආයතන ව්‍යාපෘතිය සපිරි ග්‍රාමීය ණය ක්‍රමය සහ 1986/87 පාරිභෝගික මුදල් හා සමාජ ආර්ථික සමීක්ෂණයයි. මේ පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

### 1. ස්වයංක්‍රිය චෙක්පත් නිෂ්කාශන ක්‍රමය

දැනට කොළඹ පවතින චෙක්පත් නිෂ්කාශන ක්‍රමය වෙනුවට ස්වයංක්‍රිය චෙක්පත් නිශ්කාෂන ක්‍රමය ඇති කරනු ඇත. මහ බැංකු නිෂ්කාශනාගාරයට සහභාගි වන බැංකු ස්වයංක්‍රිය නිෂ්කා-ශනාගාරයටද සහභාගි වනු ඇත. බැංකුවල නියෝජිතයන් විසින් (මේසය වටා වාඩිවී) චෙක්පත් ගොණු අතින් හුවමාරු කර ගැනීම වෙනුවට, නොතේරූ ලියවිලි කවුන්ටරයේදී බාරගෙන යන්ත්‍රානුසාරයෙන් කියවා තෝරා වෙන් කරනු ඇත. එබැවින් මෙම වෙනස් කිරීම් ක්‍රියාවලියේ පළමු පියවර විය යුත්තේ, චෙක්පත යන්ත්‍රයෙන් කියවිය හැකි ආකාරයට සකස් කිරීමය.

1986 වර්ෂය තුළදී, මහ බැංකුවද ඇතුළු බැංකු බොහොමයක්ම **MICR** මගින් සකස් කළ, සිය චෙක්පත් පිරික්සා බැලූ අතර, 1987 මුල් භාගය තුළදී මෙම චෙක්පත් සංසරණයට එනු ඇතැයි අපේක්ෂා කෙරේ.

1986 වර්ෂය තුළදී, මෙම ක්‍රමයේ ශිල්පීය විස්තරාකෘති පිළිබඳ කටයුතු නිමකර ඇති අතර, ටෙන්ඩර කැඳවා, පිරික්සා බලා ටෙන්ඩර බාරදී ඇත. 1987 වර්ෂය තුළදී මෙම වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරනු ඇත.

**2. ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව–සපිරි ග්‍රාමීය ණය ක්‍රමය**

ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුවේ සපිරි ග්‍රාමීය ණය ක්‍රමය පිළිබඳ සංඛ්‍යා තොරතුරු එකී දෙපාර්තමේන්තුවට සැපයීමේ ක්‍රමයක්ද දත්ත සැකසුම් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී.

මෙම වර්ෂයේ මහ කන්නය සඳහා ඉහත සඳහන් ණය ක්‍රමය යටතේ දෙන ලද ණය පිළිබඳ සංඛ්‍යා තොරතුරු මින් සැපයෙනු ඇත. දත්ත ලැබුන විට සැකසුම් කටයුතු ඇරඹෙනු ඇත.

**3. පාරිභෝගික මුදල් හා සමාජ ආර්ථික සමීක්ෂණය 1986/87**

මෙම සමීක්ෂණය යටතේ රැස් කරන ලද දත්ත සකස් කිරීම සඳහා වැඩසටහන් පිළියෙල කිරීම දත්ත සැකසුම් දෙපාර්තමේන්තුව විසින් අරඹා ඇත. සැකසුම් කටයුතු 1987 වසරේදී සිදු කරනු ඇත.

වර්ෂය තුළදී නැවත සැළසුම් කළ හෝ නිම කළ වැඩසටහන් පහත දැක්වේ.

1. විනිමය පාලන දෙපාර්තමේන්තුවේ පසු විපරම් ශාඛාව සඳහා 1986 ජනවාරි මාසයේදී කටයුතු නිම කොට ක්‍රියාත්මක කරන ලද ‘ අපනයන මෙහෙයවුම් ක්‍රමය ’.

2. බැංකු කටයුතු දෙපාර්තමේන්තුවේ මිනිස් ශ්‍රමයෙන් කරන ලද දෛනික සටහන් තැබීමේ ක්‍රමය වෙනුවට, 1986 සැප්තැම්බර් මාසයේ අරඹන ලද පොදු ලෙජර ක්‍රමය.

3. සේ. අ. අ. පාස් පොත් ක්‍රමය සකස් කිරීමේ කටයුතු නිම කරන ලද අතර, පාස් පොත් යාවත්කාලීන කිරීමේ විශේෂ අංශයක් 1986 නොවැම්බර් මාසයේ දී පිහිටුවන ලදී.

4. බැංකු කටයුතු දෙපාර්තමේන්තුවේ මැදි හා දිගු කාලීන ප්‍රතිමූල්‍යාපන ක්‍රමය මෙහෙයවීම සඳහා මැදි හා දිගුකාලීන ප්‍රතිමූල්‍ය වැඩසටහන නැවත සැළසුම් කොට සකස් කරන ලදී. කේවල ණය ගිණුම්වල සටහන් යාවත්කාලීන කිරීමේ සහ එම ගිණුම් පිළිබඳව විමසුම් කිරීමේ පහසුකම් ද ඊට ඇතුළත් විය.

5. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ වෙළෙඳ අංශයේ වෙළෙඳ දර්ශක සඳහා ක්‍රමයක් සකස් කිරීම.

## කළමණාකාරිත්ව විගණන

මහ බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය සිය කාර්ය සටහනට අනුකූලව, 1986 වර්ෂය තුළදී මාතලේ, මාතර සහ අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාල ඇතුළු බැංකුවේ විවිධ දෙපාර්තමේන්තුවල ගිණුම් විගණන කටයුතුවල නිරත විය.

කළමණාකාරිත්ව සේවා අංශය විසින් බැංකුවේ අතිරේක කම්කරු අවශ්‍යතාවයන් පිළිබඳව අධ්‍යයනයක් කරන ලදී. බැංකුව විසින් දැනට භාවිතා කරනු ලබන විගණන අත්පොත ප්‍රතිශෝධනය කිරීමද මෙම අංශය විසින් ආරම්භ කොට ඇත. තවද, බැංකුවේ මිනිස් බල අවශ්‍යතා පිළිබඳව දැනට කරගෙන යනු ලබන අධ්‍යයනයෙහි කොටසක් වශයෙන් බැංකුවේ කළමණාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුවේ මිනිස් බල අවශ්‍යතා පිළිබඳව අධ්‍යයනයක් අරඹා ඇත.

# කාර්ය මණ්ඩල පුවත්

1986 වර්ෂය තුළ දී අධිපති ඩබ්ලිව්. රාසපුත්‍ර මහතා පහත සඳහන් සම්මේලන හා රැස්වීම්වලට සහභාගි විය :—

(1) පිලිපීනයේ බගුඕ නගරයේ පැවැති දකුණු ආසියාතික මහ බැංකු (සියැසන්) අධිපතිවරුන්ගේ 21 වැනි සම්මේලනය.

(2) ආර්ජන්ටිනාවේ බුවනෝස් අයර්ස් හි පැවැති 24 කණ්ඩායමේ විශේෂ අමාත්‍ය රැස්වීම හා ඉන්පසුව, අමාත්‍ය නියෝජිත පිරිසේ සාමාජිකයකු ලෙස චිලි සහ වැනිසියුලාවේ පැවැති රැස්වීම.

(3) ඇමෙරිකානු එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී. සී. හි පැවැති 24 කණ්ඩායමේ නියෝජ්‍යයන්ගේ 46 වැනි රැස්වීම හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අතුරු කමිටුවේ රැස්වීම.

(4) බංග්ලා දේශයේ ඩාකා නුවර පැවැති ආසියානු නිෂ්කාශන සංගමයේ රැස්වීම.

(5) එංගලන්තයේ, ලන්ඩන් නුවර පැවැති පොදු රාජ්‍ය මණ්ඩලීය මහ බැංකු අධිපතිවරුන්ගේ සම්මේලනය.

(6) ඇමෙරිකානු එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී. සී. හි පැවැති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ වාර්ෂික රැස්වීම් හා 24 කණ්ඩායමේ රැස්වීම්.

(7) බංග්ලා දේශයේ ඩාකා නුවර පැවැති දකුණු ආසියාව, නවසීලන්තය හා ඕස්ට්‍රේලියා (සියැන්සා) අධිපතිවරුන්ගේ 16 වැනි සම්මන්ත්‍රණය.

භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ජී. කුමාරණතුංග මහතා මුදල් හා ක්‍රම සම්පාදන ලේකම්ගේ විකල්ප ධුරධාරියා ලෙස මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් නොමැති අවස්ථාවල මුදල් මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගි විය.

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් නොමැති අවස්ථාවල මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ වැඩබලන ලේකම් වශයෙන් බී. මහාදේව මහතා මුදල් මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගි විය.

අධිපති ශ්‍රී ලංකාවේ නොසිටි අවස්ථාවල දී බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා හා මුදල් මණ්ඩලයේ සභාපතිවරයා ලෙස ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ඩී. එල්. කන්නන්ගර මහතා වැඩ බැලී ය.

**පත්වීම්**

රාජ්‍ය ණය අධිකාරී වී. එන්. ඩී. නානායක්කාර මහතා 1986 අප්‍රේල් 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ව්‍යාපෘති උපදේශක වශයෙන් පත් කරන ලදී.

නියෝජ්‍ය ප්‍රධාන ගණකාධිකාරී එස්. රත්නප්‍රගාසම් මහතා 1986 අප්‍රේල් 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන අතිරේක කළමනාකාරිත්ව විගණන අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

නියෝජ්‍ය ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ ටී. එස්. එන්. ප්‍රනාන්දු මහතා 1986 අප්‍රේල් 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන රාජ්‍ය ණය අධිකාරී වශයෙන් පත් කරන ලදී.

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු මෙහෙයවුම් ඒකකයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වයි. ඒ. පියතිස්ස මහතා 1986 නොවැම්බර් 11 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන අතිරේක බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

බැංකු සංවර්ධන සහ පුහුණු උපදේශක කාර්යාලය 1986 දෙසැම්බර් 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි දෙපාර්තමේන්තු දෙකක් වශයෙන් ප්‍රතිශෝධනය කිරීමෙන් අනතුරුව, බැංකු සංවර්ධන සහ පුහුණු උපදේශක ආචාර්ය ඩබ්ලිව්. හෙට්ටිආරච්චි බැංකු සංවර්ධන අධ්‍යක්ෂ සහ පුහුණු කටයුතු අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී. 1986 දෙසැම්බර් 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහු අතිරේක ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන්ද පත් කරන ලදී.

**මුද හරිනු ලැබ සිටි නිලධාරීහු (1986 දෙසැම්බර් 31 වැනි දිනට)**

පහත නම් සඳහන් බැංකු නිලධාරීහු පහත දැක්වෙන අමාත්‍යාංශවලට, රජයේ දෙපාර්තමේන්තුවලට හා ශ්‍රී ලංකාවේ රාජ්‍ය සංස්ථාවලට සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තනතුරු සඳහා මුද හරිනු ලැබ සිටියහ.

විධායක අධ්‍යක්ෂ ඒ. එස්. ජයවර්ධන මහතා බංගලාදේශය, භූතානය, ඉන්දියාව හා ශ්‍රී ලංකාව යන රටවල විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

ආචාර්ය එස්. ටී. ජී. ප්‍රනාන්දු මහජන බැංකුවේ සභාපති වශයෙන් කටයුතු කරනු සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

එස්. ඊස්පරදසන් මහතා අතිරේක විදේශීය සම්පත් අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරනු සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

ආචාර්ය එල්. ඊ. එන්. ප්‍රනාන්දු ලංකා බැංකුවේ සභාපති වශයෙන් කටයුතු කරනු සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

ඒ. ඒ. ඩී. ජස්ටින් මහතා කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් කටයුතු කිරීම සඳහා කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය වෙත.

ආචාර්ය ඒ. සී. රන්දෙනි, ආචාර්ය ජී. අබේසේකර, එම්. බී. දිසානායක මහතා, ආචාර්ය එස්. එස්. කොළඹගේ, ඊ. ඒ. පී. එන්. ඩයස් මහතා, ජේ. එම්. ටී. බී. ජයසුන්දර මහතා, ජී. ඒ. වී. පොන්සේකා මහතා, ආචාර්ය අයි. කුමාරස්වාමි, ටී. එම්. ඉසැඩ්. මුතාලිප් මහතා සහ වයි. එම්. ඉන්ද්‍රරත්න මහත්මිය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

ආචාර්ය ඩී. එස්. විජේසිංහ පර්යේෂණ අර්ථ ශාස්ත්‍රඥ වශයෙන් සේවය කිරීම සඳහා මැලේසියාවේ සියැසන් පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය වෙත.

එන්. ඒ. ද එස්. අතුරලිය මහතා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත.

**ඉල්ලා අස්වීම්**

iv වැනි ශ්‍රේණියේ මාණ්ඩලික නිලධාරී එස්. රාජලිංගම් මහතා 1986 ඔක්තෝබර් 5 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් ඉල්ලා අස්විය.